# මාසික මහ සභා රැස්වීම - 2022/10/11 දින

## අලව්ව ප්‍රාදේශීය සභාව

2022/10/11වන දින පෙ.ව 09.30 ට පමණ අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන්නට යෙදුන අලව්ව ප්‍රාදේශීය සභාවේ VI වන සැසිවාරයේ 55 වන මහ සභා රැස්වීම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවයි.

**<u>මෙදින සහභාගී වූ ගරු මන්ත්‍රීතුමන්ලා</u>**

1. ගරු සභාපතිනි - පද්මා වැත්තැව මැතිනිය
2. ගරු උප සභාපති - එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඒ කරුණාරත්න මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - එච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ජයතිලක මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - ආර්.ඒ ශ්‍රීයානි වසන්තා රත්නායක මැතිනිය
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - සී.ජී ශ්‍රියානි ජයලත් මැතිනිය
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී නන්දසිරි මැතිතුමා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා

**<u>මෙදින මහ සභාවට සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා</u>**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී ධනුෂ්ක වීරසිංහ මැතිතුමා

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අලව්ව ප්‍රාදේශීය සභාවේ VI වන සැසිවාරයේ 55 වන මහ සභා රැස්වීමට සපැමිණි අපේ සියලුම මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලාත්, මාධ්‍යවේදී සහෝදරයිනුත්, අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ප්‍රධාන කොටගත් එම නිළධාරීන් ඇතුළු සියලු දෙනාත් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.

## 01. 2022/09/13 දින මහ සභා වාර්තාව ස්ථිර කිරීම.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

2022.09.13 දින මහ සභා රැස්වීම් වාර්තාව ඔබතුමන්ලා වෙත ලබාදී තිබෙනවා. එම වාර්තාව ස්ථිර කිරීමට තීරණයක් ගන්නා මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, 2022.09.13 දින පැවති VI වන සැසිවාරයේ 54 වන මහ සභා රැස්වීම් වාර්තාව පහත සංශෝධන වලට යටත්ව ස්ථිර කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>මහ සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන</u>

i. සභා වාර්තාවේ 07 වන පිටුවේ අංක 03.4 - ආඩියාදෙණිය විද්‍යාලය පිහිටි ඉඩම පිළිබඳව උද්ගත වී ඇති ප්‍රශ්නය සම්බන්ධව යන ලිපිය යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්. ජයතිලක මැතිතුමාගේ ප්‍රකාශයට **"**පසුගිය යහපාලන අපේ රජය කාලයේ අපේ අධ්‍යාපන අමාත්‍යතුමාගේ සංකල්පය වුනේ ළඟම පාසල හොඳම පාසල බවට පත් කිරීමයි. එයට අනුගතව කටයුතු කල අපිට, අද ළඟම පාසල වැහෙන පාසල බවට පත්වීමට කටයුතු සිදු වෙනවා නම් එයට අපි සම්පූර්ණම විරුද්ධයි. මහජන නියෝජිත ආයතනයක් හැටියට අපිට මේ ගැන අවතීර්ණ වෙන්න හැකි ක්‍රමවේදය කුමක්ද යන්න සොයා බැලිය යුතුයි.**"** යන ප්‍රකාශය ද ඇතුලත් විය යුතුය.

## 02.<u>ගරු සභාපතිතුමිය විසින් කරනු ලබන විශේෂ නිවේදන - නැත</u>

## 03.<u>ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම් පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.</u>

### <u>03.1 මහරච්චිමුල්ල උප කාර්යාල භූමියේ ඇති පැරණි ගොඩනැගිල්ල ඉවත් කිරීම සම්බන්ධව</u>

මහරච්චිමුල්ල උප කාර්යාලයේ ගඩොලින් බැද ඇති එහෙත් කපරාරු කර නැති මීටර් 3.23 x 3.94 x2.85 ප්‍රමාණයේ දිරාපත් පැරණි ගොඩනැගිල්ල කාර්යාලීය අලංකරණයට හා භූමියට උචිත නොවන බැවින් මාර්ග කම්කරුවන් යොදා ගලවා ඉවත්කර ඉංජිනේරු ගඩොල් ගොනුකර භාර දීම හා අනෙකුත් අබලි ද්‍රව්‍ය ස්ථාන භාර නිලධාරී වෙත භාර දීම සුදුසු බව සඳහන් කරමින් අලව්ව ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරී එස්.එන්.බී.ඩබ්.එම්.ඩී.ජී. වඩිණමුණ මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ ගොඩනැගිල්ල ඉදිකර තිබෙන්නේ 1970 ගම් සභා කාලයේයි. කාර්මික නිලධාරී මහතුන් ස්ථාන පරික්ෂාවක් සිදු කරලයි මේ ගොඩනැගිල්ල ගලවලා ඉවත් කරන්න තීරණයක් ගෙන තිබෙන්නේ. ගොඩනැගිල්ල සතු භාවිතයට ගත හැකි සියළු දේ ස්ථාන භාර නිලධාරීට භාර දීමට යෝජනා කර තිබෙනවා. ගොඩනැගිල්ලක් අසාදු ලේඛනගත තත්වයට පත් වෙලා නම් ගොඩනැගිල්ල ඉවත්කිරීම පිළිබඳ තීරණයක් ගැනීමට මහජන නියෝජිතයන් ලෙස අපට ලොකු වගකීමක් තිබෙනවා. අනතුරු කොයි මොහොතේ සිදුවෙයිද කියලා අපිට කියන්න බෑ. ඒ නිසා මේ ඉවත්කිරීම සම්බන්ධව කවුරුත් අකමැති වෙන එකක් නෑ කියලා මම හිතනවා. ඒ නිසා ගරු සභාපතිතුමිය විසින් ඉදිරිපත්කළ කාර්මික නිලධාරී වාර්තාවට අනුව දැනට භාවිතයට නොගන්නා මෙම අබලන් පැරණි ගොඩනැගිල්ල ඉවත් කිරීම සුදුසු බවට ඉදිරිපත් කළ යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව මහරච්චිමුල්ල උප කාර්යාලයේ ගඩොලින් බැද ඇති එහෙත් කපරාරු කර නැති මීටර් 3.23 x 3.94 x2.85 ප්‍රමාණයේ වූ ගොඩනැගිල්ල මාර්ග කම්කරුවන් යොදා ගලවා ඉවත්කර ඉංජිනේරු ගඩොල් ගොනුකර භාර දීම හා අනෙකුත් අබලි ද්‍රව්‍ය ස්ථාන භාර නිලධාරී වෙත භාර දීම සුදුසු බවට ඒකමතිකව තීරණය විය.

**03.2 මාසික ආහාර සාම්පල් වැඩසටහන සම්බන්ධව**

අලව්ව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයට අයත් මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් ක්ෂේත්‍ර තුලින් ලබා ගන්නා ලද ආහාර සාම්පල් සඳහා 2022 වසරේ වෙන්කර ඇති මුදලින් 2022.09.29 දිනැති ලිපියට අනුව රු. 3633.00 ක් හා 2022.10.05 දිනැති ලිපියට අනුව රු. 4420.00 ක් වන මුදල් ප්‍රතිපූර්ණය කරගැනීමට අනුමැතිය ලබාදීම සම්බන්ධයෙන් තීරණයක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම මුදල් ප්‍රතිපූර්ණය කරගැනීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයට අයත් මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් ක්ෂේත්‍ර තුලින් ලබා ගන්නා ලද ආහාර සාම්පල් පරීක්ෂාව සඳහා 2022.09.29 දිනැති ලිපියට අනුව රු. 3633.00 ක් හා 2022.10.05 දිනැති ලිපියට අනුව රු. 4420.00 ක් වැයවූ වියදම් සඳහා 2022 වසරේ අයවැය ප්‍රතිපාදන තුලින් ආහාර සාම්පල් වෙන්කර ඇති ප්‍රතිපාදනවලින් රු. 8053.00 වන ඉහත මුදල් ප්‍රතිපූර්ණය කරගැනීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**03.3 LM 5623 අංක දරණ කම්පැක්ටර් රථය අළුත්වැඩියා කිරීම සම්බන්ධව**

ඉහත අංක දරණ කම්පැක්ටර් රථයේ තිරිංග පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා එහි නියෝජිත ආයතනය වන සතොස මෝටර්ස් ආයතනයෙන් ඇස්තමේන්තුවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටි අතර වාහනයේ තිරිංග පද්ධතිය ගැලවීමෙන් පසු අවශ්‍ය කොටස් මොනවාදැයි බලා ඇස්තමේන්තුවක් ලබා දිය හැකි බව එම ආයතනය පවසයි. දැනට රු. 1,170,857.81 ක දළ ඇස්තමේන්තුවක් ලබා දී ඇති අතර එම අළුත්වැඩියාව අත්‍යාවශ්‍ය කටයුත්තක් බැවින් එය නියෝජිත ආයතනය මගින් ඉටු කරගන්නේ ද නැතහොත් මිල ගණන් කැඳවා ලියාපදිංචි ආයතනයකින් සිදු කරගන්නේ ද යන්න පිළිබඳවත් මේ සම්බන්ධව යාන්ත්‍රික ඉංජිනේරු වාර්තාවක් ලබාගැනීමෙන්, පවතින මූල්‍යමය තත්වය මත මෙම අළුත්වැඩියා කටයුතු කෙසේ සිදු කරන්නේද යන්න පිළිබඳවත් තීරණයක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මහජන සේවයක් සපයන ආයතනයක් ලෙස අලව්ව බල ප්‍රදේශයේ කසල එකතුකරන මෙම වාහනයේ නඩත්තු කටයුතු සිදු කිරීම අත්‍යාවශ්‍යයි. එම නිසා ඒ නියෝජිත ආයතනයෙන් ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුවට අනුව හැකි ඉක්මනින් එම අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ වාහනය විතරක් නොවෙයි. අපේ තිබෙන සම්පත් සියල්ල අළුත්වැඩියා කර රැකගැනීම සභාවේ වගකීමක් වෙනවා. ඒ නිසා එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව LM 5623 අංක දරණ කම්පැක්ටර් රථයේ තිරිංග පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා නියෝජිත ආයතනයෙන් ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුවට අනුව හැකි ඉක්මනින් අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

## 03.4 LM 5623 අංක දරණ කම්පැක්ටර් රථය සේවා කිරීම සම්බන්ධව

ඉහත අංක දරණ කම්පැක්ටර් රථය සේවා කිරීමේදී ඩීසල් පිල්ටරයේ මඩ තිබූ බැවින් එය මාරුකිරීම නිසා රු. 15,525.00 ක මුදලක් (රජයේ බදු සහිතව) ඇස්තමේන්තුගත මුදලට වඩා වැඩි වී ඇත. ඒ අනුව රු. 107,374.35 ක් වූ බිල්පත ගෙවීම සඳහා අනුමැතිය ලබාදීම සම්බන්ධයෙන් තීරණයක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම බිල්පත ගෙවීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා. එමෙන්ම කවුරුන්ගේ හෝ අත්වැරැද්දක් නිසා මෙසේ සිදුවෙනවාද යන්න පිළිබඳවත් සොයා බලා එසේ නොවන ලෙසට වගබලා ගැනීමටත් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ඒ අනුව ඉහත අංක දරණ කම්පැක්ටර් රථය සේවා කිරීමට අදාල රු. 107,374.35 ක් වූ බිල්පත ගෙවීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

## 03.5 අලව්ව ප්‍රාදේශීය සභාවේ අංක ZA – 5298 දරණ මෝටර් ග්‍රේඩරය සඳහා අවශ්‍ය 100 Ah බැටරියක් මිලදී ගැනීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ අංක ZA – 5298 දරණ මෝටර් ග්‍රේඩරය සඳහා අවශ්‍ය 100 Ah බැටරියක් මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් නො. 225, කුරුණෑගල පාර, උයන්වත්ත, නාරම්මල ලිපිනයේ ක්‍රියාත්මක බටේපොල ටයර් හවුස් ආයතනය අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අතර ඒ පිළිබඳ තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

| අනු අංකය | භාණ්ඩ, ද්‍රව්‍යභාසේවාවිස්තරය | ඉදිරිපත් කර ඇති මිල ගණන් | | | |
|---|---|---|---|---|---|
| | | බී.එම්.ජේ.එන්ටර්ප්‍රයිසස්, නො.201/ඒ, කොළඹ පාර, වදුරාගල, කුරුණෑගල. | **ජයමිණි ටයර් සර්විස්, මීගමු පාර, මැටියගනේ, නාරම්මල.** | **බටේපොල ටයර් හවුස්, නො.225, කුරුණෑගල පාර, උයන්වත්ත, නාරම්මල** | **අමිල අබේනායක කම්පණි (ප්‍රයිවට්) ලිමිටඩ්, නො.258, මීගමු පාර, කුරුණෑගල** |
| 01 | 100 Ah බැටරි (ඇම්පියර් 100 බැටරි) | **රු.62,387.50 Brand – EXIDE Warrenty – 18 Months** | **රු.62,300.00 Brand – EXIDE Warrenty – 18 Months** | **රු.61,500.00 Brand – EXIDE Warrenty – 18 Months** | **Stock Not Available** |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති බටේපොල ආයතනයෙන් මිලදී ගැනීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ අංක ZA – 5298 දරණ මෝටර් ග්‍රේඩරය සඳහා අවශ්‍ය 100 Ah බැටරියක් මිලදී ගැනීම සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නො.225, කුරුණෑගල පාර, උයන්වත්ත, නාරම්මල ලිපිනයේ ක්‍රියාත්මක බටේපොල ටයර් හවුස් ආයතනය මගින් මිලදී ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>03.6 අවම අනු බෙදුම් සීමාවට වඩා අඩු ඉඩම් සඳහා අනුමැතිය ලබා ගැනීම</u>**
අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 121 බෝවල ග්‍රාම නිලධාරී වසමෙහි බෝවල ගමේ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අංක KU/ALW/2017/147 දරණ අනුරේඛනය මගින් නිරූපිත පහත කැබලි අංක සහිත ඉඩම් කොටස්වල ප්‍රමාණයන් හා අනවසරකරුවන් පහත පරිදි වන බවත් මෙම පුද්ගලයින් වසර 50 කට අධික කාලයක් පහත ඉඩම් කොටස්වල පදිංචි අතර බලපත්‍ර ලබා දීම මගින් දීර්ඝ කාලයක සිට පවතින ගැටළු රාශියක් නිරවුල් වන බැවින් අවම බෙදුම් සීමාව පර්චස් 15 ට අඩු පහත ඉඩම් ප්‍රමාණ සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලීමක් කරමින් අලව්ව ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය.

| අනු අංකය | කැබලි අංකය | ප්‍රමාණය | නම |
|---|---|---|---|
| 01 | B | පර්චස් 10.42 | පතිරන්නැහැලාගේ සෝමපාල |
| 02 | G | පර්චස් 6.39 | පතිරන්නැහැලාගේ සෝමපාල |
| 03 | J | පර්චස් 8.60 | රාමනායකගේ රත්නසිරි |
| 04 | W | පර්චස් 9.06 | කුරුවිට ආරච්චිලාගේ දෝන කරුණාවතී |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ කරුණාරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මේ ගැන මටත් පොඩි අවබෝධයක් තිබෙනවා. පතිරන්නැහැලාගේ සෝමපාල කියන මේ දෙන්නාම එක් පුද්ගලයෙක්. බෝවල වැව ඉස්මත්ත තමයි ඉන්නේ. දෝන කරුණාවතී කියන පුද්ගලයා අනවසර තැනකයි පදිංචි වී සිටින්නේ. මේ රජය යටතේ අපි නිවාසයක් එතුමියට ලබා දීලා තිබෙනවා. මේ නිවස ලබා දීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විරෝධතාවයක් දැක්වූයේ නෑ. රාමනායකගේ රත්නසිරි කියන පුද්ගලයා මෑතකදීයි පදිංචියට ආවේ. ඔහු පදිංචි වී සිටින්නේ ප්‍රධාන මාර්ගයට ආසන්නවමයි. මේ අයට මේ අවස්ථාව ලබා දීම පිළිබඳ මගේ විරෝධයක් නෑ. මේ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව ඉදිරියට කටයුතු කිරීම සුදුසුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මේ සියළු දෙනාටම ජීවත් වීමේ පරම අයිතිය තිබෙනවා. එවකට හිටපු ප්‍රාදේශීය ලේකම්තුමා සමඟ මැදිහත් වෙලා ඉතා ඉක්මනින් තීන්දුවක් කියපු එකට තීන්දුව ආවේ 2022 වසරේදී. මේ සභාවේ කරුණාරත්න මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව මම ස්ථිර කරනවා. ඒ වගේම ඔබතුමිය ප්‍රාදේශීය ලේකම්තුමියට යවන ලිපියෙම සඳහන් කරලා යවන්න අනිත් ඉඩම් කට්ටි සම්බන්ධව ගත් ක්‍රියාමාර්ගය සම්බන්ධව විමසලා ඔවුන්ටත් මේ සමඟම ඔප්පු ලබා දෙන්න ක්‍රමවේදයක් හදනවා නම් අපිට සතුටට පත් වීමේ හැකියාව තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ ඔප්පු ලබා දීම සම්බන්ධවයි අපේ අනුමැතිය ඉල්ලන්නේ. මාර්ග සම්බන්ධව යම් අර්බුදකාරී තත්වයක් මතුවෙනවා නම් ඒ පිළිබඳව අපි මේකෙ අනුමැතිය දීලා යවලා පසුව මෙහි ගැටළු කතා කරන්න බෑ. මේක සම්මත කරලා යවනකොට තමයි මේ මන්ත්‍රීවරුන් එක්ක සාකච්ඡා කරලා අදාල නිර්දේශ හා කොන්දේසිත් එක්කම මේ ලිපිය යවන්න. මේ මැනුම සම්බන්ධව ප්‍රදේශයේ මන්ත්‍රීතුමා සාකච්ඡා කල යුතුයි. පාරට අවශ්‍ය ප්‍රමාණය වෙන්වෙලා තිබෙනවද කියලා බලන්න ඕනෑ. ඒ ගැන හොයලා බලන්නැතුව මේකට අපි අනුමැතිය දීලා පස්සේ ඒ ගැන කතා කලාට වැඩක් නෑ. ඒ නිසා ප්‍රදේශයේ මන්ත්‍රීතුමා හැටියට ඔබතුමා මේ ඔප්පු හදන්න පෙර නැවත සැරයක් සමීක්ෂණයක් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ රාමනායක කියන පුද්ගලයා ව්‍යාපාරිකයෙක්. එතුමා මේ මෑතකදී තමයි ඒ ඉඩම අරන් තිබෙන්නේ. ඔහුගේ ඉඩම පර්චස් 8.60 ක් තිබෙනවාද යන්න පිළිබඳව ගැටළුවක් තිබෙනවා. ඔහුගේ ඉඩමේ බැම්ම හදලා තිබෙන්නේත් පාරට යාබදවමයි. ඒ නිසා කවදාවත් පාර විශාල කරන්න ලැබෙන්නේ නෑ. මෙය නීත්‍යානුකූලව පැවරීමක් කරනවා නම් ඇත්ත වශයෙන්ම අපි අවුරුදු ගානක් ඉදිරියට බලලයි තීන්දු තීරණ ගත යුත්තේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම ස්ථානයේ තවත් ඉඩම් කට්ටි කීපයක් තිබෙනවා. ඒ ටිකේ මැනුම් කටයුතු නොකර මේ ඉඩම් 4 විතරයි මැනුම් කටයුතු කරලා තිබෙන්නේ. ඒ නිසා මේ පිළිබඳ නියාමනයක් සිදුකරලා මේ කටයුත්තට යන්න.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

2022.09.30 දින තමයි අපිට මේ ලිපිය ලැබිලා තිබෙන්නේ. කඩිනමින් අනුමැතිය ලබා දෙන්න කියලා තිබෙනවා. ඒ නිසයි මහා සභාවට ලිපිය යොමු කලේ. මෙය කර්මාන්ත කමිටුවට යොමු කරලා එහිදී සාකච්ඡා කරලා තීන්දුවක් ලබා ගැනීමෙන් පසු මහා සභා අනුමැතිය ලබා දීම සුදුසුයි.

ඒ අනුව කාර්මික නිලධාරී යොමුකර ස්ථාන පරීක්ෂාවක් සිදුකර ඉදිරි කර්මාන්ත කමිටුවේදී තීරණයක් ලබාගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>03.7 විහාරස්ථානයේ අළුත්වැඩියාවන්ට අමානෝ සීට් හෝ ඇස්බැස්ටෝස් සීට් ලබා ගැනීම සඳහා</u>**

ඉඹුල්ගොඩ විහාරස්ථ දායක සභාව විසින් විහාරාධිපති අති පූජ්‍ය දඹදෙණියේ ආනන්ද නාහිමිපාණන් වහන්සේගේ 75 වන ජන්ම දිනය නිමිත්තෙන් මහා සංඝරත්නය 75 නමක් වැඩමවා සාංඝික මහා දානමය පිංකමක් නොවැම්බර් මස 23 වන දිනට යොදාගෙන ඇති බවත් ඒ සඳහා අඩුපාඩුව තිබෙන විහාරාංග අළුත්වැඩියා කිරීමට ඇති බවත් එබැවින් පිළිසකර කිරීමට තිබෙන දේවාල මන්දිරයේ වහලය සඳහා අවශ්‍යව තිබෙන අමානෝ සීට් හෝ ඇස්බැස්ටෝස් සීට් ලබා දෙන ලෙස ඉල්ලීමක් කරමින් ඉඹුල්ගොඩ, අලව්ව ශ්‍රී බෝධිරුක්ඛාරාමය විහාරස්ථානයේ පහළ දොලොස්පත්තුවේ උප ප්‍රධාන සංඝනායක විහාරත්‍රයාධිපති පූජ්‍ය දඹදෙණියේ ආනන්දනායක ස්ථවිර විසින් ඉදිරිපත් කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,මෙම ඉල්ලීම ඉටු කර දීම සුදුසු යැයි මම යෝජනා කරනවා. ඒ වගේම පසුගිය දින ඉඹුල්ගොඩ විහාරස්ථානයේ පැවති ආයුර්වේද වෛද්‍ය සායනයේදී ගරු සභාපතිතුමිය එම ස්ථානයට පැමිණි අවස්ථාවේ නායක ස්වාමීන් වහන්සේ විසින් ඉල්ලීමක් කලා දේවාලයේ වහලය ඉදිකර ගැනීමට සහයෝගය ලබා දෙන්න කියලා. අපේ මන්ත්‍රීතුමන්ලා කවුරුත් මේ සඳහා විරුද්ධ වෙන එකක් නෑ කියලා මම සිතනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, තමන්ට ලැබුනු කාල පරාසය තුල තමන්ට ලැබුණු රුපියල පවා නිසියාකාරයව වියදම් කරන ස්වාමීන් වහන්සේ නමක් ලෙස උන්වහන්සේ සිදුකල මේ ඉල්ලීම ඉටු කරදීම සුදුසුයි. එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ ස්වාමීන් වහන්සේ දඹදෙණිය ප්‍රදේශයේ සිටින ඉතාමත් සිල්වත් ගරු කල යුතු ස්වාමීන්වහන්සේ නමක්. උන්වහන්සේ මෙම විහාරස්ථානය දියුණු කරන්න ඉතාම කැපවීමෙන් කටයුතුකරනවා. සියළු දෙනා දන්න ස්වාමීන් වහන්සේ නමක් ලෙස උන්වහන්සේ කල ඉල්ලීම ඉටු කරදීම අපේ වගකීමක් හැටියටයි අපි දකින්නේ.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,මේ විහාරස්ථානය බුද්ධශාසනය රකින විහාරස්ථානයක්. උන්වහන්සේ අලව්ව ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සභාපති ධූරය හොබවනවා. ඒ වගේම සිල්වන්ත ස්වාමීන් වහන්සේ නමක්. අපි සභාවක් ලෙස මෙන්ම බෞද්ධයන් ලෙස මෙවැනි අවස්ථාවල දිය හැකි සහයෝගයක් ඇත්නම් එය ලබා දිය යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙය මගේ කොට්ඨාශයේ තිබෙන විහාරස්ථානයක්. සභාවක් ලෙස උන්වහන්සේගේ මෙම ඉල්ලීම ඉටුකර දෙන මෙන් මම ද මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපේ නායක ස්වාමීන්වහන්සේලා අතර බුද්ධාලම්භන ප්‍රීතියක් ඇතිවන නායක ස්වාමීන් වහන්සේ නමක් තමයි ඉඹුල්ගොඩ විහාරාධිපති ස්වාමීන්වහන්සේ. ගමේ දායකයන් සමඟ සහසම්බන්ධ වෙලා විහාරස්ථානය දියුනු කරන්න මෙන්ම අනෙකුත් පොදු වැඩවලට සහයෝගය ලබා දෙන්න පුළුවන් ගුණයක් උන්වහන්සේ ළඟ තිබුනා. ඒ වගේම ඉඹුල්ගොඩ - තුඹුල්ල යා කරන මාර්ගය 1 ½ km ක් පමණ පිටුපසට වෙන්නට පුළුල් කරලා හදනවා. උන්වහන්සේ සතියකට දෙවරක් ජනතාව විහාරස්ථානයට කැඳවලා මේ මාර්ගය පිළිබඳව තොරතුරු අසා දැනගන්නවා. ඒ උන්වහන්සේගේ මැදිහත්වීමේ ප්‍රතිඵලයක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපේ ප්‍රාදේශීය සභාව කියන්නේ වැඩි වශයෙන් විහාරස්ථාන සඳහා උදව් කරන ආයතනයක්. ඒ වගේම මගේ ඉල්ලීමට අනුව දිවුල්ගහකොටුව තරුණ බෞද්ධ මධ්‍යස්ථානයට ජලය, විදුලි පහන් ආදිය ඉල්ලීම් කිරීමෙන් පසු සභාපතිතුමිය ඒ දේවල් නොපැකිලිව ලබා දුන්නා. එමෙන්ම ඉඹුල්ගොඩ විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේ මේ ප්‍රදේශයට ඉමහත් සේවාවක් සපයනවා. ඒ නිසා උන්වහන්සේගේ ඉල්ලීම ඉටු කරදීම සුදුසුයි.

ඒ අනුව ඉඹුල්ගොඩ විහාරස්ථානයේ දේවාල මන්දිරයේ වහලය සඳහා අවශ්‍යව තිබෙන අමානෝ සීට් හෝ ඇස්බැස්ටෝස් සීට් ලබාදීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**04.** <u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත</u>

## 05. යථා පරිදි කල් දී ඇති යෝජනා

**(05-1)ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/55 - 01 දරණ යෝජනාව**

පහත නම් සඳහන් අය දෛනික පදනම මත අප සභාවේ සේවය කරන අතර ඔවුන්ගේ ගිවිසුම් කාලය 2022 දෙසැම්බර් මස අවසන් වන බැවින් ඔවුන්ගේ සේවා කාලය දීර්ඝ කර ගැනීමට මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

| නම | තනතුර | අවසන් දිනය |
|---|---|---|
| 1. පී.එස්. ලක්මාල් පතිරණ | ආදේශක රියදුරු | 2022.12.11 |
| 2. ඩී.ඒ.බී.පී. දිසානායක | ආදේශක රියදුරු | 2022.12.12 |
| 3. එච්.පී.ඩී. කුලවංශ | ආදේශක සෞඛ්‍ය කම්කරු | 2022.12.20 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ඉහත නම් සඳහන් අයගේ සේවා කාලය ගිවිසුම් කාලය අවසන් වන දින සිට තවත් මාස 06 කින් දීර්ඝ කර කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-2)ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/55 - 02 දරණ යෝජනාව**

අලව්ව ප්‍රාදේශීය සභාවේ සේවය කරන පහත නම් සඳහන් නිලධාරීන් සඳහා 2022 වර්ෂයට අදාල නිල ඇඳුම් දීමනාව ලබා දීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

| නම | තනතුර |
|---|---|
| 1. එස්.එන්.බී.ඩබ්.එම්.ඩී.ජී. වඩිණමුණ | තාක්ෂණ නිලධාරී |
| 2. ඩබ්.ඒ. අමරසිරි | තාක්ෂණ නිලධාරී |
| 3. ආර්. නාමල් ශෂිකාන්ත | තාක්ෂණ නිලධාරී |
| 4. ඩබ්.ඒ. වසන්ත චන්ද්‍රසිරි | වැඩ පරිපාලක |
| 5. කේ.පී.ඩී. ජයන්ත එදිරිසිංහ | වෙළඳසැල් පරිපාලක |
| 6. ටී.එම්.ඩී.එන්. තෙන්නකෝන් | ආදායම් පරීක්ෂක |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ සේවය කරන ඉහත නම් සඳහන් නිලධාරීන් සඳහා 2022 වර්ෂයට අදාල නිල ඇඳුම් දීමනාව ලබා දීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-3)ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/55 - 03 දරණ යෝජනාව**

2020/10/28 දින ප්‍රසිද්ධියට පත් කරන ලද ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති ප්‍රකාරව සකස් කර 2022.09.29 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ නිර්දේශය ලැබූ 2023 වර්ෂය සඳහා සකස් කරන ලද රු.179,487,386.00 ක ආදායමක් හා රු.179,487.000.00 ක වියදමකින් සකස් කරන ලද කෙටුම්පත් අයවැය ලේඛනය සම්මත කර ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**
2023 වර්ෂය සඳහා ඉදිරිපත් කරන අයවැයට අදාළ මාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීමට මා අවස්ථාව ලබාගන්නවා .

2021/11/03 වන දින අලව්ව ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරයට පත් මා හට විශාල අභියෝග රැසකට මුහුණ දීමට සිදුවුවද ඒ සියළු අභියෝග වලට මුහුණ දෙමින් මගේ බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් 2023 වර්ෂයේදී උපරිම සේවයක් කිරීමට හැකියාව ලැබේවි යන බලාපොරොත්තුවෙන් 2023 වර්ෂය සඳහා වූ කෙටුම්පත් අයවැය ඔබතුමන්ලා වෙත ඉදිරිපත් කර ඇත.මුලු මහත් ශ්‍රී ලංකාවම ඉතාමත් දුෂ්කර වූ කාලපරිච්ඡේදයක් ගත කලපසුගිය වසර තුලදී අප අපේක්ෂා කල බොහෝ කාර්යන් ඉටුකර ගැනීමට නොහැකි විය. ලොව පුරා ව්‍යාප්තව ගිය කොරෝනා රෝග ව්‍යාප්තියත් සමග අප වැනි කුඩා සංවර්ධනය වෙමින් පවතින රටවලට මුහුන පෑමට සිදුවූ ආර්ථික බලපෑමත් සමග රටේ ආදායම් මාර්ග කඩා වැටීමත් සමග පෙර කවරදාවත් නොවූ තරමින් රාජ්‍ය වියදම් කලමනාකරණය කරමින් අත්‍යවශ්‍යම වූ කාර්යන් පමණක් ඉටුකරමින් කටයුතු කිරීමට අප සියළු දෙනාටම සිදුවිය. ඒ අනුව 2022 වර්ෂයේ අයවැයෙන් අපේක්ෂිත ආදායම් නියමිත පරිදි උපයාගැනීමට නොහැකිවූවා පමණක් නොව විවිධ සීමා කිරීම් මත 2022 අයවැයෙන් අපේක්ෂිත සේවාවන් රාශියක් ඉටු කරගැනීමට නොහැකිවිය. ඒ අනුව 2023 වර්ෂය සඳහා වූ අයවැය තුළින් අප උපයාගැනීමට අපේක්ෂිත ආදායම තුළින් ලබාදීමට අපේක්ෂිත වූ සේවාවන් සියල්ල ඉටුකරගැනීමට හැකිවනු ඇති බවට මා විශ්වාස කරමි.

2020 ඔක්තෝම්බර් මස 28 වන දින වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමන් විසින් ප්‍රසිද්ධියට පත් කරන ලද ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය කිරීම හා බලාත්මක කිරීමේ රීති මාලාවේ සඳහන් නියමයන් අනුව 2023 වර්ෂයට අදාල අයවැය කෙටුම්පත සකස් කර ඇත. එම රීති මාලාවේ නියමයන්ට අනුව 2022/06/30 ට පෙර ඔබතුමන්ලාගේ යෝජනා ලබාගැනීම සිදුකළ අතර ගරු මන්ත්‍රීතුමන්ලා කිහිපදෙනෙක් පමණක් යෝජනා ලබාදී ඇත. යෝජනා ඉදිරිපත් නොකලද සියළු ගරු මහජන නියෝජිතයින් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කිරීමට කටයුතු කරන ලද අතර සකස් කිරීමට අදහස් කළ අයවැය සම්බන්ධයෙන් ගරු මහජන නියෝජිතයින්ගේ අදහස් ලබාගැනීමට 2022/09/23 දින සාකච්ඡාවක්ද පවත්වන ලදි. එමෙන්ම 2022/09/29 පැවති 2023 වර්ෂයේ යෝජිත වියදම් හා යෝජිත ආදායම් හා ලැබීම් ඇස්තමේන්තු ඇතුලත් කෙටුම්පත් කරනු ලැබූ අයවැය සඳහා මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාවේ නිර්දේශය ලැබිණි. එම කෙටුම්පත් අයවැය ලේඛනයට අදාල ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කරමි.

- ජනතාවට පීඩාවක් නොවන පරිදි එහෙත් සභාවේ මූල්‍යමය හැකියාව ශක්තිමත් වන අයුරින් සභාවේ ස්වයං උත්පාදන ආදායම මාර්ග වර්තමානයට ගැලපෙන අයුරින් සංශෝධනය කරමින් සභා ආදායම් නිසි ලෙස උපයාගැනීමට අපේක්ෂා කරමි.
- ගාස්තු ඉහල යාම් මත සභාවට ලැබිය යුතු ආදායම් ආධාර ප්‍රමාණයන් පෙරට වඩා වැඩි ප්‍රමාණයකින් ලැබේවියයි අපේක්ෂා කර ඇත.
- දැනට තාවකාලිකව නතර කර ඇති සංවර්ධන කටයුතු පෙර පරිදි ක්‍රියාත්මක කරමින් බල ප්‍රදේශයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට අපේක්ෂා කර ඇත.
- විදුලිය නිෂ්පාදනයට පිලියමක් ලෙස සභා ගොඩනැගිලි සඳහා සූර්ය පැනල පද්ධති සවිකරමින් ජනතාවට ආදර්ශයක් වෙමින් විදුලි අර්බුදයට සුළු හෝ දායකත්වයක් ලබාදීමට අපේක්ෂා කර ඇත.
- අලව්ව සතිපොල; අලව්ව නගරය සංවර්ධන කටයුතු විධිමත් කර ආකර්ශනීය හා සංවර්ධිත නගරයක් බවට අලව්ව නගරය පත්කිරීමට අපේක්ෂා කර ඇත.

- සභාව සතු වත්කම් වල අයිතිය නිරවුල් කරගනිමින් සහා දේපල ආරක්ෂිත කරගැනිමේ වැඩපිළිවල ශක්තිමත් කිරීමට අපේක්ෂා කර ඇත.
- අවිධිමත් වෙළඳාම් විධිමත් කරමින් හා නිසි පරිදි නියාමනය කරමින් කටයුතු කිරීමටත් උපකාර්යාල සේවාවන් ක්‍රමවත් කරමින් කාර්යාල සේවාවන් තවදුරටත් වඩාත් විධිමත්ව හා කාර්යක්ෂමව ඉටුකිරීමට අපේක්ෂා කරමි.
- බල ප්‍රදේශයේ ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන් සියළු මහජන නියෝජිතයන් ඒකරාශි කර ගනිමින් අනිකුත් රාජ්‍ය ආයතන සමග නිසි සම්බන්ධීකරණයකින් අලව්ව ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලය මෙහෙයවමින් උපරිම සේවාවක් 2023 වසරේදී ඉටුකිරීමට අපේක්ෂා කරමි.

ඒ අනුව 2020/10/28 දින ප්‍රසිද්ධියට පත් කරන ලද ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති ප්‍රකාරව සකස් කර 2022.09.29 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ නිර්දේශය ලැබූ 2023 වර්ෂය සඳහා සකස් කරන ලද රු.179,487,386.00 ක ආදායමක් හා රු.179,487.000.00 ක වියදමකින් සකස් කරන ලද කෙටුම්පත් අයවැය ලේඛනය සම්මත කර ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, ඔබතුමිය ගෙන ආ යෝජනාව සම්මත කිරීමට පෙර ඡන්ද විමසීමක් පවත්වනවා නම් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නාරද සිරිවර්ධන මැතිතුමා**
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
ගරු මන්ත්‍රීවරුනි ඒ සඳහා මා ඒ අවස්ථාව ලබා දෙන්නම්. ඊට පෙර මෙම නිවේදනය ඔබ වෙත දැනුම් දිය යුතුයි .

2020/10/28 වන දින වයඹ ගරු ආණ්ඩුකාරතුමන් විසින් අනුමත කර ඇති ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති මාලාවේ 11(1) වගන්තියට අනුව සභාව වෙත ඉදිරිපත් කරනු ලබන ඊළග වර්ෂයේ අයවැය ලේඛනයට සභාවේ යම් සභිකයෙකු විසින් සංශෝධන ඉදිරිපත් කරන්නේනම් මෙම අයවැය යෝජනාව න්‍යාය පත්‍රය සමග යැවීමෙන් පසු මෙම රැස්වීම පැවැත්වීමට දින 03 කට පෙර ඉදිරිපත් කළ යුතුය. එබඳු සංශෝධන කිසිවක් ලැබී නොමැති බව ඔබතුමන්ලා වෙත කාරුණිකව දන්වා සිටිමි.

2020/10/28 වන දින වයඹ ගරු ආණ්ඩුකාරතුමන් විසින් අනුමත කර ඇති ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති මාලාවේ 12(2) වගන්තියට අනුව අයවැය යෝජනාව සම්බන්ධයෙන් ඔබතුමන්ලා ඡන්ද විමසීමක් යෝජනා ස්ථිර කල නිසා ඒ සඳහා විවාදයට ඔබතුමන්ලාට අවස්ථාව ලබාදෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, 2023 වර්ෂය සඳහා ගෙන ආ අයවැය යෝජනාව ගැන කතා කිරීමට පෙර මම කතා කරනවා 2022 අයවැය අපට යථාර්ථයක් බවට පත් කරගැනීමට හැකි වුනාද යන්න. ඒ අයවැය වෙලාවේ ඔබතුමියට ඉතිහාසය මතක නම් ඇත්තටම ආණ්ඩු පක්ෂයේ සහයෝගයවත් ඔබතුමියට ලැබුනේ නෑ. ඔබතුමියට ඇත්තටම සහයෝගයක් දුන්නේ විපක්ෂයක් විදියට අපියි. ඒ සඳහා කාරණා රාශියක් තිබුනා. එකක් තමයි මේ ආයතනය සතු යම් රථවාහනයක් අවභාවිතා වෙනවා කියලා ජනතාව අපිට පැමිණිලි කලා. මේ වාහන යම් යම් අය පාවිච්චි කලා. මේවා වැලැක්විය යුතුයි. මේ කාරණා වලට ඔබතුමියට සහයෝගය ලබා දුන්නා. අන්තිමට අපේ ඇස් පනාපිටම අවභාවිතා කල වාහන භාවිතයටවත් ගන්න බැරි තැනට විනාශ වෙලා ගියා. එමෙන්ම අපි ඒ දුන්න ශක්තියත් ඒ එක්කම නැති වුනා. අනෙක් කාරණය තමයි සභාව ගෙනියනකොට

විපක්ෂයේ බහුතර කණ්ඩායම අපි. ඒ කියන්න ගිය සභාව සම්මත කිරීමේ පසුපෙල කණ්ඩායම අපි. මේ සභාව ගෙනියනවා නම්, සභාවේ සම්පත් පරිභෝජනය බෙදා හරිනවා නම් එතකොට ඒකට ශක්තිය දුන් පිරිස්වලට යම් ශක්තියක් දීමේ වගකීම ඔබතුමියට තිබුණා. ඒ වගකීමෙන් ඔබතුමියට මිදෙන්න බෑ. වගකීම් පැහැර හැරලා කටයුතු කල නිසා අපිට ඔබතුමිය ගැන විශ්වාසය බිඳ වැටිලා තිබෙන්නේ. මේ සභාවේ බහුතර මන්ත්‍රීවරුන්ගේ අත්සනින් යුතුව අපි සභාවට යෝජනාවක් ගෙනාවා. පසුගිය අරගලය වෙලාවේ ඔබතුමියගේ ක්‍රියාකලාපයට විරුද්ධව යෝජනාවක් දැම්මා. අඩුගානේ යෝජනාව සභාවට දාගන්නවත් අපිට හයියක් තිබුනේ නෑ. ඒ නිසා මම දකිනවා මේ සභාවේ 2023 අයවැයේ මොන ඉලක්කම් තිබුනත්, මොනෙ වැඩසටහන් ගෙනාවත් ඒ වැඩසටහන් යථාර්තයක් බවට පත්කර ගන්නවත් විශ්වාසයක් අපිට නෑ. ඒ නිසා ඔබතුමියගේ නායකත්වයෙන් ගන්න කිසිම වැඩපිළිවෙලක්, මේ ආණ්ඩුවත් එක්ක ආණ්ඩු පක්ෂයේ පොදුජන එක්සත් පෙරමුණ වෙන්න පුළුවන්, ඒ සමග එකතුවෙලා ඉන්න පක්ෂ වෙන්න පුළුවන්, ඒ කුමන පක්ෂවල නායකත්වයෙන් ආවත් අපි ඒකට සහයෝගයක් දක්වන්න ලෑස්ති නෑ. මොකද ඒක බිමේ යථාර්තයක් බවට ඔප්පු කරලා නෑ. පසුගිය වසර තුල දැකපු දේ මේ අයවැය ලක්ෂ 5යි, 2යි, 3යි කියලා ඕනෑම ඉලක්කමක් දාලා කතා කරන්න පුළුවන්. නමුත් ඒක යථාර්තයක් බවට පරිවර්තනය කරන්න පුළුවන් වුනා නම් අපිට මීට වඩා කතාකරන්න දේවල් තිබුනා. මොකද අපි මේ අයවැයට විරෝධය ප්‍රකාශ කරනවා. ඒත් එක්කම විපක්ෂයක් ලෙස ඉදිරියේදී අයවැයට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කිරීමටත් බලාපොරොත්තු වෙනවා. ඒත් එක්කම මම ආරාධනා කරනවා සැබෑ විපක්ෂයක් එක්ක ඕනෑම කෙනෙකුට එකතු වෙන්න පුළුවන්. මේ රටේ තිබුණු අදූරදර්ශී වැඩපිළිවෙලත් සමඟ මේ ප්‍රාදේශීය සභාවේ පසුගිය කාලයේ තිබුණ අදූරදර්ශී වැඩපිළිවෙලත් අපි පරාජයට පත් කල යුතුයි.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ සභා වාරයේ වැදගත්ම අවස්ථාව තමයි මේ අයවැය කෙටුම්පත ඉදිරිපත් කරන අවස්ථාව. මම නැගී හිටියේ ආණ්ඩු පක්ෂය වෙනුවෙන්. මට මතකයි ප්‍රාදේශීය සභා පනත් ක්‍රමය අනුව ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් සභිකයෙක් කියන එක වෙනස් වුනේ 1987 අංක 15 දරණ පනතෙන්. ප්‍රේමදාස මැතිතුමා තමයි මේ ක්‍රමය වෙනස් කලේ. එතුමා ප්‍රාදේශීය මට්ටමේ නායකයො හදලා ඒ අයට ගෞරවයක් ඇතිවෙන විධියට තමයි මන්ත්‍රීවරයෙක් කියන එක ප්‍රාදේශීය මන්ත්‍රීවරයෙක් කියලා වෙනස් කලේ. ඒ වන තෙක් සභිකයින් කියලා තමයි ගම් සභා කාලයේ තිබුනේ. අද ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් කියන ගෞරවය අරගෙන අපි සැසිවාර විදියට සභා වාර 06 ක් 07 ක් දැන් ඉවරයි. 2011.04.01 තමයි අලව්වට ප්‍රාදේශීය සභාව ස්ථාපනය වෙන්නේ. ඒකේ සභාපති වුනේ සන්ධ්‍යා කුමාර මැතිතුමා. එතුමා ඒ කාලේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරයෙක් ලෙස ඇවිල්ලයි පත් වුනේ. ටික කාලයක් ඉන්නකොට එතුමාගේ ක්‍රියාකලාපය, පක්ෂ විපක්ෂ අයගේ විරෝධය නිසා බණ්ඩාර වැත්තෑව මැතිතුමා සභාපති වුනා. ඊලඟට ඒ කාලේ ඉවර උනාම 2018.03.28 තමයි නැවත දෙවනි සැසිවාරය ලෙස මේ සභාව ආරම්භ වුනේ. ඒ සැසි වාරයේදී සන්ධ්‍යා සභාපතිතුමා තමයි සභාපතිවරයා ලෙස පත් වුනේ. ඔබට මතක ඇති සභාපති තෝරන්න ගිය අවස්ථාවේ කුරුණෑගල අපේ ජොන්ස්ටන් ඇමතිතුමාගේ කාර්යාලයේදී සභාපති ප්‍රශ්නයක් ආවා. ඒ වෙලාවේ සභාපති ධූරයට තුන් දෙනෙක් ඉල්ලීම් කලා. උප සභාපති වෙන්න මමත්, ප්‍රියන්ත මැතිතුමාත් ඉල්ලුවා. ඒවා අද හීනයක් බවට පත් වෙලා. ඒ පත්වෙන අවස්ථාවේදී එවැනි සුදුසුකම් සහිත සභාපති ලෙස අපේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සන්ධ්‍යා සභාපතිතුමා පත් වුනා. එහෙම නැතුව ඔබතුමිය එදා පත් වුනා නම් අපිට කිසි ගැටළුවක් වෙන්නේ නෑ. සන්ධ්‍යා සභාපතිතුමා 2021.07.11 දින කොරෝනා වසංගතයට ගොදුරු වෙලා මියගියා. ඉන්පසු වැඩ බලන සභාපති වුනේ මම. මම වැඩබලන්න භාරගත්තේ ජූලි 09 වෙනිදා. එහෙම වුන සභාවක සභාපති පත්වීමේ න්‍යාය පත්‍රයක් තිබෙනවා. එතකොට උප සභාපතිවරයෙක් කියලා නම් කරලා තිබෙනවා. උප සභාපතිවරයා ලෙස වාඩිවෙලා අද වෙනකම් ඉන්නවා. හිටපු සභාපතිවරු දෙන්නම උප සභාපතිට මොනවද ක්‍රියාත්මක කරන්න තිබෙන යෝජනා කියලා ඇහුවේ නෑ. විවිධ කමිටු නම් තිබෙනවා. දැන් උප සභාපතිට වාඩිවෙන්න පුටුවක්වත් නෑ. ඒක හරි ලැජ්ජයි. මට එහෙම අවශ්‍ය නෑ. නමුත් උප සභාපති කියන කෙනාට අවශ්‍යයි. බලන්න පොල්ගහවෙල, නාරම්මල ප්‍රාදේශීය සභා උප සභාපතිවරුන්ට අවශ්‍ය පහසුකම් ලබා දීලා ඒ සභා ක්‍රියාත්මක වෙමින් යනවා. ඔබතුමියටවත් ඒක ක්‍රියාත්මක කරන්න බැරිවෙලා තිබෙනවා. එතකොට ඔබතුමිය කියයි ඉඩක් නෑ කියලා. අඩුම තරමේ මේ මන්ත්‍රීතුමන්ලාට ඇවිල්ල තාවකාලිකව ඉන්න හරි තැනක් නෑ. මේ සභාව තව ටික කාලෙකින් ඉවර වෙනවා. සභාපතිතුමාගේ මූලිකත්වයක් නොවේ නම් කවුද ඊට පස්සේ මේ මන්ත්‍රීවරුන් කියලවත් ගෞරවය රකින්නේ. එකම මන්ත්‍රීවරයෙක්ටවත් තමන්ගේ

බෑග් එකවත් තියන්න තැනක් තියනවද බලන්න. බයිසිකලයක් දාන්න වෙන්කරලා තැනක් තියනවද? ගෞරවනීය මන්ත්‍රීවරුන්ගේ ගෞරවය කොහෙද තියෙන්නේ? එහෙම තියෙද්දිත් අපි සද්ද නැතිව ඉන්නවා. කරන්න බැරි නම් අපට අවශ්‍ය නෑ. එතකොට උප සභාපති කියන්නේ හොඳ මනුස්සයෙක්ද නරක මනුස්සයෙක්ද කියලා ඔබතුමියලා තෝරගන්න. අපි සමාජයේ ජීවත් වෙන්නේ වැදගත් විදියට. කිසි කෙනෙකුට මම සත පහක්වත් වංචා කරලා තියනවා නම් ඔප්පු කරන්න. කිසිම විදියකින් කොමිස් එකක්, සතපහක්වත් ගත්ත කෙනෙක් නොවෙයි මම. ඒ නිසා මගේ ජීවිතය ගෞරවයට පත් කරගෙන තිබෙනවා. ඒ නිසා මම කියන්න කැමතියි සන්ධ්‍යා සභාපතිතුමා පත් වුනාට පස්සේ එතුමා මිය යනකොට අපි ඒක නිවැරදියි කියලා හිතුවා. හැබැයි එතුමාටත් අවසානයේ මොකද වුනේ. ආණ්ඩු පක්ෂයක් හැටියට අපි විරුද්ධ වුනා. ඔබතුමියටත් මතක ඇති එතුමා ඉන්නකොට මොනවා හරි හේතුවකට මන්ත්‍රීතුමන්ලා තුන්දෙනෙක් 2020, 2021 දී අයවැයට විරුද්ධව ඡන්දය දුන්නා. ඇයි ඒ තුන්දෙනෙක් විරුද්ධ වුනේ. එහෙමනම් ආණ්ඩු පක්ෂේ හැටියට අපි 15 දෙනාටම එදත් එකට ඉන්න තිබුනා. ඊට පස්සේ මොකද වුනේ. සභාපති ලෙස උප සභාපති පනත අනුව පත් කරන්න තියනකොට අපේ නායකයන්ට අවශ්‍ය විදියට ඔබතුමිය පත් කලා. එසේ පත් කිරීම තුල අපි ආණ්ඩු පක්ෂයක් ලෙස ගැටීමක් ඇති වුනා. ඒ ගැටුම හින්දා තමයි අද අපි ආණ්ඩු පක්ෂේ ඇතුලේ විරසක තත්වයක් තියෙන්නේ. එහෙම තියෙද්දිත් ඔබතුමිය සභාව ආරම්භ කරලා ගෙනියනකොට අපි නොයෙකුත් ඒවා කලා තමයි. කීව තමයි. හැබැයි කීවට ඒවට විසඳුමක් නෑ. මට මතකයි 2022 ජනවාරි කල් ගිය සභාව 25 වෙනිදා. එදා අපි කීව ආණ්ඩු පක්ෂය කැඳවන්න. ඒකනේ ඔබතුමියට තියන ලොකුම ගැටළුව. ඔබතුමියට තව ටිකකින් තේරෙයි මොකද වෙන්නේ කියලා. එහෙම වෙනකොට අපි කවදාවත් ආණ්ඩු පක්ෂේ අයවැයට විරුද්ධ වීම් නැහැ. අපි ආණ්ඩු පක්ෂේනේ. රජයක් ඇතත් නැතත් පොහොට්ටු කාලෙනේ තව තියෙන්නේ. ඒක වෙනස් වෙන්න මැතිවරණයක් තිබ්බේ නැනේ. ප්‍රාදේශීය සභා විසුරුවන්න එපැයි. එතෙක් අපි ඉන්න ඕනැනේ. ආණ්ඩු පක්ෂේ එක්ක සාකච්ඡා කරන්න අපි එක්ක එක සාකච්ඡාවක් කලාද කියලා මේ සභාවට කියන්න. එක වතාවක් අපේ බලහත්කාරකමට කෑ ගහල මෙතෙන්ට කැඳෙව්වා. මම ආණ්ඩු පක්ෂේ, විපක්ෂේ, එක්සත් ජාතික පක්ෂේ තුන් වතාවක් සභාව නියෝජනය කරපු මිනිහෙක්. එතකොට එහෙම ඉඳලා එනකොට අපි විපක්ෂේ කතා කරලා තමයි සභාව තේරුවේ. එතකොට අපිට කවුරු කතා කරලා කලත් කමක් නෑ. අපේ ජනතාව වෙනුවෙන් මේක කිව යුතුයි. මේක කරන්න පුළුවන්. මේ සභාව කාලේ සභාපති සන්ධ්‍යා මැතිතුමා ඉන්දැද්දි අපි ආණ්ඩු පක්ෂේ, සංවිධායකවරයා එක්ක සාකච්ඡා කරලයි අපි බොහෝ වෙලාවට ආවේ. ඔබතුමිය දැන් මාස 11 ක් විතර වෙනවා. ඒ මාස දහයෙන් එක වතාවක්වත් ඔබතුමිය මාසෙන් මාසෙට අපි කැඳවලා නෑ. ඒක තමයි ඔබතුමියගේ තියන කුහකකම. ඔබතුමිය කොච්චර කිව්වත් ඇහුවේ නෑ. දැන් ඔබතුමියට ලෙන්ගතුවෙන්න හිතිලා ඇති. හැබැයි ඔබතුමිය ලෙන්ගතු වෙන්න තිබුනේ දැන් නොවෙයි. අරගලය වෙලාවේ ලෙන්ගතු වෙලා හිටියා නම් ඕවා කරන්න පුළුවන්. දේශපාලනය කරන්නේ. අපේ පුද්ගලික අමනාපකම් එතනට අවශ්‍ය නෑ. සුමිත් රාජපක්ෂ සංවිධායකවරයා මේ ආසනේ දිනෙව්වා. එතුමා තමයි පොහොට්ටුවේ සංවිධායකවරයා ලෙස කටයුතු කරන්නේ. අද අපේ නායකයන්ට තේරෙන්නෙ නැති වුනාට අපි තමයි ජනතාව අතරට ගිහිල්ලා පොහොට්ටු සභාවක් හදා ගත්තේ. මේ සභාවට ආවේ සේවයක් කරන්න. අපි ආණ්ඩු පක්ෂේ ඉඳගෙනත් විපක්ෂයක් විදියටයි ඉන්නේ. එහෙම නැත්නම් අපිට සාධාරණයක් ඉටුවෙන්න ඕනෑ. කිසිම සංවර්ධනයක් වෙන්නේ නෑ. කොච්චර කයිය ගැහුවත්, කොච්චර කෝටි ගණනක් වෙන් කෙරුවත් අන්න ඒ නිසා තමයි අපිට විශ්වාස නැත්තේ.යෝජනා දාලා කෙටුම්පත ඉදිරිපත් කරලා සංශෝධනවලට යන්න ඕනෑ නිසයි අද මේ සභාවට ඉදිරිපත්කරන්නේ. මේකේ තියනවා ලැජ්ජාව, බය. එතකොට අපි ලැජ්ජා වෙන්න ඕනෑ. හේතුව අපි යම් කිසි දෙයක් කිරිමේදී, හොඳට හැදිච්ච කෙනෙක්ගේ ලක්ෂණය තමයි නීති රීතිවලට එකඟ වීම. අපි සදාචාරාත්මක වෙන්න ඕනෑ. එහෙම නැත්නම් බොරුවට එළියට ගිහින් නරක දේවල් කරලා සුදු ඇඳුමක් දාගෙන හිටියට මන්ත්‍රී නොවෙයි. ඒ එළියේ කරපු දේ මේකට බලපානවා. අපි දන්නවා බොහොම හොඳට. හැසිරීම් රටාවල් ගැන අමුතුවෙන් කතා කරන්න ඕනෑ නෑ. ඒ සමාජගත වෙච්ච මිනිස්සු කොච්චර ඉන්නවද? ඒකට ප්‍රාදේශීය නායකයෝ වෙලා තමයි රටේ නායකයෙක් වෙන්න පුළුවන්. ප්‍රේමදාස මහත්තයා ප්‍රාදේශීය නායකයෙක් හැටියට තමයි කොළඹ ගම් සභාවෙන් නගර සභාවට ඇවිල්ලා එතුමා පාර්ලිමේන්තුවට ගිහිල්ලා ජනාධිපති වුනේ.එහෙමනම් මේ විදියට ගිහිල්ලා නායකයෙක් වෙන්න පුළුවන්. හැබැයි ආදර්ශමත් වෙන්න ඕනෑ. එතකොට එවැනි තත්වයක් තියෙද්දි ඔබතුමියට ආණ්ඩු පක්ෂේ 15 දෙනා එක්ක සාකච්ඡා එකක් හරි කෙරුවා නම් ඒවා ඔප්පු කරන්න ඕනෑ. අත්සන් ලේඛන තියෙන්න ඕනෑ. වාර්තාවක් අපිට දෙන්න ඕනෑ. එහෙම නම් පක්ෂේ ලේකම්ට ඒක යවන්න ඕනෑ. ඒව එකක්වත් ඔබතුමිය කරලා නෑ. ඔබතුමියට කොපමණ කීවත් ඒවා

තේරෙන්නේ නෑ. අහන්නේ නෑ. හිතුවක්කාරකම හින්දම. ඒකයි ඇත්ත කතාව. ඔබතුමියත් අපත් අතර පුද්ගලික අමනාපකම් නෑ. අපි කැමති නෑ ඔබතුමියට විරුද්ධව කතා කරන්න. නමුත් තිබෙන වැරදි වලට කතා නොකරත් බෑ. මම කැමති නෑ නරක මිනිස්සු සමාජගත වෙනවා දකින්න. අපි බොහොම සදාචාරගරුකවයි දේශපාලනය කරන්නේ. සදාචාරාත්මක සභාවක් ගෙනියන්න ඕනෑ. සදාචාරාත්මක වැඩසටහන තුල අපි දැක්කේ නෑ ඒ කඩිනම් සේවාව. දැන් නගරය බලන්න. නගරයේ වැඩ පටන් ගන්න බැරුව තිබුනා. මොහාන් වික්‍රමනායක මැතිතුමා සාක්ෂි දරයි, හිටපු සන්ධ්‍යා සභාපතිතුමා නිසාත් මේ කටයුතු ප්‍රමාද වුනා. ඊට පසුව ඇනහිටපු ඒ කටයුතු වැඩබලන සභාපතිවරයා හැටියට අපි ආසන සංවිධායකවරු දෙදෙනා කැඳවලා මේ ස්ථානයේ සාකච්ඡා කරලා තමයි නැවත එම කටයුතු පටන් ගත්තේ. දැන් එය නැවත මන්දගාමී වෙලා තිබෙනවා. අධ්‍යක්ෂකවරයගෙන් මම ඇහුවා. එතුමා කියනවා සභාපතිතුමියට කීවට එතුමිය බොහෝ සැක සහිතවලු බලන්නේ. එහෙම තමයි එතුමා කීවේ. හේතුව මොකද්ද කියන්න මම දන්නේ නෑ. බලන්න මේ අපේ කාලය. දැන් මේවා ඔක්කොම සංවිධානය වෙලා එනකොට සභාව විසුරුවොත් එහෙම දැන් මාස 10 ක් 11 ක් තිස්සේ එක වැඩක් කියන්න ඔබතුමිය කරපු. ඔබතුමිය තමයි නගරයේ ප්‍රධානියා. ඔබතුමිය ළඟම කෙනා. අඩුම ගානේ ආදාහනාගාරය හදන්න ලිපි ටික හදලා කොළඹට ගිහින් දීලා මේක කරන්න කියලා අපිට කීවා නම් අපි කවුරු හරි ඒ අමාත්‍යාංශයට ගිහින් ඒ කටයුතු කරනවා. අපේ පොහොට්ටුවේ සභා කාලේ විසුරුවා හැරියොත් අපි ආයේ ඡන්දේ ඉල්ලන්නේ කොහොමද? එතන ඉන්න මහ නායකයෝ කොපමණ කයිය ගැහුවත් ජනතාව එක්ක ඉන්නේ නෑ. අපි ගම්වල ජීවත්වන මිනිස්සු. ගම්වල ඕවා යටගහලා, වහලා කටයුතු කරන්න බෑ. ඒක තමයි ඇත්ත. අවංකව හිතන්න ඕනෑ. ඒ නිසා මම කියන්න කැමතියි අපි දකින දේ, අපේ නායකයින් ගත්තු වැරදී තීරණ නිසා තමයි මේ සියල්ල සිදුවෙලා තිබෙන්නේ. අපි නායකයෝ රකින්න ඉන්න මිනිස්සු. මේ ප්‍රාදේශීය සභාවට ආවත් ආවේ සේවය කිරීමට මිසක් සභාවේ යම්කිසි කොන්ත්‍රාත් එකක් අරන් කොමිස් ගහන්න පුරුදු වුනා නම් ඒ මන්ත්‍රීකම මොකද්ද? මේගොල්ලෝ මේවාට ආවඩලා බලාපොරොත්තු වෙන්නේ මේ දේ කරගත හැකි කවුරු හිටියත් කියලා හිතලා ඒ අය ශක්තිමත් කරන්න අදහස් කරනවා. හැබැයි එළියේ බැළුවම වැඩිපුර ඉන්නේ හොරු. ඒ ගැන අපි අවධානයක් යොමු කරන්න ඕනෑ. ඒ නිසා මම හිතනවා ඔබතුමිය ආණ්ඩු පක්ෂය හැටියට අපි සමඟ සමගි වුවහොත්, මේ සාකච්ඡාව කැඳෙව්වා නම්, සුමිත් රාජපක්ෂ මැතිතුමා එක්ක සාකච්ඡා කලා නම් මේකට අපි ආණ්ඩු පක්ෂය ලෙස අපි පක්ෂ වෙනවා. ඒ නිසා අපි විරුද්ධ වෙන්න තීරණය කරලා තියෙන්නේ. අයවැය කෙටුම්පතට අපි කවදාවත් විරුද්ධ වෙන මිනිස්සු නෙවෙයි. අපි විරුද්ධ වෙන තැනට ඔබතුමිය හදාගත්තේ. අපිට දුකයි. ඒ උනත් අපි හිත හදාගෙන තිබෙනවා. අවසානයේ අපිට එරෙහි වෙන්න වුනා අපේ නායකයෝ කරපු වැඩ නිසා. අපිට අසාධාරණකම් කලා. අපි මහමගට ගෙනැල්ලා උප සභාපති වැඩ බලන කියලා නැවත නගරයට ගිහිල්ලා රෙදි ගැලෙව්වා වගේ වැඩක් වුනේ. මට ගමට යන්න ලැජ්ජයි. මට හිනාවෙනවා මිනිස්සු. මට ඒ කරපු වැරැද්ද නිසා. එදා සභාවේ සන්ධ්‍යා මැතිතුමා මිය යන විටම ඔබතුමිය පත්කලා නම් ප්‍රශ්නයක් නෑ. එහෙම උනා නම් මම වැඩ භාරගන්නේ නෑ. ඒවා කලේ නෑ ඉහළින්. එහෙම කරලා අද පනත් ගැන කතා කරනවා. පනත අනුව වැඩ කරන්න දැන් ලැහැස්ති වෙලා. පනතට අපි යටවෙන්න ඕනෑ. එහෙම නොවෙයි, සභාවේ මන්ත්‍රීවරු වැඩි පිරිසක් අත උස්සලා තීන්දුවක් ගන්නවා නම් ඒ තීරණය වැදගත් වෙන්න ඕනෑ. ඒක තමයි ජනතා නියෝජනය. අපි 10 දෙනෙක් විරුද්ධ වෙනවා නම් 10 දෙනාට ඡන්ද 100 ගාවේ බැළුවනම් වැඩි පිරිස එතන නේද ඉන්නේ. 69 ලක්ෂයක් ගත් අපේ නායකයෝ, අපේ ජනාධිපතිතුමා ගෝල්ෆේස් අරගලයත් එක්ක යන්න ගියේ ඇයි, ඒක තමයි ජනතා තීන්දුව. ඒක නිසා අපි කල්පනා කරන්න ඕනෑ. මීට වඩා මේ සභාවේ මන්ත්‍රීවරු එක්ක සමඟිය ඇතිවන විදියට මුලින්ම වැඩ කලා නම් හරි. ඒක තමයි මුලින්ම කරන්න තිබුනේ. විපක්ෂය එක්ක සමගියෙන් වැඩ කරලා වැඩක් නෑ. අපේ යසිත් මන්ත්‍රීතුමා කීවා ඒ විශ්වාසය කඩවුනා කියලා. අපි අතරේ විශ්වාසය හදා ගත්තෙත් නෑ. කීප දෙනෙක් හිතවත් වුනා. එච්චරයි. එයාලත් සංවර්ධනයනෙ කරන්නේ. අපි තරහා නෑ. අද උප සභාපතිවරයා කැලේ. එතකොට මම උප සභාපති ඉන්නේ නමට විතරයි. ඊළඟට මට ගෙදර යන්න වෙයි. නමුත් ඉන්න මොහොතේ සත්‍යය කියන්න අවශ්‍යයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, 2023 වර්ෂය සඳහා සකස් කල අයවැය කෙටුම්පතට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරයෙක් විදියට මමත් සම්පූර්ණයෙන්ම විරුද්ධයි. ඇත්ත වශයෙන්ම ඔබතුමියගේ පරිපාලනයේදී දෙතුන් දෙනෙක්ට උදව් කරපු පරිපාලනයක් තමයි සිද්ධ වුනේ.

මන්ත්‍රීවරු 28 දෙනෙක් ඉන්නවා. මේ 28 දෙනාගෙන් දෙතුන් දෙනෙක් අද ඇස්තමේන්තු දාගෙන තිබෙනවා. එක පිරිසක් විතරයි අද වැඩ කරගන්නේ. එහෙම කරන්න බෑ. මම කාණු කැට ඉල්ලලා තිබෙනවා මේ අවුරුද්දේ 03 වෙනි මාසේ. අපිට කාණු කැට ගෙනියන්න බෑ. වෙනත් පුද්ගලයින් කාණු කැට ගෙනියනවා. ඒක ලොකු ප්‍රශ්නයක්. ප්‍රතිපාදනයක් දුන්නත් කොටසක් තෝරගෙන තමයි ප්‍රතිපාදනය දෙන්නේ. අපේ ඉහල නායකයෝ රට කෑවා. මෙතුමිය ප්‍රාදේශීය සභාව කෑවා. අර කැබ් රථය විනාශ කලා. මොකද්ද ඒ කරපු අපරාධය. සභාවට ඇවිල්ලා මේවද කලේ. දෙතුන් දෙනෙක් කැබ් එකේ දාගෙන කොළඹ ගිහිල්ලා මොකද්ද ඒ කරපු දේ. අපේ ආර්ථිකය බංකොලොත් වුනා. දෙතුන් දෙනෙක්ට උදව් කරන ප්‍රාදේශීය සභාවක් අපිට වැඩක් නෑ. මගේ කොට්ඨාශයේ පසුගිය දිනෙක කාණුකැට දැම්මා. මන්ත්‍රීවරු නෙවෙයි. ගමේ මන්ත්‍රීවරයාට වඩා සාමාන්‍ය පුද්ගලයාගේ ලියුම බලවත්. මේ 28 දෙනාම අපේ මන්ත්‍රීවරු. මෙතුමියට හැම වෙලාවේම මෙතුමියගේ කවුරුහරි කෙනෙක් ආවොත් ඒක වැදගත්. ලේකම්තුමියට කතාකලොත් කියනවා සභාපතිතුමියට කතා කරන්න කියලා. පාර්ලිමේන්තුවේ විමධ්‍යගත ප්‍රතිපාදන දෙන්නෙ ජනාධිපතිට කතා කරල ද? අපි බුද්ධිමත් මිනිස්සු නොවෙයිද? පළාත් සභාවේ පළාත් ප්‍රතිපාදන දෙන්නේ මහ ඇමතිට කතා කරල ද? ඒවත් වරප්‍රසාද. එහෙම නම් මොකටද මේ මහා සභාවට දාලා මේවා අනුමත කරන්නෙ. සියලු දෙනාගේ කැමැත්ත අහන්නෙ. ඔබතුමියට පුලුවන්නේ ඒ දෙතුන් දෙනාත් එක්ක සාකච්ඡා කරන්න. ඒ වගේ අයුතු වැඩ සිදු වෙනවා. ඒ නිසා මම මේ වැඩපිළිවෙළට මගේ සහයෝගය ලබාදෙන්නේ නෑ. මට ශක්තියක් තියෙනවා මගේ මුදලින් හරි වැඩ කරන්න. අපි වැඩත් කරලා තියනවා. අපි ගම්වල වැඩ කරලා මිනිස්සුත් එක්ක ඉන්නවා. මිනිස්සු අපිට ආදරෙයි. අපි ගමට යම් වැඩ කොටසක් සිදු කරලා තිබෙනවා. මම කියන්නේ කොටසකට සලකන අයවැයක් තමයි මේ ගේන්නේ. එතකොට අපිට වැඩක් කරගන්න බැරිනම්, JCB එක අපිට ගන්න බැරිනම් වැඩක් නෑ. අපට ලබා දෙන්නේ නෑ. අදටත් ඒ පාරේ යන්න බෑ. නමුත් ගමේ කෙනෙක් ඉල්ලුවොත් ලබා දෙනවා. ශක්තිමත් නායකත්වයක් තිබෙනවානම් අපට කෙළින් නැගී සිටින්න පුළුවන්. මේ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු ඔක්කොටම උදවු කළා කියලා. කොටසකගේ විතරක් ඇස්තමේන්තු හදලා දාලා. මොකක්ද මේ? කොටසකට විතරක්. අපට නෑ ලක්ෂෙවත්. මම කියන්නේ අපි රටක් විදියට ආර්ථික වශයෙන් ලොකු පරාජයක් ලබල තිබෙනවා. අපේ රට මේක. අපේ දරුවෝ, සහෝදරයෝ, ව්‍යාපාරිකයෝ අපි ඔක්කොම වැටිලා ඉන්නේ. මේ ප්‍රාදේශීය සභාවේ සන්ධ්‍යා කුමාර මැතිතුමා ඉන්නකොට එතුමාගේ තිබුණා හොඳ ගතිගුණයක්. මොනවාහරි තිබෙන අවස්ථා වල හැමෝටම ආරාධනා කරනවා. දැන් මේ ප්‍රාදේශීය සභාවේ එක්කෙනෙක් දෙන්නෙක් ගිහින් සහන මළු බෙදනවා. අනෙක් මන්ත්‍රීවරුන්ට කිසිම තැනක් නෑ. හැමෝටම උදව් කරන්න ඕනෑ. ඔබතුමිය සභාපති ධූරය හොරකම් කිරීමක් කරලා තිබෙන්නේ. උප සභාපතිතුමාට අයිති දෙයක්. අගමැතිතුමාට කීවා, දිස්ත්‍රික් නායකයින්ට කීවා, ආණ්ඩු පක්ෂේ මන්ත්‍රීවරු කවුරුත් කැමති නෑ. කීපදෙනෙක් අත්සන් කරලනෙ ගත්තේ. ඉදිරියට තිබෙනවා ප්‍රා.ස. 16 , ප්‍රා.ස. 14. මම කියන්නේ මන්ත්‍රීවරු අපි තීන්දුවක් ගන්න ඕනෑ. අපි දකිනවා අසාධාරණය, අයුක්තිය රජ කරවන යුගයක්. අපි ඒවට කැමති නෑ. මම කියන්නේ අපිට තිබුණ ලොකුම සම්පත කැබ් රථය. ඒකත් විනාශ කලා. දැන් වාහනය කෝ? අපි කතා කලාට වැඩක් නෑ. වාහනය නෑ. ඒවා අපේ සම්පත්. අපිට රටක් විදිහට ගෙනියන්න හොඳ නායකයො හැමෝගෙම උපදෙස් ගන්න ඕනෑ. එහෙම නැතුව රට ගෙනියන්න බෑ. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට උනෙත් තනි මතයට වැඩ කිරීම. නමුත් එතුමා මිනිස්සුන්ට වෙඩි තිබ්බේ නෑ. ඒක එතුමාගේ හොඳ ගතිගුණයක්. පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මන්ත්‍රීවරු 28 දෙනාටම උදව් කරන්න ඕනෑ. මේ රටේ ජනතාවගේ මුදල්. ප්‍රදේශයේ ජනතාවගේ මුදල්. ඒ නිසා මම කියන්නේ පොදුවේ හැමෝටම උදව් කරන්න ඕනෑ. මම සියලු දෙනාටම කියන්නේ හොඳ තීරණයක් ගන්න. දෙතුන් දෙනෙක් සතුටු කරන අයවැයකට උදව් කරන්න එපා. අපි මේ රට ගොඩනගන්න ඕනෑ. අපි කොට්ඨාශයේ මන්ත්‍රීවරු විදිහට අපි තුන්දෙනාම එකට ඉන්නවා. ඒ වගේම මම තව කාරණයක් කියන්න ඕනෑ. අපේ කොට්ඨාශයේ වතුර ගැලුවා. පාරවල් ගලවගෙන ගියා. මම මගේ මුදල්වලින් ඒ දේවල් පිළිසකර කලා. ඒ නිසා මම මේ අයවැයටත් විරුද්ධයි. පරිපාලන ක්‍රමයටත් විරුද්ධයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මම ඉල්ලීමක් කරනවා ඔබතුමියගෙන් මේ අවුරුද්ද තුළ ආණ්ඩු පක්ෂෙයි, විපක්ෂෙයි මන්ත්‍රීවරු ප්‍රතිපාදන ලබාගත්තු ලේඛනයක් තියනවනම් සභාගත කරන්න නැත්නම් වැරදි පූර්වාදර්ශයක් වෙනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

2022 වර්ෂයේ ඔබ කවුරුත් දන්නව ආර්ථික වශයෙන් මුළු රටම අස්ථාවර තත්වයට පත්වුනා. ඒ අනුව අපි සැලසුම් කරපු වැඩසටහන් මුල් මාස 03 විතරයි ක්‍රියාත්මක කරන්න ලැබුනෙ සභාවේ ආදායම් තත්වය හා රජය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ විධි විධාන අනුව අපට සංවර්ධන කටයුතු නතර කරන්න සිදුවුනා. ඒත් මුල් මාස 03 ඇතුලත අපිට ව්‍යාපෘති 10 ක් ක්‍රියාත්මක කරන්න පුළුවන් වුනා. ඒ අනුව ගරු මන්ත්‍රීවරුන්ට වෙන්කළ ප්‍රතිපාදන යටතේ ගරු අරුණ කුමාර ජයලත් මන්ත්‍රීතුමා එතුමාට වෙන්වූ ලක්ෂ 05 ප්‍රතිපාදනවලට අදාල ව්‍යාපෘති 05 ම වැඩ කරගෙන තියනවා. ඒ වගේම ගරු නිහාල් ඒකනායක මන්ත්‍රීතුමා එතුමාට වෙන් වූ ලක්ෂ 05 ව්‍යාපෘති වල වැඩ අවසන් කරල තියනවා. අනිත් ගරු මන්ත්‍රීතුමන්ලාගේ ව්‍යාපෘති නොකෙරුනේ ඔබතුමාලම දන්නවා රටේ තිබුණ වාතාවරණය මොකක්ද කියලා. චක්‍රලේඛ ආවා සංවර්ධන වැඩ නවත්වන්න කියල. මුදල්වල අර්බුදයක් තියනවයි කියල. තාමත් රට ස්ථාවර තත්වයට පත්වෙලා නෑ. ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න නොලැබීම මගේ වරදක් නොවේ. අත්‍යවශයම යමක් කරනවා නම් ඒක ඉහලට ඉදිරිපත් කර අනුමැතියක් ඇතිව කරන්න තමයි දැනුම් දීල තියෙන්නෙ දැනටත්. ඒ උපදෙස් අපට ආවෙ සැප්තැම්බර් මාසයේදී. ඊට පෙර සියළු සංවර්ධන කටයුතු නතර කරන ලෙසයි රජයෙන් දැනුම් දී තිබුනේ. පසුගිය කර්මාන්ත කමිටුවෙදි අපි සාකච්ඡා කළා ඒ වගේ අත්‍යවශ්‍ය යෝජනාවල ඇස්තමේන්තු ගරු මන්ත්‍රීතුමන්ලාට තියනවනම් කාර්මික නිලධාරින් මගින් ඇස්තමේන්තු සකස් කරල මේ සභාවට දාල අනුමැතියට යවමු කියල.

නගර සංවර්ධනය ගැන කතා කළා. මම සභාපති වෙලා ඉන්න කලින් කෙරුණ සංවර්ධන කටයුතු මමත් එහෙමම කරගෙන ගියා. හැම වෙලාවෙම සභාවෙන් දෙන්න පුළුවන් උපරිම සහයෝගය ලබා දුන්නා. විපක්ෂ නායකතුමා ඒ ගැන සාක්ෂි දරනවා ඇති. විදුලි බල මණ්ඩලය, ටෙලිකොම් එකෙන් වැඩ කරන අවස්ථාවල දෙන්න පුළුවන් උපරිම සහයෝගය ලබා දුන්නා. පාරේ අනිත් පැත්තේ ඇස්තමේන්තුව අනුමත වෙලා තිබෙන්නේ. ටෙන්ඩර් එකත් ගිහිල්ලා තිබෙන්නේ. ඒ කටයුතුවලදී ආපස්සට ගිහිල්ලා නෑ. අදාල අමාත්‍යාංශ, දෙපාර්තමේන්තුවලට ලිපි යොමු කරලා තිබෙන්නේ. ඒවාට පිළිතුරු සහ විසඳුම් ලැබී තිබෙනවා. ඒවා ඉදිරියට ගේන්න වැඩකරලා තිබෙනවා. නමුත් රටේ තිබෙන මේ අර්බුදකාරී තත්වයත් එක්ක තමයි ඒවා නතර වෙලා තිබෙන්නේ. මෑතකදී නගර සංවර්ධන අධිකාරියේ නිලධාරීන් ආවා. එතුමන්ලා එක්ක නගර සංවර්ධනය වෙන්න අවශ්‍ය තැනට සාකච්ඡා කළා. ඒ වගේම මම නගරයේ කෙනෙක් විදිහටත් දෙන්න පුළුවන් උපරිම සහයෝගය ලබා දීලා තිබෙනවා.මට ඒව සාක්ෂි ඇතිව පෙන්වන්න පුළුවන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, කතාවක් තිබෙනවා ජයග්‍රහණයට පියවරු දාහයි, පරාජය අවජාතකයි කියලා. අද 2023 අයවැය ඇස්තමේන්තුව රු. 179,487,386.00 ක් ලෙස මේ ගරු සභාවට ඉදිරිපත් කරනු ලැබුවේ පද්මා වැත්තෑව මැතිණියගේ පෞද්ගලික අයවැයක් නොවෙයි. අපි මේ සභාව නියෝජනය කරන්නේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු විදියට. අපි විශ්වාස කරන අනුගමනය කරන දේශපාලනයක් තිබෙනවා. ඒ දේශපාලනයේ හැටියට අපි හැසිරෙනවා මිස අපිට මේ සභාව තුල ඕනෑ ඕනෑ විදියට පාවෙන්න බෑ. අද මේ ගරු සභාවට ඉදිරිපත් කරන මේ අයවැය මේ රට පාලනය කරන රනිල් රාජපක්ෂ ආණ්ඩුවේ, අලව්ව පළාත් පාලන ආයතනයේ පොදුජන පෙරමුණේ අයවැය හැටියට තමයි අපි දකින්නේ. දැන් මේ රටට කරපු විනාශයෙන් අත පිහදාගන්න ඕනෑ කෙනෙකුට ඕනෑ දෙයක් කියන්න පුළුවන්. හැබැයි මේ රට මේ තැනට ඇද දාපු

මේ 74 වසරක දේශපාලනයට මේ රනිල් රාජපක්ෂ, මේ පොදුජන පෙරමුණ, මේ ආණ්ඩුව වග කියන්න ඕනෑ. මේක විකුනගෙන කන ආණ්ඩුවක්. මේක හිගා කන ආණ්ඩුවක්. ඒ විතරක් නොවෙයි. හොරා කන ආණ්ඩුවක්. එහෙම නම් අද අලව්ව ප්‍රාදේශීය සභා ශාලාවේ පොදුජන පෙරමුණේ අයවැයට විරුද්ධව අපි ඡන්දය දෙන්නේ මේ රටේ දුක්විඳින ජනතාව අද පාරට බැහැලා ඒ පොදුජන පෙරමුණ ආණ්ඩුව එපා කියන මතයේ ඉන්නවා. ඒක තමයි අද බිම් මට්ටමේ ඉන්න ජනතාව කරන්නේ. රටේ ව්‍යවස්ථාවට මුවා වෙලා 1978 ඉඳන් මේ රට හදා ගන්න බැරිවෙච්ච රනිල් වික්‍රමසිංහ ජනාධිපති කරගෙන හීන දකිනවා හෙට දවසේ මේ සමාජය තව පියවරක් හරි ඉස්සරහට යයි කියලා. ඉදිරියේදී කතා කරමු. මම එදත් කිව්වා අපි හීන දකින්නේ නෑ. 1978 ඉඳලා අගමැතිකම් කරපු මේ රට පාලනය කරපු රනිල් වික්‍රමසිංහ ලංකරගෙන රාජපක්ෂ තම හොරකම් වහගන්න කටයුතු කරමින් ඉන්නවා. අද විලිලැජ්ජා නැතිව මහින්ද රාජපක්ෂ නැවතත් ජනතාව අතරට යන්න ලෑස්ති වෙලා තියෙනවා තවත් ජනතාව රවට්ටන්න. අපි අභියෝග කරනවා. මහ මැතිවරණය නොවේ, ප්‍රාදේශීය සභාව හරි තියන්න කියලා. මේ රටේ ජනමතය උරගා බලන්න කියලා මම අභියෝග කරනවා. මේ රටේ අපි කරේ සිමෙන්ති කර්මාන්ත ශාලාව හදලා, සිමෙන්ති හදලා විකුණනවා වෙනුවට සිමෙන්ති කර්මාන්ත ශාලාව වික්කා. කඩදාසි කම්හලේ කඩදාසි හදලා විකුණනවා වෙනුවට අපි කඩදාසි කම්හල වික්කා. මෙහෙම කටයුතු කරපු පාලකයෝ මේ රටේ ඉන්නේ. මේ රටේ ආදායම් ලබන්නැති, පාඩු ලබන ආයතන නෑ. පාඩු කරන ආයතන තිබෙන්නේ. අනිවාර්යෙන් විකුණන්න ඕන නම් ඒ ආයතනයක් පාඩු කරන පාලකයෝ තමයි මේ රට පාලනය කළේ. අපි මේ වෙනකොට රට පුරා සියළුම ග්‍රාම නිලධාරි වසම් වල ජාතික ජන බලවේගය හැටියට කොට්ඨාශ සභා හදමින්, මේ රටේ ජනතාවත් එක්ක දේශපාලනය කරනවා. 2023 අයවැය ලේඛනයට ජනතා විමුක්ති පෙරමුණ හැටියට අපි විරුද්ධ වෙනවා. මේ රටේ පොදු ජන පෙරමුණ පාලනය කරන පළාත් පාලන ආයතන අතුගාල දාන තැනට කටයුතු කරන්න ඕනෑ කියන පණිවිඩය අපි මේ රටට දෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අද මේ අවස්ථාව එක් පැත්තකින් සන්තෝෂයට කාරණයක් තවත් පැත්තකින් දුක්වෙන්න කාරණයක්. ඒ මොකද ගිය වසරේ අයවැය වෙලාවේ තමයි අපේ ගරු මන්ත්‍රීතුමියයි මමයි මේ සභාවට එන්න තිබුනේ. නමුත් අයවැය දවසෙ මේ සභාවට එන්න තිබුණ ගැසට් එක ජොන්ස්ටන් ප්‍රනාන්දු අමාත්‍යතුමා, මහින්ද රාජපක්ෂ හිටපු අගමැතිතුමා, මැතිවරණ කොමිසමේ සභාපතිතුමා, කුරුණෑගල තේරීම් භාර නිලධාරිතුමා ආපහු ගත්තා. ආපහු අරගෙන අයවැයෙන් පස්සේ තමයි ගැසට් එක ආවේ. මම සතුටුයි කිවේ මේ අයවැය සම්බන්ධ වීමට හැකි වීම ගැනයි. මෙතන මේ මන්ත්‍රීවරු 28 දෙනා මහජනතාව විසින් තෝරාගෙන මහජනතාව ගේ අවශ්‍යතාවයන්, මහජනතාවගේ පොදු කටයුතු කරගන්න අවශ්‍ය නිසයි පුංචි පාර්ලිමේන්තුවට පත් කරල එව්වේ. ඒ එවල තියෙන්නේ ජනතාවට අවශ්‍ය ග්‍රාමීය පහසුකම් ඉටු කරගන්න. අපි මහජනතාවගෙ මේ අවශ්‍යතා කොතෙක් දුරට මහජන නියෝජිතයින්ගෙන් ඉටු වෙලා තියෙනවද කියන එක, ඔබතුමාල කොපමණ මහජනතාවට වැඩ කරල තියෙනවද කියන එක පිළිබඳව මහජනතාව ඉන්නේ විමසිල්ලෙන්. සමහර ඒවා අපි ආපහු බලන විට ඉටු වෙලා තියෙනවද? ජනතා නියෝජිතයා විදිහට අපි මේ සභාවට ආවහම අපි බලන් ඉන්නවා අපිටත් ලක්ෂයක් දෙකක්වත් දෙයිද, අපිටත් වීදි ලාම්පුවක් දෙයිද කියලා. සමහර අයට කොන්ත්‍රාත් දීලා, සමහර අයට පස් කපන්න දීලා. අපි බලන් ඉන්නෙ අපිටත් දෙයිද කියලා. එහෙම එකක් ලැබිලා නැහැ. ගිය වතාවේ මගේ ලක්ෂ 05 යෝජනාව කෙරිල නෑ. මම දාල තියෙනවා ඉඩංගාපොල අවමංගල්‍යාධාර සමිතියේ ගොඩනැගිල්ලට ලක්ෂයක්, දිවුල්ගහකොටුව ළිඳකට ලක්ෂ 2 ක්, අහන විට කියන්නේ සභාවෙ සල්ලි නෑ කියලා. බැරිනම් මේ බැරි දේවල් අයින් කරල දාන්න ඕනෑ. අපි ගොඩක් දුරට සමහර තැන් වලදී කට්ටියක් එක තැන නැවතිලා. සමහර කට්ටියක් යනවා. ආණ්ඩු පක්ෂෙ විරුද්ධව ඡන්දෙ දෙනවා. අද පොදු ජන පෙරමුණෙන්, පොහොට්ටුවේ ප්‍රාදේශීය සභාවෙ මන්ත්‍රි කණ්ඩායම අද ඉතිහාස ගත වෙනවා. මොකද ආණ්ඩු පක්ෂයේ

නායකයෙක් ඉන්නවා. ආණ්ඩු පක්ෂ ප්‍රාදේශීය සභාවක් තියෙනවා. ආණ්ඩු පක්ෂයෙ මන්ත්‍රිවරු 15 ක් ඉන්නවා. අපේ උප සභාපතිතුමා කීවා වගේ අපේ නායකතුමා වන සුමිත් රාජපක්ෂ මැතිතුමාත් මේ මන්ත්‍රිතුමන්ලාත් එකතු කරගෙන සාකච්ඡාවක් තියමු කියලා. ඒක ඔබතුමියට කරගන්න බැරි වුණා. අපි කණගාටු වෙනවා ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ මන්ත්‍රී කණ්ඩායම මහා කළු ගලක් සේ නොසැලී ඉන්නවා. ඒ මන්ත්‍රීතුමාලයි, සංවිධායකතුමයි එක්ක සාකච්ඡාවක් තියන්න කියල. මේ අද අයවැය සාර්ථක කරගන්න ගමන් මග හදා ගන්න තිබුණා. එහෙම නොවෙයි, සංවිධායකතුමාට නොයෙක් නොයක් ගතුකේලම් කියල දඹදෙණියෙ පොහොට්ටුවෙ නායකය විනාශ කලා. දේශපාලනය කරන ශක්තිමත් බලවේග විනාශ කලා. කිහිප දෙනෙක්ගෙ වැඩ නිසා මේ ප්‍රාදේශීය සභාවේ වැඩ කරන මන්ත්‍රීවරුන්ට තැනක් නැති වුණා අපි දේශපාලනය කරන මිනිස්සු. දේශපාලනය නිසා අපිට විවිධ තාඩන පීඩන වලට මුහුණ දෙන්න සිදු වුණා. නමුත් අපි කවදාවත් ජනතාවට ද්‍රෝහි වෙලා නෑ. ජනතාව එක්ක අපි සමීපව කටයුතු කරන්නේ. අපිට මේ සභාවෙ ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ බිහි කරන්න දර දිය ඇදපු කෙනෙක් විදියට අපිට තැනක් ලැබුණෙ නෑ. ඊලග ප්‍රාදේශීය සභා මැතිවරණයේදී පොදු ජන පෙරමුණේ ප්‍රාදේශීය සභාව අලව්ව පරදිනවා. මොකද අපි දන්නව පොදු ජන පෙරමුණේ මිනිස්සු එක්ක අපි ඉන්නෙ. පොහොට්ටුවෙන් දිනන්නම බෑ. මේ අයවැය සම්බන්ධයෙන් අපේ සහෝදර මන්ත්‍රීවරු අද විරුද්ධයි. මේ ආයතනය ජනතා බදු මුදලින් යැපෙන ජනතා සේවය සදහා පිහිටවපු ආයතනයක් මේ වගෙ හොර බොරු වංචා සිදු වෙනවාද? මේක ඇතුලෙ යම් යම් කළමනාකරණයක් වෙලා නැත්නම්, දෙතුන් දෙනෙකුට විතරක් නම් සලකන්නෙ අයවැය පක්ෂව ඡන්දය දෙන්නෙ කොහොමද? මේ 28 දෙනාටම එක හා සමානව සැලකිය යුතුයි. මේ අයවැයේ යම් යම් කාරණාවලට අපි විරුද්ධයි. මේ සභාපතිතුමිය සමහර අවස්ථාවල මහජනතාව වෙනුවෙන් යම් යම් කාර්යයන් ඉටු කරනවා. පොදු ජනතාව වෙනුවෙන් කටයුතු කලත් මේ මන්ත්‍රීවරුන්ට සලකන සැලකිල්ල මේ සභාපතිතුමියගෙන් අපි දැක්කෙ නෑ. ඒ පිළිබඳව ප්‍රකාශ කරමින් පොදු ජනතා සේවය ඉදිරියට කරගෙන යන්න පිරිසිදු වාතාවරණයක් අනුව සියළුම ජනතා නියෝජිතවරුන්ට සලකන යුගයක් මේ ප්‍රාදේශීය සභාවට උදා වේවායි ප්‍රර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ඇත්තටම ජනතාව විසින් අපි දේශපාලනයෙන් ඉදිරියට එච්චේ ගමට වැඩක් කිරිමටයි. අපි හැම වෙලාවෙම බලාපොරොත්තු වෙන්නෙ ගමට වැඩක් කිරිමටයි. අපි හොර වැඩ කරල නෑ. අපි යෝජනා ලබා දීල ඒව කරන්න පුළුවන් කරන්න කියල කීවා. මම යෝජනා ලබාදුන්නා. කලල්පිටිය, නුගවෙල අපි වැඩ කලා. ගමේ අය බලාන ඉන්නෙ අපි ගමට වැඩක් කරනකම්. සභාපතිතුමියවත් කවුරුවත් අපිට උදව් කරල නෑ ගමෙන් අපි සභාවට එච්චෙ ගමට වැඩක් කරන්න. අලව්ව පඹදෙණිය ඉදල නාරම්මල පාරෙ යන්න බෑ. හිටපු සභාපතිතුමාවත් අපට කවදාවත් උදව් කරල නෑ. සභාවෙ ප්‍රතිපාදන ලබාදුන්නා. අපි ඒවගෙත් වැඩ කලා. පෞද්ගලිකව කවුරුත් අපිට උදව් කරල නෑ. මට බය නැතුව කියන්න පුළුවන් අසාධාරණයක් වෙන්නෙ කොතනද අපි එතන හිටියා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, 2021 අවුරුද්ද සම්බන්ධව ගිය අවුරුද්දෙ අපේ ධර්මරත්න හේරත් මැතිතුමා ගෙනාපු අයවැය එතුමා ඉවත් කරල ඔබතුමිය පත් වෙලා ගෙනාපු ගමන්ම ඒ අයවැය සම්බන්ධව යෝජනා චෝදනා කියවෙද්දි ඒ අයවැය සම්බන්ධව සියලු කරුණු පිළිබඳ සලකා බලල ඒ අයවැයට පක්ෂව අපි ඡන්දය ලබා දුන්නා. අපි අයවැයට පක්ෂව ඡන්දය දුන්න කියල අපි සභාවෙන් පෞද්ගලිකව ලාභ ප්‍රයෝජන ලබා ගත්තේ නෑ. ඒකට එක හේතුවක් තිබෙනවා. 2006 වසර මට තාම මතකයි. අලව්ව ප්‍රාදේශීය සභාව තිබුණෙ නාරම්මල චමින්ද වර්ණසූරිය මන්ත්‍රීතුමත් සාක්ෂි දරයි. අපි එකට ගියෙ ඒ ගිහිල්ල මංගලව ගෙනාපු අයවැයේ දී එවකට දඹදෙණිය ආසනේ සංවිධායකවරයා හැටියට කටයුතු කල එක්සත් ජාතික පක්ෂයේ ශමල් සෙනරත් මැතිතුමා අපි කණ්ඩායම කැඳවල කිව්ව " මම නාරම්මල ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතයෙක් හැටියට ඇවිල්ල තමයි පලාත් සභා මන්ත්‍රීවරයෙක් විදිහට මේ ගමන ආවේ. ඒ

ගමන්මගේ ගාමිණී ගුණදාස මැතිතුමා, සෙනරත් සුමනදාස මැතිතුමා වගේ අය එක්කල අපි හැප්පුනා. එදා සෙනරත් සුමනදාස මැතිතුමා අපට කීවෙ අයවැය යෝජනාවේ තිබෙන දේවල් හෘද සාක්ෂියට අනුව කෙරෙනවනම් අපි බෙදීමකට ගිහිල්ල සාදාකාලික වෛරක්කාරයෝ වෙන්න අවශ්‍ය නෑ. මේ අයවැයට සහයෝගය දිල යන්න කියලා." මොකද එදා රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා මෙහෙම ප්‍රශ්ණයක් එයි කියල දැනගෙන තමයි 1987 පනත හදල ඒ පනතට අවශ්‍ය කරන නීති රීති සියල්ල ඇතුල්කරලා තිබුනෙ. සභාපතිවරයාට තමන්ගෙ අභිමතාර්ථය පරිදි පවත්වාගෙන යන්න විගණනයට මුහුණ දීමට හැකි වන ආකාරයට. 2006 අයවැය සම්මත කරල ගිය දවස තමයි ජයතිලක මන්ත්‍රීතුමා වීදි පහන් පිළිබද ප්‍රශ්නයක් කතාකලහම ඒ කාලේ  සභාපතිවරයා ලෙස කටයුතු කළ සුමිත් රාජපක්ෂ මැතිතුමා ජයතිලක මන්ත්‍රීතුමාගේ  නිවස අවට තිබෙන වීදි පහන් 5 ක්  ගලවගෙන ආවා. එතුමා කීවෙ "මගේ ඉල්ලිමට අනුව බල්බ් ටික දාල දෙන්න මේක පොඩ්ඩක් බලන්න" කියලා, හැන්සාඩ් එකේ ඇති ඇති. නමුත් වීදි පහන් 5 ම ගලවගෙන ගියා. ඉන් පසු ජයතිලක මන්ත්‍රීතුමා කීව "තවත් ඒ පාරෙ 5 ක් 6 ක් තිබෙනවා. මම නම් දෙන්නම් ඒ ටිකත් ගලවන්න. මට එතකොට පහසුවක් වෙනව කියලා". ඉන් පසු 2007 අයවැය ආව. ඒ අයවැයේ විවාදයේදී ඒ අයවැයේ තිබුණ අඩුපාඩු අපි පෙන්නුවා. හැබැයි අපි සභාවක් විදිහට ඒ අයවැය සම්මත කරල දුන්න. වීථි පහන් ගැලෙව්ව මන්ත්‍රීවරුන් වන අපට ප්‍රතිපාදන ලැබුනේ නෑ කියල අයවැය කිසිවිටකත් පරාජයට පත් කරන්න කටයුතු කලේ නෑ. ඒ කාලෙ සමාජ ජාලා ඔස්සෙ මඩගහන ක්‍රියාවලියක් තිබුණෙ නෑ. අදත් මේ මඩ ගහන්නෙ මන්ත්‍රීවරුන්ට නොවෙයි.

මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා එකවරක් කීව ෆේස්බුක් වලින් ගහපුදෙන් අපි හෘද සාක්ෂියට එකඟව වැඩ කරනවා නම් ඕවට උත්තර  දෙන්න අවශ්‍ය නෑ, ඒකෙ හරිවැරැද්ද හිතේ තියාගන්න කියලා. ගරු සභාවේ අවුරුදු 5 ක් හිටපු  සභාපතිතුමාල ජයතිලක මන්ත්‍රීතුමාල, අපි, චමින්ද මන්ත්‍රීතුමාල  එදා සභාවෙ හිටපු මහජන  නියෝජිතවරු අවුරුදු 5 ම ඇවිල්ල  2011 තමයි අලව්ව ප්‍රාදේශීය සභාව ලෙස දෙකට කඩන යෝජනාව ගෙනල්ල සභාවල් 2 ක් කරන්න කීවෙ. ඒ සම්බන්ධව අදහස් විමසීම  සදහා කුරුණෑගලට කැදෙව්ව වෙලාවෙ  සාකච්ඡාවෙදි අපේ සුමිත් කුමාර සභාපතිතුමා කීව සභාවල් 2 ක් කරන්න එපා . එක සභාවක් හොදටම ඇති  කියල ඊලගට තිබුණෙ මගේ අදහස් ගැනිම. මම කිව්ව ඒකකයක් කුඩා වෙන්න කුඩා වෙන්න ඒකට අවශ්‍ය සම්පත් ලබාදිල ඒ සභාවට පුළුවන් ආදායම් උත්පාදනය කරල නිර්මාණශීලිව සභා ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රශ්නවලට පිළියම සොයන්න. අපි කීව අනාධිමත් සභාවක් ලෙස මේකට විරුද්ධ නෑ අපි එකඟයි ඒ නිසා  සම්පත්, සභා  2 කටම  එක හා සමානව  බෙදල දෙන්න එතකොට සභා දෙකටම වැඩ කරගෙන යන්න පහසු වේවි කියලා. ඒ සාකච්ඡාවලින් පස්සෙ  ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකක් හැටියට වෙන් වෙලා ප්‍රාදේශීය සභා දෙකක් වෙන් වෙලා ඇවිල්ල තමයි අලව්ව ප්‍රාදේශීය සභාව ලෙස අලව්ව ස්ථාපිත වුනේ. සන්ධ්‍යා සභාපතිතුමයි මමයි දෙන්න යන්නෙ එක වාහනේ. මට මතකයි නාරම්මල රේස් බයි රේස්. එනකොට අපිට පුළුවන් කමක් ලැබුණ විරුද්ධ වෙන්න, ඒක වැරදියි කියන්න. එහෙම කරනකොට ගාමිණී ගුණදාස මහත්තයගෙ පුතා කිව්ව මේකට විරුද්ධ වෙන එකේ මූලිකත්වය ගන්න කියලා. අපි විරුද්ධ වුණා. අපි විරුද්ධ වුණ එකේ ප්‍රතිඵල ආවා.

ඒවගේම 74 වසරක  සාපයක් ගැන මේ සභාවෙ මන්ත්‍රිවරයෙක් කතා කලා. දැන් 1948 ඉදල මේ සාපයට  ප්‍රධාන පක්ෂ 2 වගකියන්න  ඕනෑ කීව. එතුමා ඒක කීම සම්බන්ධව  මගේ ගැටලුවක් නැහැ.  නමුත් මේ 74  වසරක් මේ රටේ පාලනය  කරපු  ප්‍රධාන පක්ෂ 2 ට අමතරව 1971 ප්‍රශ්නයක් ගැන විමසිල්ලෙන් බලනකොට මේ  පක්ෂ 3 ම එකතු වෙලා තමයි මේ රට විනාශ කරනවා නම් විනාශ කලේ කියල වගකීමෙන් කියනවා. මට ගිරිඋල්ලෙදි වෙඩි තිබ්බෙ, මට අලව්වෙදි වෙඩි තිබ්බෙ මම කාගෙවත්  වත්තක පොල්  හොරෙන් කඩල නෙවෙයි. මේ ප්‍රදේශයේ ගැබිනි කාන්තාවක් රෝහල් ගත කිරිම,  ගිරිඋල්ලෙ ඉදල අලව්ව පාරෙ එන බස් රථයකට එන්න අවස්ථාව ලබා දීපු එකට තමයි මට ජනතා විමුක්ති  පෙරමුණෙන් වෙඩි තිබ්බෙ. මම මේ කියන්නේ කෙටියෙන් ඒ නිසා රනිල් රාජපක්ෂ හවුල් ආණ්ඩුව මේ යන වැඩපිළිවෙලේ අඩුපාඩු තියනවානම් ඒ  ගැන රටේ ජනතාව  හොඳ තීරණයක් ගනියි. ඒ පිළිබඳව විවාදයක් නෑ.

නමුත් මේ රාජ්‍ය නායකයො සියලු දෙනා ම මේ රටට යම් සේවයක් සිදු කරපු අය. ලේ විලක් වෙච්ච රටක් මට භාර ගන්න සිද්ධ වුනෙ කියල රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිවරයා කීවා. පාර්ලිමේන්තුවේ හැන්සාඩ් එකක්. ආරක්ෂක ඇමති රන්ජන් විජේරත්න මැතිතුමා ගැන එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ හිටපු නායකතුමා කියපු හොඳ. ඔහු කොන්ද පණ තියෙන ආරක්ෂක ඇමති කෙනෙක් හැටියට නියෝග දුන්න සියළුම පක්ෂ විපක්ෂ භේදයක් නෑ හැම දේශපාලඥයෙකුටම එයාලගේ ජීවිත ආරක්ෂාව දේපල ආරක්ෂාව සලසන්න. මේ මහජන නියෝජිතයො ඊලග ඡන්දයෙන් ගෙදර යයි. නමුත් ජීවිත හානි, දේපල හානි කරන්න ඉඩතියන්න එපා. ට්‍රාන්ස්පෝමර කඩන්න, බස් ගිනි තියන්න, දුම්රිය ස්ථාන ගිනි තියන්න, සියල්ල පුච්චා ඉවර කරන්න පුළුවන් වුනත් නැවත ගොඩනගන්න පුළුවන් කියන සංකල්පය අපි කාටවත් නෑ. හැබැයි හැමෝම කියයි අපි තමයි හොඳටම කරේ කියලා. ඒ නිසා අපි කවුරු කවුරුත් එකතු වෙලා තමයි කරල තියෙන්නෙ. අපිට වැරදිච්ච තැන් තියෙනවා. මම අතුකෝරල මන්ත්‍රීතුමත් එක්ක හැම වෙලේම එකඟ වෙච්ච තැන් තියෙනවා. පක්ෂ දේශපාලනයෙන් අපි මේ පුටුවට එච්චම අපි වැඩ කරන්නෙ ප්‍රදේශයේ ජනතාවට මිසක් UNP කාරයටවත්, ශ්‍රී ලංකා කාරයටවත් නොවෙයි. පාරක් හැදුවනම්, අමුණක් හැදුවනම් , වැවක් බැන්දනම්, ලිඳක් බැන්දනම් ඒ බල ප්‍රදේශයේ ජනතාවගේ පහසුවට මිසක් එක් එක් පුද්ගලයන්ගෙ අවශ්‍යතාවයට නොවෙයි. ඊලග ඡන්දයෙදි ප්‍රාදේශීය සභාවට මම ආවත් එකයි නාවත් එකයි. මොකද මේ හෘද සාක්ෂියට එකඟව අපි වැරැද්දක් කරල නෑ. එහෙම වැරැද්දක් කරල යැපෙන්න අවශ්‍යතාවයක් නෑ. අපි යැපිලත් නෑ. මට මතක් වෙනව 2006 මට විරුද්ධව පෙත්සමක් ගහල පක්ෂ මූලස්ථානයට ගෙන්වල මට විනය පරීක්ෂණයක් තිබුණා වාහන පහක් හයක් පාවිච්චි කරල මම ඡන්ද වැඩ කලා කියල. ඒක ඇත්ත හේතුව ගෙදර වාහන 5ක් 6ක් තිබුණා. ඒක පාවිච්චි කලා. මේ ප්‍රාදේශීය සභාවට ඇවිල්ලාත් දැන් අවුරුදු 15 ක් වෙනවා. මේ මන්ත්‍රීවරු කව්රුත් දන්නවා දැන් එක වාහනයයි තියෙන්නේ. අවුරුදු 12 යි වාහනයක් පදින්න පුරුදු වෙනකොට. හැබැයි දැන් එක වාහනයයි තියෙන්නේ. ඒකත් බිරිඳගේ නමට තියෙන්නේ. නැත්නම් ඒකත් නෑ. ඒ නිසා විශේෂයෙන්ම කියන්න ඕනෑ එක දෙයයි තියෙන්නේ. මහජන නියෝජිතයෝ හැටියට මේ ප්‍රාදේශීය සභාව නියොජනය කරන අපි කිසි කෙනෙක් තමන්ගේ පෞද්ගලිකව තිබුණ එක රුපියල පවා නැති කර ගත්තා මිසක් ඇති කරගත්ත දෙයක් නෑ. මේක සභාවටත් පොදුයි. මේක සභාපතිතුමියටත් පොදුයි. මේ මහජන නියෝජිතයෝ හැටියට අපි කාටත් පොදුයි. තමන්ගේ ඉඩම විකුණලා, තමන්ගේ කුඹුර විකුණලා තමයි මේ දේශපාලනයට ආව ගොඩක් කට්ටිය කළේ. අපි මහජන නියෝජිතයෝ හැටියට ආවා, වැඩ කරනවා. රට ආර්ථික වශයෙන් වැටිලා නන්නත්තාර වෙලා ජනතාවගේ ජීවිතය සහමුලින්ම කඩාවැටීමට පත්වෙලා. මොකක්ද මේ රටේ ජනතාව ඉල්ලුවේ. අපිට පාසල් ටික ඇරලා දෙන්න, අපේ උතුම්ම ධනය දරුවන්ට උගන්නගන්න එක.

අද මේ රටේ ජනතාවට තෙල් ටික ගෑස් ටික ඇවිත් තියනවා නම්, පෝලිම් යුගය නතර වෙලා තියෙනවා නම් මේ රටේ වැදගත් සියලුම රාජ්‍ය නිලධාරීන් කියනවා නම් ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා කියනවනම් මට වැරදුනා මම අතුරලියේ රතනයි, වාසුදේවයි, වීරවංශයි දීපු ලුණු ටික කෑවා. ඒ කාලා මට දැන් වැරදිලා ඉවරයි. මගෙන් වෙච්ච වැරැද්දට සමාවෙන්න කියනවා නම්, ඔහු හොරකම් කරලා තියනවා නම්, වැරදි කරලා තියනවා නම් ඔහු සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ග ඔහු හිරේට යවනවා ද, ඔහුට දඬුවම් දෙනවද කියන එක මේ රටේ අධිකරණය ඉදිරියේ දී තීරණය කරයි. ඒක නතර කරන්න කාටවත් බෑ. ඒ නිසා විශේෂයෙන් කිව යුතු දෙයක් තියෙනවා. වැරැද්ද කළේ අපි කණ්ඩායම නම් ඒක නිවැරදි කිරීමේ වගකීම අපිට තියෙනවා. මේ සභාවේ සභාපතිවරයා පත් කිරීම සම්බන්ධව ඇති වුණ ගැටලුව සම්බන්ධව ඔබලා කටයුතු කරන ආකාරය සම්බන්ධව තීන්දු තීරණ ගැනීම ඔබේ වගකීම. එදා මට එවකට විරුද්ධ පක්ෂ නායක බාර දෙන්න එපා කියලා මට විරුද්ධව පෙත්සම් ගහලා එය විභාග කරලා ඒ සම්බන්ධව අවසාන තීරණය අරගෙන විරුද්ධ පක්ෂ නායකකමට මම පත් කරනකොට මට උපදේශයක් දුන්නා ඉහළින් කරු ජයසූරිය අමාත්‍යවරයා. මාසයක් යනකම් සභාවට ගිහිල්ලා

සභාවේ ඉගෙන ගන්න, කතා කරන්න යන්න එපා කියලා. මෙතුමිය සාක්ෂි දරයි මම කතා කලාද නැද්ද කියලා. මම කතා කළේ නෑ. මාස 6ක් 7ක් එක දිගට සභාවේ ඉඳගෙන හිටියා මේ ගහන ගේම බලන්න. මට රෝහණ දිණපූර්ණ මන්ත්‍රීතුමා හරියට සංග්‍රහ කළා ඒ කාලේ. උපදෙසක් දුන්නේ නෑ. අපේ මහජන නියෝජිතයෝ එහෙම නෑ. මොනවා හරි ප්‍රශ්නයක් තියනවනම් සුහදව කතා කරනවා. අපිට පක්ෂයක් කියලා භේදයක් නෑ. එදා එහෙමයි සැලකුවේ. හැබැයි සියලුම සැලකිලි මැද්දේ අපි නිහඬව අපේ ගමන ආවා. ඒ නිසා මම කියනවා ඔබට, වාහන අවභාවිතාව පිළිබඳ මේ සභාවේ කතා කළා. සභාවේ කැබ් රථය සභාපතිවරිය විදියට අරගෙන ගිහිල්ලා ඒක තලල පොඩිකරලා වැවට දැම්මනම් ඔබතුමිය පෞද්ගලිකව මේ වැරැද්ද බාරගන්න ඕන. එහෙම නැතුව ඔබතුමියලා කැඳවලා එතනදි ප්‍රශ්නයක් වෙලා ආවා නම් ඒ සම්බන්ධව වගකීම කැඳවපු අය බාරගන්න ඕන. අනිත් මිනිස්සු නෙවෙයි. විශේෂයෙන්ම මේ සභාවේ කැබ් රථය අවභාවිතා කිරීම පිළිබඳව මීට කලින් දවසක, එතකොට සන්ධ්‍යා කුමාර සභාපතිතුමා හිටියේ. එතුමාට දුරකථන ඇමතුමක් දීලා ඇහුවා ගරු සභාපතිතුමා දැන් කොහෙද ඉන්නේ කියලා. මම සභාවේ ඉන්නවා කීවා. මම කීවා මෙහෙම කාරණයක් තියනවා කියලා. එන්න කීවා මම විසඳලා දෙන්නම් කියලා. මම කිව්වා ඔබතුමාගේ කැබ් එක දැන් කොහෙද තියෙන්නෙ කියලා. එතුමා කතා නොකර තිබ්බා. සභාවේ කැබ් එක කොළඹ තිබුණා. ඔබතුමාලට මතක ඇති මම මේ සභාවේ ප්‍රශ්න කලා. හැන්සාඩ් එකේ ඇති. මම ප්‍රශ්න කලා විතරක් නොවෙයි, ලේකම්තුමිය ළඟට ගිහිල්ලා බැනලා ගියේ කවදාහරි මෙක කැරකිලා ආවම විගණනයට පිළිතුරු දෙන්න බලාගෙන ඉන්න. මහජන නියෝජිතයෙක් වෙලා මේ සභාවේ සභාවට ආවේ සභාවේ වාහනවලින් මේ සභා බල ප්‍රදේශයේ ජනතාවට වැඩ කරන්න මිසක් දේශපාලනය කරන්න නොවෙයි. කවුරු හරි නෑ කියනවා නම් මට ඔප්පු කරන්න සාධක තියෙනවා කරුණුත් එක්ක. ඒකයි මම කියන්නේ අපි දේශපාලනය කරලා සභාවට ආවේ මහජනතාවට වැඩ කරන්නයි. අපි දේශපාලනය කරද්දී මේ අයවැය සම්බන්ධයෙන් කතා කරනවා නම් මගේ විශ්වාසය අනුව ප්‍රාදේශීය සභා පනතට අනුකූලව අවුරුදු තුනක ප්‍රගතිය සියල්ල පරීක්ෂා කරලා තමයි මේ අයවැය සකස් කරලා මේ ගරු සභාවට ඉදිරිපත් කරලා තියෙන්නේ. මේ අයවැය සම්බන්ධව අදහස් යෝජනා සියල්ල එදා 23 වෙනිදා සියළු මන්ත්‍රිවරුන්ට ආරාධනා කරල පවත්වපු රැස්වීමේදී අපි දීලා තිබෙනවා. ඒ අපි ගෙනාපු සංශෝධන සියල්ල මෙහි ඇතුලත් කරල තියනවා එතකොට සභාවක අයවැයට පක්ෂයි නම් පක්ෂවත් විරුද්ධයි නම් ඒකට හේතු සාධක සහිතවයි විරුද්ධ විය යුත්තේ. මේ සභාවේ අයවැය හදනකොට මේ අයවැයේ වැරදි තියනවනම් කමිටුව රැස් කරපු වෙලේ අපි ලිඛිතව හා වාචිකව ඒකට අවශ්‍ය කරන කරුණු ඉදිරිපත් කළ යුතුයි. එහෙම නැත්නම් මේ රැස්වීම පවත්වන්න වැඩකරන දින 03 කට පෙර ලිඛිතව ඒ සංශෝධන ලබාදිය යුතුයි. එහෙම කිසිදු සංශෝධනයක් ලැබී නොමැති බව ඔබතුමිය මේ ගරු සභාව දැනුවත් කළා. ඒ අනුව මට පැහැදිලි වෙනවා මේ අයවැය සම්බන්ධව මට ගැටලුවක් නෑ. ආණ්ඩු පක්ෂයක් හැටියට ගත්තම ඔබලාට තියෙන්නේ පෞද්ගලිකව ඔබල කැඳවලා කණ්ඩායම් සාකච්ඡාවක් නොතියා කටයුතු නොකිරීම සම්බන්ධ ගැටළුවයි. පැහැදිලිව ඔබතුමාලා එක එක්කෙනා කරන්න ප්‍රකාශවලින් ඒ බව පැහැදිලි වෙනවා. ඒ නිසා ඒ සම්බන්ධව අපේ විරෝධතාවයක් නෑ. ඒක ඔබේ අයිතිය. අපේ වගකීම මේ අයවැය සම්මත කිරීම. මේ අයවැය සම්බන්ධව මට කියන්න තියෙන්නේ එක දෙයයි. මේ අය වැය කමිටු රැස්වීමේ අපි ඉඳගත්තා. මේකේ අඩුපාඩු පෙන්නුවා. අපි අදහස් දුන්නා. මේ සියල්ල කැටි කරලා හදපු අයවැයක් විදියට ඔබලා විරුද්ධ වෙන්න පුළුවන්. නමුත් ඡන්ද විමසන වෙලාවට ඡන්ද 5ක් වෙන්න පුළුවන්, 6 ක් වෙන්න පුළුවන්. මේ අයවැයේදී අපි තීරණය කරන්නේ මේ අයවැයට අපි උදව් කරනවාද නැද්ද කියන එක. මේ වෙන දේවල් සමාජ මාධ්‍ය ඔස්සේ හරි දාලා ඊළඟ ඡන්දෙට එන්න අපිට බැරිවෙයි. මේ කට්ටිය අපිට ගැහුවම අපිට බැරිවෙයි අපි නොකවුට් වෙනවා කියලා හිතනවා නම් එහෙම දෙයක් නෑ. අපි ඒවටත් මුහුණ දීලා තියෙන මිනිස්සු. ඒ නිසා මේ බල ප්‍රදේශයේ ජනතාවගේ ජන ජීවිතය සුඛිත මුදිත වීම සඳහා කසල ටික ඉවත් කරන තැන ඉඳලා මේ සභාවේ අපි ආදේශක ලෙස බඳවා ගත් දවසේ ඉඳලා තියෙන තියෙන ගැටළු ලබා දෙන තැන ඉඳලා විශාල වැඩ කොටසක් තිබෙන ආයතනයක්. රජය එවපු චක්‍රලේඛ වලට මුවා වෙලා ඒ චක්‍රලේඛ

නිසා අපිට වැඩ කරන්න බෑ කියලා නීති රීති තිබුණා නම් ඒ නීති ඒ රීති වලින් ඔබ්බට ගිය ක්‍රමවේදයක් හදන්න මිසක් මේක ආපස්සට හැරෙන එක නෙමෙයි. අපිට පෞරුෂත්වයක් තියෙන්න ඕන. කොන්දක් තියෙන්න ඕන. අපි තීන්දු ගන්න කොට හරියට තීන්දු තීරණ ගන්න ඕනෑ කියන එක විශේෂයෙන් මේ සභාවට මතක් කරමින් මේ සභාවට ඉදිරිපත් කරලා තියෙන අයවැය කවුරු සභාපති හැටියට ඉදිරිපත් කරත් ඒ සභා අයවැයට පක්ෂව යෝජනා දීලා නම් ඒ යෝජනා ඇතුළත් කරලා නැත්නම් අපට පුළුවන් අපි දීපු යෝජනා ඇතුළත් කරලා නෑ සභාපතිවරයා ඇතුළු කාර්ය මණ්ඩලය පිළි අරගෙන නෑ ඒ නිසයි මේ අයවැයට විරුද්ධ වෙන්නේ කියල මගේ ඉල්ලීම් මේ සභාවේ සභාගත කරලා දෙන්න කියලා. මම දීපු යෝජනා ඇතුළත් වෙලා තියෙනවා. මේ අවුරුද්දට කිසිම දෙයක් කෙරුනේ නෑ කියන එකත් අපේ කොන්ද පණ නැති කමක් නොවේ. කාර්මික නිලධාරීතුමා එක්ක ගිහිල්ලා ස්ථානීය පරීක්ෂාවක් කරලා ඇස්තමේන්තු හැදුවම ප්‍රියන්ත මැතිතුමාගෙයි මගෙයි මට මතක හැටියට එකම දිනයේ සිමෙන්ති කොට්ටේ රුපියල් 975, 1300, 1600, 2000, 2100 වෙලා තියෙනවා. පළාත් සභාවේ ඉන්න ඉංජිනේරුවන්ගෙන් අපි ඉල්ලීමක් කලත් ඔවුන් කීවේ අපිට කරන්න දෙයක් නෑ ඇස්තමේන්තුවක් හදන්න වැඩි උන සිමෙන්ති මිලට අපට එහෙන් අනුමැතියක් දෙන්න කියලා. මොකද උනේ අඩි 100ක් දාන්න හිටියනම් ලක්ෂ 03 න් ඒක අඩි 10ක්වත් දාන්න බැරි උනා. එතන තමා මේ දේ සිද්ද වුනේ. ඒ නිසා මම මෙතන ඉන්න කාර්මික නිලධාරිටවත් කාර්ය මණ්ඩලයටවත් දොස් කියන්නේ නෑ. මේ අයවැය සම්බන්ධව හෘදසාක්ෂියට එකඟව තීරණය කරනවා නම් මේ සභාවේ කවුරු හෝ සභාපති විදිහට පත්වෙලා මේ ඇතිවෙච්ච දුර්භික්ෂය, මේ අනතුර, මේ අභාග්‍යසම්පන්න කාලපරාසය තුළ මම විශ්වාස කරනවා ලබන අවුරුද්දේ ජනවාරි, පෙබරවාරි වෙනකොට මේ සභාවේ කාලේ ඉවර වෙනවා. ඒ කාලය තුළ කරන්න අපේක්ෂිත වැඩපිළිවෙළ සකස් කිරීමට මේ අයවැය සම්බන්ධව මගෙ සහයෝගය ලබාදෙන බව ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ අයවැය ගැන හා සභාවේ ඉදිරි වැඩපිළිවෙළ ගැන ඉතාම ගැටලුකාරී තත්වයක් තියෙනවා. මොකද අපි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් ඉදිරිපත් වෙලා ප්‍රදේශයේ ජනතාවට වැඩ කරන්න ජනමතයෙන් පත් කළේ අපි ගැන විශ්වාසය තියලා. අපේ ප්‍රදේශයේ හතර දෙනෙක් ඒකට ඡන්දෙ ඉල්ලුවා. හතර දෙනාගෙන් මට තමයි වැඩිම මනාප ගණනක් ලැබුනේ. මේ මනාප ප්‍රමාණයක් ලැබුනේ විශ්වාසයත් එක්ක. මම සභාවට ඇවිල්ලා කටයුතු කරනකොට මගේ ප්‍රදේශයේ මම වෙනත් සභාපතිවරු යටතේ මේ ධූර කාලයේ සිටියේ නෑ. හොඳට වැඩ කළා. ඒ වැඩ කරලා මේ අවුරුද්දෙත් ගිය අවුරුද්දෙත් මම ඉතාම අපහසුතාවයට පත්වුණා. පාරේ බැහැල යන්න බැරි තත්ත්වයට මම පත් වුණා. අපේ ප්‍රදේශයේ යම් පුද්ගලයෝ වැඩ කරනවා. අරුණ මන්ත්‍රීතුමා කීවා වගේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු මම නැතුව හරි කමක් නෑ. අපේ ජනතා විමුක්ති පෙරමුණේ නන්දසිරි මන්ත්‍රීතුමා හරි කමක් නෑ. එයාට දුන්නෙත් නෑ, මට දුන්නෙත් නෑ. වෙන අය වැඩ කරනවා. ඒ වැඩ කරද්දි දෙමව්පියෝ අහනවා දැන් මන්ත්‍රීතුමා මෙයාද කියලා. සභාවේ වාහනයක් ඇවිල්ලා මෝටර් ග්‍රේඩරය දාලා තියනවා, JCB දාලා තියෙනවා, තණකොළ කපනවා. මේවා කරනකොට ගමේ ප්‍රධානම තැන. අපි ඡන්දය දාන්න යන්නෙත් එතැනට. එතැන වැඩ කරනකොට ජනතාව අහනවා ඇවිල්ලා දැන් මෙයාද මන්ත්‍රී කියලා. අර පුද්ගලයා කියනවා එතකොට ඔයාලට බැරි වැඩ අපි කෙරුවා කියලා. මම ලිපි දීලා තියෙනවා. ලේකම්තුමිය දන්නවා. ඉඹුල්ගොඩටත්, උඩගන්කන්දට ලිපි 4ක් 5 කුත් දීලා තිබෙනවා. ප්‍රදේශයේ ජනතාව ලිපි දීලා තියෙනවා. අග්බෝවේ ඔය කටයුතු කරන්නත් මම ලියුම් දීලා තියෙනවා. මට කිසිම දෙයක් සිදුවුණේ නැහැ. මම අහකට විසි කරලා වෙනත් අයට තමයි ඔය කටයුතු කළේ. අපි අද වෙනකොට ඉතාම අසීරු තත්ත්වයට පත්වෙලා. අවසානය අර හතර දෙනෙක් එක්ක ඡන්දයයි ඉල්ලලා ජනමතයෙන් ආපු මට ගමේ මිනිස්සු දැන් ගණන් ගන්නෙවත් නැතුව ගියා. ඒ වගේ වැඩ මම හිතන්නේ මම සාධාරණ ද කියන්න මම හිතන්නේ නෑ. ඒ කටයුතු එක්ක මේ සභාවේදීත් දැන් කියවුනා. මේ සභාවේ වාහනයක් පාවිච්චි කලානම් පුද්ගලයෙක්, ඒ

වාහනය පාවිච්චි කළේ මොකටද කියලා දන්නවා ඇති. එදා මේ සභාව පොදුජන පෙරමුණෙන් පටන් ගත්ත දා ඉඳන් ඒකෙ තිබ්බෙ විශාල අර්බුදයක්. අර්බුදයට විසඳුම් හොයන්න කවුරු හෝ ගියා නම් කොළඹට වෙනත් කාරණයකට ගියේ නෑ. උප සභාපතිතුමා ලෙස පත් වෙනකොට ඕවට තමා කොළඹට ගියේ. වෙන කාරණයකට ගියේ නෑ සභාවේ වාහන අරගෙන. ඒක තමයි ඇත්ත කාරණය. තව එකක් තමයි අපේ කවුරු මොනවා කීවත් අපි මේ සභාවේ මන්ත්‍රීවරු හැටියට ආණ්ඩු පක්ෂය 15 දෙනා එකට සාකච්ඡා කරනවා අපි ආණ්ඩු පක්ෂේ සංවිධායකවරයා එක්ක. ඒවා වුණේ නෑ. එතුමන් දෙපළ අතර ගැටලුවක් ඇති. හැබැයි ඡන්දය ඉල්ලලා ආපු අපිට තමයි ගැටලුව වෙන්නේ. ඒ ගැටලුව එන්නේ ප්‍රදේශයේ මිනිස්සුන්ට. මම දීර්ඝ වශයෙන් කතා කරන් නෑ. මේ සකස් කරලා තියෙන අයවැය 2022 මට අයවැයෙන් වෙන් කරපු මුදල් මට සත පහක්වත් හම්බුනේ නැත්නම් 2020 ත් 2021 ත් මුලින්ම වැඩකලේ මම විතරයි. 2022 රුපියලක්වත් මට ලැබුණේ නැහැ. ඒ නිසා මම මේ 2023 අයවැයට මම විරුද්ධයි කියලා ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, විශේෂයෙන්ම 2023 අයවැය විවාදයට පෙර විවාදයට අදාළ නොවන කාරණා කතා කිරීම සම්බන්ධව පළමුව කණගාටු වෙනවා. දැන් මේ විවාදය මොකක්ද. මේ විවාදය තමයි අයවැය ලේඛනය සම්බන්ධව දෝෂ දර්ශන තියනවනම් අපි ඉදිරිපත් කරලා විවාද කරනවා. දැන් මේ අඩුපාඩු සම්බන්ධයෙන් නොවෙයි වාද කරන්නේ. ආණ්ඩු පක්ෂෙන් පක්ෂවල කතාකළ යුතු දේවල් තවත් පක්ෂ වල පුද්ගලික කාරණා ඒ ඒ මතවාදත් එක්ක නායකයෙකු ගන්න ඕනෑ විරුද්ධ වෙන්න ඕන තීන්දු එහෙම මේ ප්‍රාදේශීය සභා පනතේ රීතිවල කොහෙවත් පෙන්නලා නෑ. මේකේ මන්ත්‍රීවරයෙකුට ප්‍රාදේශීය සභාවේ මේ අයවැයට විරුද්ධ වෙනවා නම් සංශෝධන ඉදිරිපත් කරන්න කාලයක් දීලා තිබුණා. ඒ සංශෝධන ඉදිරිපත් කරලා ඒවා සඳහන් වෙලා නැත්නම් මන්ත්‍රීවරයාට පුළුවන් ඒ කෙටුම්පතට විරුද්ධ වෙන්න. තමන් ඉදිරිපත් කරපු සංශෝධන ඉදිරිපත් කරලා නෑ කියලා. එහෙම නෙමෙයි කියන්නේ. මේ රීති අළුතෙන් සම්මත කරලා අලුතෙන් සම්බන්ධ කරලා ආණ්ඩුකාරවරයා විසින් අලුතෙන් ස්ථාපිත කරලා පොදුජන පෙරමුණේ සභාපතිවරු ගණනාවක් ගෙදර යයි කියලා බයට ආණ්ඩුකාරවරයාගේ තියෙන බලතල පාවිච්චි කරලා අලුතෙන් හදපු රීති ඇතුලේ හදපු කාරණයක්. ඒ නිසා මේ මන්ත්‍රීවරුන් මොන ආකාරයේ විරෝධතා ගොනු කරනවා ද දන්නෙ නෑ. ඒක අයිතියක්. මේ මන්ත්‍රිතුමාලගේ ඒ ඉන්න කාරණාව සම්බන්ධව ඒ වගේම ප්‍රාදේශීය සභාව අපි ඉල්ලලා අපි දේශපාලනය ඉදිරියේ මැතිවරණයක් පෙන්නුම් කරලා අපිට තීන්දු තීරණ ගන්න බෑ. ඒ විදිහට ආයෙ ප්‍රාදේශීය සභාවේ ඡන්දය ඉල්ලන්න බලාපොරොත්තු වෙනවා නම්. මොකද ඔබතුමිය තරහ කරගෙන ගෙදර යවන්න පුළුවන් නම් ඔබතුමියට ගහනවා. ඒකෙ දෙකක් නෑ. ඔබතුමියට ගහලා ඔබතුමිය පුටුවෙ තියාගෙන මේ ප්‍රාදේශීය සභාවේ මොනවත් අපිට කරන්න බලාපොරොත්තුවක් නෑ. පැහැදිලිවම චෝදනාවක් ආවා කීප තැනකින්ම කොටසකට සලකනවා කියලා. මම හිතන්නෑ මේ මහජන නියෝජිතයෝ මං බලාගෙන යන්නම් මෙතන ඉඳලා අතෙන්ට එක මන්ත්‍රීවරයෙක්වත් තම ඡන්දය නැති කරගෙන නෑ. මේ මන්ත්‍රීවරු මම දන්නවා ඒ මුහුණ දිහා බලලා අපිට කියන්න පුළුවන්. ඒ හින්ද තව එකක් තමයි මේ එක්කෙනෙක්ටවත් වැඩි ප්‍රතිපාදන දීලා නෑ. මේ සභාවේ මේ ප්‍රාදේශීය සභාවට මම ආපු දා ඉඳලාම මම මේකේ කියන්නේ අයවැයට අදාල නැති උනත් එක දවසක් ධර්මරත්න හේරත් උප සභාපතිතුමාට වීදි පහන් හදන්න දිනයක් ලබා දුන්නා. හැබැයි එතුමාට උදේ වරුව හදලා දීලා දවල් 1 වෙනකම් අපේ උප සභාපතිතුමාගේ වීදි පහන් එකක්ද කොහෙද හදලා තිබුනේ. වීදි පහන් හදන අය මට කතා කරලා කිව්වා චමින්ද මන්ත්‍රීතුමා අපි මෙතන රැඳිලා ඉන්නවා. ඔයාගේ වීදි පහන් හදන්න තියෙනවද, මම කිව්වා උප සභාපතිතුමාගේ වීදි පහන් හදලා ඉවරද, එකක් තියෙනවා ඒක හැදුවා. අපි මේ ගොඩක් වෙලා බලාගෙන හිටියෙ ඔබතුමාට හදලා දෙන්නම් කියලා. අන්න එදා විතරයි වීදි පහන් හැදුවේ. ප්‍රාදේශීය සභාවේ මෙතෙක් ආපු දා ඉඳලා මන්ත්‍රී ප්‍රතිපාදන ගත්තම රුපියල් ලක්ෂයක් මම අරගෙන තිබෙනවා. ඒ ඇර මේ සභාවේ සභාපතිතුමියගේ වුවත් වෙනත් ප්‍රතිපාදනයක් මම

අරගෙන නෑ. බොරු කතා සමාජගත කරන්න එපා. ඒ නිසා අර වාර්තාව ගෙනාවනම් එක කියවලා බලන්න. තවත් මට මේ යෝජනාව දාලා තවත් ලක්ෂයක් හරි විදියට නම් එදා ඉඳලා මන්ත්‍රී ප්‍රතිපාදනවල මට ඉස්සරහට ඉස්සරහට ගෙනල්ලා තව ලක්ෂයක් ගන්න පුළුවන්. ගණන් හදලා බලන්න. එහෙම නෙවෙයි. ඒ ප්‍රතිපාදන වම්න්ද මන්ත්‍රීතුමාට දෙන්න එපා කියලා කියනවා නම් ඒකේ ප්‍රශ්නෙකුත් නෑ. අපි දේශපාලනය කරන්නේ ඒ මත ඉඳගෙන නොවේ. හැබැයි මම තමුන්නාන්සේලාට කියන්නේ මම කරුණු ටිකක් හොයා ගත්තා මේ අයවැය සම්බන්ධයෙන්. හොයා ගත්තම අපට මේවගේ තිබෙන කරුණු කාරණා එක්ක මේ අයවැයට විරුද්ධ වීම සම්බන්ධවත් කාරණා තිබෙනවා. අමාත්‍යවරයාට විනය ක්‍රියාමාර්ගයක් ගන්න. හැබැයි මේ විරුද්ධ වීම සම්බන්ධව විනය ක්‍රියාමාර්ගයක් ගන්නවා කියන එක වැරදියට උපකල්පනය කරන්න එපා. අයිතිය තියනවා. හැබැයි අපි ක්‍රමවේදයක් ඇතිව ගෙනාවේ නැත්නම් ඒ ක්‍රමය විදියට ඇවිල්ලා දැනගත්තා නම් අපිට විරුද්ධව විනය ක්‍රියාමාර්ගයක් ගන්න අයිතිය තියෙනවා. වැරදිලාවත් පටලගන්න එපා. ඒ නිසා අලව්ව ප්‍රාදේශීය සභාවේ මේ අයවැය සම්බන්ධ මට හැමදාම ප්‍රශ්නයක් තියෙනවා. මේක දිළිඳු සභාවක් කියලා කියනවා. ගරු සභාපතිතුමිය, ලේකම්තුමිය ඇතුළු මේ අයවැය හදන කාර්ය මණ්ඩලය අපරිමිත කැපවීමෙන් මේක කරනවා. ඔයගොල්ලෝ විවේචනය කරන එකක් නෙමෙයි මම මේ කියන්නේ. මට හැමදාම මේක සම්බන්ධව විවේචනයක් තියනවා. මම මේ සභාවට ආපු දා ඉඳලා මොකක්ද මේ අපේ ආදායම් උත්පාදනය කරලා අපි දිළිඳු සභාවක් කියලා කියන්නැතුව අපි පෝසත් වෙච්ච සභාවක් කියලා ගන්න වැඩපිළිවෙළ මේකෙ කවදාවත් නෑ. ඒක එන්න ඕනෑ. ඔක ආවොත් තමයි මේ මන්ත්‍රීවරුන්ට මුදල් ප්‍රතිපාදන ලැබිලා මේ කටයුතු කරන්න පුළුවන් සාර්ථක සභාවක් කියලා කියන්න පුලුවන්. සමහර විට මේක කරන්නෑ. කවුරු හරි හිතනවා ඇති මම අවුරුදු දෙකයි නේ ඉන්නේ.මේවා හදලා ඊළඟට මේක දෙන්නේ.මගේ අවුරුදු පහ ඇතුලේ මම මේක හැදුවට ඊළඟට එන කෙනාගේ මේක වැඩ කරන්නේ. එතකොට මගේ නම කියවෙන්නෙ නෑ නේ කියලා හිතෙනවා ඇති. පැහැදිලි ඇත්ත. ඒ වුණාට මේ ආදායම් උත්පාදනය කරන දීර්ඝ අවුරුදු 5ක 6ක සැලැස්ම අවශ්‍යයි අලව්ව ප්‍රාදේශීය සභාව යම් තත්වයකට ගේන්න. අර සභාව දියුණු වුනා, මේ අපිට සභාව අපි එකට ඉඳලා දිළිඳු වෙලා තිබෙනවා. එහෙම මතවාද තිබුණා අපිට. සන්ධ්‍යා සභාපතිතුමාගේ කාලේ අපි විවාද කළා මේ බෙදෙන්නේ අසාධාරණ විදිහට කියලා. සන්ධ්‍යා සභාපතිතුමාට වැඩිය දක්ෂ වුණත් ක්‍රියාශීලි බවකින් එතුමා ඒවා ගන්න උපායශීලී වුණා. අපේ මෝටර් ග්‍රේඩරය ඉල්ලුවා. අළුතින් ස්ථාපිත වුණේ නාරම්මල ප්‍රාදේශීය සභාව. තිබ්බ සභාව අලව්ව ප්‍රාදේශීය සභාව. හැබැයි වත්කම් අපිට ආවේ අඩුවෙන්. ඒ ගොල්ලන්ට වැඩියෙන් ගියා. අපි කතා කළා ඒවා අපට ඕනෑ වත්කම් කියලා.ඒ නිසා අපි ඒ තත්වයට ආවා සභා බෙදීමක් එක්ක. අපට ඕනෑ මේක ස්ථාපිත කරගන්න. එතකොට අපි ප්‍රාදේශීය සභා පනත අනුව නිත්‍යානුකූලව විරුද්ධ වීමේ අයිතියක් අපට තියෙනවා. මේ සභාපතිතුමියගේ අයවැයට පක්ෂව කටයුතු කරනවා. ඒ වගේම ඒකට අවශ්‍ය සහයෝගය දෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමියනි තව පොඩි කාරණාවක් මතක් කරලා දෙන්නම්. දැන් අවුරුදු 74 ක ශාපයක් ගැන අජිත් මන්ත්‍රිතුමා කතා කලා. නම කිවුවට සමාවෙන්න. මේ අවුරුදු හැත්තෑ හතරක් ඇතුලේ මේ පාලනය කරපු මිනිස්සු මොනවත් කරල නැද්ද. දැන් මේ කතා කරන විදියට රෝහල් එදාට වඩා දියුණු වෙලා නෑ. මහා මාර්ග පද්ධතිය එදාට වඩා දියුණු වෙලා නෑ. පොල හැදිලා නෑ. අධ්‍යාපන ක්ෂේත්‍රය, ජංගම දුරකථන, වාහන ඒවා දියුණු වෙලා නෑ. මේ කියන හැටියට තාම වැද්දෝ වගේ ඉන්නේ. හැම ආණ්ඩුවක්ම යම් යම් ක්‍රියාමාර්ග ගත්තා. ගොඩනැගිලි හැදුවා. දැන් මේ මොනවද අපේක්ෂා කරන්නේ තම වගකීමෙන් කියන්න ඕනෑ එදා ඉඳලා අද මිනිස්සු කතා කරන මාතෘකාවක් තියෙනවා. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය එදා ගත්ත ඒ තීන්දුව ක්‍රියාත්මක කළා නම් අපි අද හිඟමන් යදින්නේ නෑ. අපේ රටේ සියලු දේ අපි හදන්න ඕනෑ කියන තීන්දුවට ආවා. ආයතනයක් 72 ක් ස්ථාපිත කෙරුවා දේශීය ආර්ථිකය ඉහලට එන්න. ඒ විතරක් නොවෙයි. සපුගස්කන්ද තෙල් පිරිපහදුව හදලා දෙන්න බොරතෙල් ගේන්න නැවකුත් ගත්තා. එතුමිය ඒ තරමට දූරදර්ශීව දැක්කා. ඒ දැකපු නායිකාවට ගැහුවා ජනතාව ආසන 8 න් යන්න. ඒ 8න් ගහන්න කවුද දායක වුණේ. ජනතා විමුක්ති පෙරමුණ. එදා මේ රට ආපස්සට ගෙනිච්චා අවුරුදු

50 ක්. අපේ මානව සම්පත, උගත් බුද්ධිමත් ජනතාව 15000 ක් මැරුවා. හැබැයි කැරැල්ල මර්දනය කරන්න 1989 ට එනවා. වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරගෙන යනකොට දේශපාලනික වශයෙන් අරාජික තත්වයක් නිර්මාණය වෙනකොට ඒක ප්‍රයෝජනයට අරගෙන 65000 ක් මරන මංචකයට ගෙනියනවා. අපි පටන් ගත්තෙ නැහැ කියලා කියයි. ඒකට හවුල් ජනතා විමුක්ති පෙරමුණ. රේල්පාරේ මධු වැල් තිබ්බා. පොරමඩල මොරවලපිටිය මාර්ගයේ එක බස් එකයි තිබ්බේ. එක ගිනි තිබ්බා. ඒක පිච්චිලා අලු වෙලා ගියා. ඉස්කෝලේ වැහුවා මාස හයක්. ඊට පස්සේ ඉස්කෝලේ ඇරලා 3 වෙනකම් අනුර බණ්ඩාරනායක මහතා අධ්‍යාපන ඇමැති හැටියට හිටපු කාලේ ඉස්කෝලේ තිබ්බා මගහැරුණු පාඩම් උගන්වන්න. අද 89 ට පස්සේ ඉපදුණ අය ඉතිහාසය දන්නේ නැහැ. ඒ හින්දා ආණ්ඩුවේ මේ පාර යම් ප්‍රශ්නයක් මතුවුණා. ආර්ථික අර්බුදයක් ආවා. ඒක පාවිච්චි කරලා බලය ලබා ගැනීම සඳහා යම් වැඩපිළිවෙළක් ගියා. කුමන්ත්‍රණයක්. ඒ ආණ්ඩුව අල්ලන්න. ඡන්දෙන් අල්ලන්න බැරි හින්දා. දැන් මේ ජනතා විමුක්ති පෙරමුණ හිතන් ඉන්නවනේ සමස්ත ජනතාව ආණ්ඩු කෙරුවේ නෑ කියලා. ජනතා විමුක්ති පෙරමුණත් මේ රටේ ආණ්ඩු කරලා තියෙන්නේ. අපි කෙරුවෙ නෑ කියන්න බෑ. තිස්සමහාරාමය ගත්තා. දැන් එක මන්ත්‍රී කෙනෙක්වත් නෑ. එදායින් පස්සෙ තිස්සමහාරාමයට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් ප්‍රාදේශීය සභාවේ බලය ගත්තා. එදා ඉඳන් ඉවරයි. ඔය රට සුබිත මුදිත කරනවා නම් තියෙන්න එපැයි. තිස්සමහාරාමයේ ඕන් තත්වේ. මේ තමයි ඇත්ත. 2005 මහින්ද රාජපක්ෂ මැතිතුමාව ගේන්න සියලු වැඩ කටයුතු කළේ ජනතා විමුක්ති පෙරමුණ. පරණ ෆේස්බුක් පොටෝ අරගෙන බලන්න. මහින්දව ඉස්සරෝම බලයට ගේන පිළිවෙළේ ඉන්නේ අනුර කුමාර දිසානායක, විමල් වීරවංශලා ඔය කණ්ඩායම. හැමදාම නායකයෙක් ගෙනල්ලා උඩින් තියෙනවා. මෛත්‍රීපාල සිරිසේන බලන්න. අර කඩෙන් බඩු ගන්න එපා. මේ කඩෙන් බඩු ගන්න එපා. අරක තමා හොඳ. මේක තමා හොඳ කියලා කියනවා. මාස හයයි හිටියේ. කාටවත් යන්න බෑ. ඒ වැඩපිළිවෙලේ ඉන්න කිසි මිනිහෙකුට මේ රට කරන්න දෙන්නෑ. ඒ විතරක් නෙවෙයි. මේ රටේ මහාචාර්යවරුන් මැරුණු සංඛ්‍යාව ගණන් හදලා බලන්න. මේ රට අවුරුදු 150ක් පස්සට ගිහින් තියෙන්නේ දැන් ඇවිල්ලා මහ ලොකුවට කතාකරනවා. ඔයිට වැඩිය රැල්ලක් තිබ්බා 2005 මැතිවරණය එනකොට. හැමතිස්සෙම ජේවීපී තුන්දෙනා 1, 2, 3 ඇවිල්ලා තමයි මැති ඇමැතිකම් ගත්තේ. අරගෙන මේ පාලන තන්ත්‍රයට එකතුවුණා. එකතුවෙලා කැබිනට් එකේ හා කියනවා. එළියට ඇවිල්ල කියනවා බැහැ කියලා. ඔන්න දේශපාලනය. මේ ඇත්ත කියන්නේ. අපේ රටේ මිනිස්සුන්ගේ ලොකු දුර්වලතාවයක් තියෙනවා. ඉක්මනින් අමතක වෙනවා. ඒ අමතක වෙන හින්දා මේ ගොල්ලෝ ඒක පාවිච්චි කරනවා. ඉතිහාසය මතක නම් මේවා ගොඩක් නිවැරදි වෙලා නෑ. ඔයිට වැඩිය ජන රැලි මතුවුනා. ඡන්දෙට ගියාම ප්‍රතිශතයක් විදියට නෑ. ඔය රැල්ල තියනවා. තව අවුරුදු දෙකක් ගිහිල්ලා 2025 මහා මැතිවරණයට මුහුන දෙනකොට 3% යි. ඒ නිසා මිනිස්සු පීඩාවට පත් වෙනකොට ආගම දහම ගැන හිතනවා. දැන් කල්පනා කරලා බලන්න අපි කනකොට කිසි මිනිහෙක් අත්අඩංගුවට ගන්නෑ. අර ජේන්නැද්ද විශ්ව විද්‍යාලයේ දරුවන්ට එලවා එලවා ගහනවා මාරාන්තික විදිහට. මේකද මේ සමාජවාදය. ඒ හින්දා වැඩිදුර කතා කරන්න ගියොත් අපිටත් කතා කරන්න වෙනවා. අපි බෞතිස්ම වෙලා ඉන්නේ. අපි කිසිම වරදක් කරලා නෑ. නිවැරදි මිනිස්සු. ඕවා කිය කිය මේක කරන්න බෑ. අපිත් නිහඬව හිටියා නම් හොඳයි. අපි තමා සියල්ලම දන්නේ කියලා හිතාගෙන අර පන්ති පහේ ඔබන ඔක්කොම හිර කරගෙන තව ටික දවසකින් මානසික රෝගීන් වෙනවා ඕවා හිත හිත ඉඳලා. සැලැස්මක් තියෙනවද. සිස්ටම් එක මාරු කරමු කියලා වැඩපිළිවෙළක් කියනවද රට ගොඩනගන්න කියලා. මම එදා දැක්කා අර "විසඳුම" කියලා කොළයක් බෙද බෙද යනවා. ඒ කොළයේ තියෙන්නෙ මානව හිතවාදී පාලනයක් කියලා. ඕන් විසඳුම. අර "විසඳුම" කියවලා බලන්න. ඒක අවසානයේ තියෙන්නේ මානව හිතවාදී ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් කියලා. මේ පුහු ආටෝප ආකල්ප ගෙනල්ල අද අහිංසක අර කොල්ලෝ අහිංසක අම්මා තාත්තා, මේ නඩුවලට පැටලිලා අවුරුදු පහළොවක් විතර නඩු යනවා. ඒවා ඔප්පු වෙනවා. ඔප්පු වෙනකොට ඒ මිනිස්සු අවුරුදු හතක් අටක් හිරේ යනවා. ඒ ගියාම අවුරුදු 20 කොල්ලට අවුරුදු 40 ක් විතර ගිහින්. මේවා අයින් කරගන්න ඕනෑ. මම එදා ශාන්ත බණ්ඩාර මහත්තයාට කිව්වා මේවා කැන්සල් කරගන්න.

මෙයාලව එළියට දාන්න කියලා. එතුමා කීවා මම කොහොමද එහෙම කරන්නේ. රාජ්‍ය දේපල වාහන ඔක්කොම ගිනි තියලා තියෙද්දිත්. අපි එහෙම කතා කරන්න පුළුවන්. ඒත් ඒ ප්‍රශ්න ටික එතනින් ඉවරයි. ඒ අම්මා තාත්තාගේ බඩ පපුව පිච්චෙන්නේ. මොනවද මේ ගිහිල්ලා කරන්නේ. මේවා කියලා යනකොට මටත් ගහන්න සෙට් වෙයි. එහෙමනේ. ඊළඟ පාර රැල්ලක් යනකොට සංවිධානය වෙයි චමින්දයා තියලා බෑ පුච්චලාම දාන්න ඕනේ කියලා. අපිටත් ප්‍රජාතාන්ත්‍රික රටක අයිතියක් තියෙනවා අපේ මතවාදය කියන්න. ඒ මතවාදය අපි කියනවා. ඒක කියන්න ඕනෑ. මේ අයවැය රීති සම්බන්ධව මම ලියන් ආවා ලිපියක්. එක සභාගත කරන්න ඕනෑ. මම කියවන්නම්. ඒ සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ගේ විශේෂ අවධානය යොමුකරනවා.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 168 වගන්තියෙ බොහොම පැහැදිලිව මෙන්න මෙහෙම සදහන් කරල තියනවා.

> **සෑම ප්‍රාදේශීය සභාවකම සභාපතිවරයා විසින් එක් එක් වර්ෂයකදී රීතිවලින් නියම කර ඇති දිනකයකදී හෝ ඊට පෙර ඊළග වර්ෂය සදහා වූ අයවැය ලේඛනයක් ඒ ඉදිරි වර්ෂයේදී ලබාගතහැකි ආදායම සහ යෝජිත වියදම පිළිබද විස්තර ඇතුලත් කොට පිලියල කොට ප්‍රාදේශීය සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.**
>
> **ඒ අයවැය ලේඛනය අදාළ වන වර්ෂය ආරම්භ වීමට පෙර සෑම ප්‍රාදේශීය සභාවක් විසින්ම එහි යම් සංශෝධන කිසිවක් තිබේනම් ඒවාද සමග අවසාන වශයෙන් සැලකිල්ලට භාජනය කොට සම්මත කරනු ලැබිය යුතුය.**

මේ අයවැය සම්බන්ධයෙන් සංශෝධන ඉදිරිපත් කරන්න ගරු සභාපතිතුමිය ඕනෑ තරම් අවස්ථාව අපිට ලබාදීල තිබුණා. සභාපතිතුමිය සදහන් කළා එබදු සංශෝධන කිසිවක් නොමැති බව. එසේනම් මේ සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් ලෙස මගේ වගකිමක් සංශෝධන තියනවනම් ඉදිරිපත් කරන්නත් එසේ නොමැතිනම් මේ අයවැය සම්මත කිරීමත්. ඒ නිසා මම මේ අයවැයට පක්ෂයි. අපේ සහයෝගය දෙනවා. ඒ දෙන්නෙ දේශපාලනික වශයෙන් ඉදිරියේදී පවතින කාරණාත් එක්ක සහ මේ අයවැය ට විරුද්ධ නොවෙන්නෙ මම දන්න කරුණුත් අනුව, මේ අයවැය ට විරුද්ධ වීමේ අයිතියක් මම දන්න විදිහට මන්ත්‍රීවරයෙක් විදිහට මට නෑ.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමා මට ප්‍රශ්නයක් අහන්න තියෙනවා. නැත්නම් මම දෙවන වතාවට නැගිටින්නේ නෑ. ධර්මරත්න උපසභාපතිතුමා කියලා කිව්වා. මේ වීදි ලාම්පු දාලා තියෙන ක්‍රමය අනුව මම කැමති නෑ. මට ඒක ගැලපෙන්නෙ නෑ. ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරයෙක් විදියට මට අවස්ථාව දුන්නා නම් ඒක හදන්න ඕනෑ. මම කවදාවත් මේ විදුලි කණු ගානේ ගිහිල්ලා නෑ. මට යන්න කීවත් මම යන්නේ නෑ. මට නම් කරල තිබුණත් එනවා කියලා මම දැනුවත් වෙලා හිටියෙ නෑ මම දැනුවත් වෙනකොට මට එන්න බැරි තැනකයි මම හිටියේ. ඒ නිසා ක්‍රමවේදය හොඳ නෑ. ඒ නිසා මම කියන්නේ ආණ්ඩු පක්ෂයට සලකනවා, විපක්ෂයට සලකන්න එපා කියන එක නෙවෙයි මම මේ කියන්නේ. වීදි ලාම්පු හදන ක්‍රමය අනුව ඒ මන්ත්‍රීවරයාට අවස්ථාව දීලා ඊළඟ දවසේ අනිත් කෙනාට දෙන්න. අපි දෙන්නා හින්දා යන්න පුළුවන්. අර්බුද තියෙන අයට බෑ. විපක්ෂෙයි ආණ්ඩු පක්ෂෙයි මන්ත්‍රීවරුන් දෙදෙනෙකුට එක දවසේ යන්න බෑ. එකට බැඳෙන්න බෑ. ප්‍රශ්නයක් වෙන්න ඉඩ තියෙනවා. ඕව දැන් සමාජේ වෙන දේවල් නෙ. ඒ නිසා තමයි දවස් දෙකකට දෙන්න කියන්නේ. එතකොට මේ ප්‍රශ්නයක් වෙන්නේ නෑ. මේක සාර්ථකව කෙරුනු තැන් තියනවා. නැති තැනුත් තියෙනවා. ඊළඟට ඔබතුමා මම නම් කරලා කියන්න හදනවා නම් මම කැමැති නෑ. ඔබතුමා කියනවනේ අයවැයට අදාල කරුණු කියන්න කියලා. ඉතින් දැන් ඔබතුමත් අයවැයට අදාල කරුණු ද කියන්නේ. මොකක්ද ඒකේ හපන්කම. ඔබතුමා විතරද ඒකට සුදුසු. අනිත් අය කතා කරල බැරිද . අපිටත් පනත අනුවද කතා කරන්න ඕනෑ. ඔබ හිතන්නකෝ ඔබතුමා තමයි මේ වැඩපිළිවෙළේ නායකයා. නැත්නම් ඔබතුමා සභාපති සන්ධානට විරුද්ධ වුණානේ.නැත්නම් මේ සැරේ සභාපතිවරියට පක්ෂ වුනේ මොකද.

විපක්ෂ වෙන්න තිබුණා නේ. ඒ හින්දා මේ ඔබතුමා හැරෙන හැරෙන පැත්තට හැරුනට ඔබතුමාට ඇදගන්න ඕන නම් ඇදගමු අපි දෙන්නා. මම කියලා දෙන්නම් අපූරුවට, ලස්සනට ඔබතුමාගේ වැඩපිළිවෙළේ ලස්සන. ඒ නිසා අපි දෙන්නා කවුද කියලා ඔබයි මායි දන්නවනේ. දැන් මට අනන්ත ගම්වල චෝදනා කරනවා ඔබතුමා, මම උලපනේ ඉන්නේ, ඔබතුමා දැන් ඔක්කොම කරන්න ඕනෑ කියලා. ඔබතුමා තමයි මේ කරල තියෙන්නෙ. මේ තියෙන්නේ ලස්සනට. මේ තියෙන්නෙ හඟවත්ත පින් කොටුව පාරට දාලා තියෙනවා රුපියල් 350,000.00 ක්. වඩුවාව ඉහළවෙල පාරට රුපියල් 350,000.00 ක්. පොරමඩල ප්‍රාථමික විද්‍යාල පාරට රුපියල් 150,000.00 ක්. මේවා කොහෙන් එන සල්ලිද. දැන් මේ හත් ලක්ෂ ගානක් ඇවිල්ල තියෙනවා. ඔබතුමා කියයි මම නොවෙයි ඉල්ලුවේ වෙන කෙනෙක් කියලා. වෙන කෙනෙක්ට කොහොමද දෙන්නේ. මන්ත්‍රී ප්‍රතිපාදන වල වර්ෂයකට ලක්ෂ 05 යි තියෙන්නේ. මේවා දාන්නත් බෑ කියලා තියනවා. මේවා පස්සේ කතා කරමු. කාලේ නාස්ති කරන්නත් බෑනේ. මේකට කලින් කරපු තිලකරත්න මාවතට බොරළු දාපු ඒවත් එකතු වෙන්න ඕනේ. එතකොට ලක්ෂ 15 ක් විතර වෙනවා. ඒක ප්‍රශ්නයක් නෑ. ඒවා කරන්න ඕනෑ. මටත් හොඳයි. මට දුකයි තිලකරත්න මාවතට බොරළු දාගන්න බැරි වුණ එකට.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ මම මේ අයවැයට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන්න තීරණය කරලා තිබෙන කාරණා දෙකක්. හැබැයි ඒ කාරණා දෙක දෙකක් නෙවෙයි එකක්. මම මේ කාරණා දෙක කතා කරගෙන යන්නම්. එකක් තමයි අද මේ රටට වෙලා තියෙන විනාශය. අපේ චමින්ද මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, අපිටත් පුළුවන් වේදිකාවට නැගලා යම් යම් දේවල් ඡන්දය ගැන කතා කරන්න. මාතෘකාවක් හදාගන්නවනේ. අපි එක කාලෙක මහ බැංකු හොරා කෑවා කියලා, මහ බැංකු හොරා කියලා අපි කතා කළා. එක කාලෙක මේ රටේ යුද්ධය ඉවර කරපු රට බේරගත්තු නායකයා කියලා අපි කතා කලානේ. ඒකෙන් මිනිස්සුන්ගෙ මතය වෙනස් කරලා ඡන්දයක් තිබ්බා. ඒක විතරක් නෙවෙයි. අන්තිමට එතුමාගේ සහෝදරයා ගෝඨාභය රාජපක්ෂ මහත්තයා ගෙනැල්ලා, ඒ බලවේගය හින්දා තමයි ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාට ජනාධිපති වෙන්න පුළුවන් වුණේ. දැන් 1988, 1989 කාලය ගිහිල්ලා ඉවරයි. හැමදාම මැතිවරණ කාලෙට ඡන්ද තුරුම්පුවක් නම් ඒකෙ වලංගු කාලය ඉවරයි. යුද්ධ විකුණලා ඒ ඡන්දෙ ඉවරයි. මේකේ මහබැංකුව හොරාකාපු කෙනා දැන් රටේ ජනාධිපති වෙලා ඉවරයි. මේ රටට වෙලා තියන දේ ගැන අපි කතා කරන්න ඕන. දැන් මම චූටි දෙයක් තමුන්නාසේලාට පෙන්නන්නම්. මේ රටේ හොරකම් ගැන දූෂණය ගැන රටේ නාස්තිය ගැන. මෙන්න මේක පොඩ්ඩක් බලන්නකො. මේවා අපේ පක්ෂෙන් කොට්ඨාශයකට ඡන්දෙ දවස්වල එව්වා ඡන්ද පොළවල් පිහිටුවන්න. බලන්නකෝ මේ වගේ හතරක් මට එවනවා මගේ කොට්ඨාශයේ බෝයවලාන, කැන්දගොල්ල, කැප්පිටිවලාන, නැබඩවතුර. මට මේ හතරක් එනවා ඡන්ද පොල පිහිටුවන්න කියලා. මේ බලන්න මේ රටේ සල්ලි. මේ රටේ වෙන දේ බලන්න. මේ අපි බඳවා ගන්න කෙනාට මේක දෙන්න. අපිත් හරක් තමයි. මේවට අපි රැවටුණා. මේ බලන්නකො මේවට කීයක් වියදම් කරලාද. මොනතරම් රජයේ සල්ලි විනාශ කරලද මේ නායකයො. මේ පල්ලෙහා ඉන්න අපි වගේ අය අන්දන ඇන්දිල්ල. අර දුප්පත් මිනිහා එදා වේල හම්බ කරල කන මිනිහගේ සල්ලි තමයි මේවා. අපි තමා මේවට වැරදිකාරයෝ. මේ කොට්ඨාශ 14,000 ක් තියෙනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

ගරු මන්ත්‍රීතුමා රීති අනුව කතා කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා**

රීති අනුව කතා කරන්න ගියොත් ඒවා වැඩක් නෑ. දැන් මෙතන අයවැයට පක්ෂද විපක්ෂද. දැන් ලේකම්තුමියත් ගානට ඒවා හදලා ඉවරයි. අපිට දැන් කරන්න දෙයක් නෑ. මම හැමදාම කියන දෙයක් තියෙනවා. ඔබතුමිය දේශපාලනය නොකර ඔබතුමියගේ රැකියාව කරගෙන ඉන්න. දේශපාලනය කරන්නේ අපිනේ. මේ දේශපාලනය කරලා අපිට කෙල වෙලා තියන හින්දානේ මේ කියන්නේ. ඒක නිසා මේ ටික ඔබතුමාල බලන්නකෝ. මේ ''සිව්දෙස සුරැකි සිව්වසක සම්මේලනය''. මේවා නිසා තමයි හිභාකන තැනට වැටිල තියෙන්නෙ. කරල අපිත් රැවටුනා තමයි. තමුන්නාන්සේලාට හිතන්න තියෙන්නෙ මේ රට විනාශ කලේ කවුද. 2015 මැතිවරණය වෙලාවේ හැමෝටම එන්න කියලා රුපියල් ලක්ෂය ගානේ දුන්නා. මැතිවරණයට වියදම් කරන්න. බැසිල් රාජපක්ෂ මහත්තයා ඇමරිකාවෙන් ගෙනල්ල ද. මේ රටේ සල්ලි අච්චු ගහලා අපේ මිනිස්සුන්ට බෙදුවා. කීයද අද උද්ධමනය. මම මේ කියන්නේ කුඩා ම විනාශයක් ගැන මේ රටට කරපු. මම මේ කියන්නේ කාරණා එකක්. අපේ මේ සභාපතිතුමිය මම එකසැරයක් මෝටර් ග්‍රේඩරය ඉල්ලුවා. අපේ ලේකම්තුමියට ලිපියක් දීලා කතා කරහම කිව්වා හෙට එවනවා කියලා. ආයෙ දවසක කතා කරලා කීවා එවන්න විදිහක් නෑ කියලා. ඊට පස්සේ කොහොම උනත් මට ලැබුණෙත් නෑ. ඊට පස්සේ මම කිසිම දෙයක් ඉල්ලුවෙත් නෑ. අපිට මේකෙ අභිමානයක් තියෙන්න ඕන. මේකෙ අපි පක්ෂයක් විදිහට එකතුවෙලා ඡන්දෙ ඉල්ලලා මෙතෙන්ට ආවනම් අපිට අභිමානයෙන් වැඩ කරන්න තියෙන ඕනේ. ගමේ මිනිස්සුත් එක්ක. එහෙම නැතුව එක එක්කෙනා ළඟට ඇවිල්ලා වැඳ වැටෙන්න අපි දේශපාලනය කෙරුවෙ නෑ. අපි වීදි ලාම්පු කිසිම දෙයක් ඉල්ලුවෙ නෑ. දිග කතාවක් කරන්න තියෙනවා. මම එතෙන්ට යන්නෑ. දැන් මේ අවස්ථාව කාල වෙලාව ගොඩක් ගිහිල්ලා තියෙනවා. ජයතිලක මන්ත්‍රීතුමා කීවා කෑම දෙන එක නවත්තන්න කියලා. මට දැන් බඩගිනියි ඉන්න බැරුව ඉන්නෙ. දැන් කාල බීල හිටියනම් මට තව ටිකක් කතා කරන්න තිබුණා. විශේෂයෙන් විපක්ෂ නායකතුමා කියනවා අපේ රටේ දැන් පෝලිම් යුගය ඉවරයි, ගෑස් පෝලිම්, තෙල් පෝලිම්, ඒවා දැන් ඉවරයිලු. එතකොට ඒවා ඉවර කලේ කවුද. රනිල් මහත්තයා ඇවිල්ලා තමයි ඒව අවසන් කළේ. එතකොට ඒවා ඇති කලේ කවුද. රනිල් මහත්තයා මේ රටේ 6 වතාවක් අගමැති. මේ රටේ වසර තිහක් විතර කිසිම අගමැතිවරයෙක් එතනින් එහාට යන්න බෑ. එහෙම කෙනෙක් අපේ 120 ක ඡන්දෙන් අද ජනාධිපති වෙලා. මොන පාවාදීමක්ද කියන්නකො මේ. පොහොට්ටුවේ රාජපක්ෂලාගේ ඒ බලය, ඒ පොහොට්ටුවේ බලය කියලා පෙන්නලා තියෙන්නේ. මිනිස්සු අරගල කළේ ඉන්න බැරුව ද. මිනිස්සු පාරට බැහැලා මේ රටේ එකසිය ගානට තිබුණු තෙල් ටික හාරසිය ගානට යනකොට රුපියල් 13ට 14ට තිබුනු බිත්තර ගෙඩිය රුපියල් 50 ට 60 ට යනකොට. රජයෙ ඉන්න නිලධාරිනුත් ඒ වගේ. එක දැරියක් කුරුම්බා ලොඳ කෑවා කිව්වම ඒක පෝෂදායි දෙයක් ලු. පොල් කුරුම්බා ලොඳ ඒවා කන්න ඕනෑලු. තව කෙනෙක් කියනවා එක වේලක් නොකා හිටපුවම ඒක සෞඛ්‍යයට හොඳයිලු. කාලා කාලා ඇඟ හදා ගන්න එකට කියන්නෙ ඩයට් කරනවා කියලා. මෙයාලගේ හිතේ මේ අහිංසක මිනිස්සු තුන්වේල මේ විදියට මස්, මාළු එක්ක කාලා අනිත් පාර එක වේලක් නොකා ඉන්නවා කියලා. කුරුම්බා ලොඳයි, පොල් මදයි නැත්නම් මොනවා හරි දෙයක් කාලා ජීවත් වෙන මිනිස්සුන්ට තමයි මේ හැම දෙයක්ම. එහෙම තියෙද්දි මේ අයවැය පරද්දන්නෙ නැතුව ඉන්නද අපි. ඊයේ පෙරේදා කළුතර විලිලැජ්ජා නැතිව වේදිකාවට නැග්ග කට්ටිය ඇඹුවා තමන්ගේ අම්මා විතරයි හිටියේ ගෙදර කියලා. අපි රැවටිච්ච මිනිස්සුනෙ. මොලේ පැදෙන්න එපැයි. රට කාලා දැන් කියනවා මහින්ද සමග නැගිටිමු කියලා. එතුමාත් දෙන්නෙක් අල්ලගෙන තමයි වේදිකාවට නැග්ගේ. අර නාකි මයිනා කිව්වට නාකි මයිනියක් ගෙනත් මේ ගත්ත තීරණෙත් අන්තිම කැතයිනේ. එදා ඒ වෙලාවේ සන්ධ්‍යා සභාපතිතුමා ඡන්ද තියන්න ඉස්සරලා අපි සාකච්ඡා කළා. අයවැය පරද්දන්න. මෙතුමියත් සහභාගි වුණා. හරි හරි මම එනවා ඒකේ දෙකක් නෑ කියලා. මෙතුමිය එතනත් උපදෙස් ගත්ත ඉහළින්. මෙයා ඡන්දේ දවසේ උදේ පාන්දර මග ඇරලා ගියා. "ඔයා මේකට සම්බන්ධ වෙන්න එපා, ඔයාට සභාපතිකම දෙන්නම්'' කියලා ඉහළින් පොරොන්දු වෙලා. අපි ගමේ දේශපාලනය කළේ. ගමට වෙලා එදා ඉඳලා පාද යාත්‍රා ගියා. අපි මුදල් වියදම් කරගෙන බත් මුල් බැඳගෙන ගියා. මෙයා එදා රණවිරු සංවිධානේ සභාපති. පද්මා වැත්තෑව මැතිනියට ලොකු දේපලක් තියන

වැදගත් කාන්තාවක්. එතුමියට දේපළවලින් ආදායමක් නෑ. රිලව් කනවා එක පැත්තකින්. එක පැත්තකින් ඌරෝ කනවා. ඒවගේ ගන්න දෙයක් නෑ. එතකොට එතුමියට ඕන නම්බුකාර විදිහට ඇඳගෙන යන්න. ගිහිල්ලා ගෞරවයක් ලබා ගන්න. ඒක නෙමෙයි මේ රිලව් කරදරේ. එතුමියට වාහනේට පෙට්‍රල් ටිකක් ගන්න සල්ලි නෑ. බන්දුල මහත්තයා කීයක් හරි රඟපාලා හොයාගෙන ආවම ඒක තමයි තියෙන්නේ. ඒ නිසා බැලුවා දැන් අර තනතුරත් කරලා කරලා, මේවගේ ඉඳලා, මෙච්චගෙන් කාලා, පිනට වාහනය පාවිච්චි කරලා, මේක පුරුදු වෙච්ච කෙනාට මේක වතුර නැතුව මාළුවාට ඉන්න බෑ වගේ. එදා ඉඳන් ඒ බලාපොරොත්තු ඇති කරගෙන නෙළුම් මාවතට උදේ හවස ගිහිල්ලා හදාගත්ත. අපි ගමේ දේශපාලනය කෙරුවා එදා ඉඳලා. නමුත් එතන ගිහිල්ලා කෙදිරිගාපු කෙනාට තමයි තනතුරු දුන්නේ. අපි එදා ඉඳල ගමේ නායකයින්ට උදව් කළා. මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමා එක්සත් ජාතික පක්ෂයේ ඉන්න කාලේ අපිට ගැහුවා. අපි දෙපාරක් ජයරත්න හේරත් මැතිතුමාගේ ගෙදර ගිහිල්ලා පන්නල ඇවිල්ලා ගහපු පාර දෙපාරක්ම අපිට ගැහුවා.මෙතුමියත් අපිත් එක්ක පාදයාත්‍රා ගිහිල්ලා බොහොම අමාරුවෙන් බේරිලා ආවේ. එහෙම කෙනා තානාන්තර දීල මහින්ද මහත්තයා . එයා අපිව ගෙන්නල ඡන්දෙ ලං වෙනකොට කියනව, පක්ෂෙ බොනට් එක තමයි පළාත් පාලන නියෝජිතවරු. ඕන දේකට මුහුණ දෙන්නේ පළාත් පාලන නියෝජිතවරු. ඒ නිසා මම ඔබතුමන්ලාට බොහොම ගෞරවයෙන් තමයි සළකන්නේ. ඔබතුමාලා තමා මේ පක්ෂේ ආරක්ෂා කරගන්නේ එදා ඉඳලා. එහෙම කියලා අද කළුතරදි රෝහිත මැතිතුමා කීවේ මොකද්ද. එයා කීවේ පොහොට්ටුවේ බොනට් එකලු දැන් මහින්ද මහත්තයා. අපේ පක්ෂේ දැන් බොනට් එක කවුද, මහින්ද මහත්තයා. එතකොට අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂේ ඉඳන් ඒගොල්ලෝ ආරක්ෂා කරන අය. මහින්ද මහත්තයාට ඔය හැම ජයග්‍රහණයම ගන්න පුළුවන් වුණේ සාමය උදාකරලා, යුද්ධ ජයග්‍රහණය කරලා. එකේ ගෞරවය එදා ඉඳලා තිබුණා. වෙන මුකුත් ඕන්නෑ. ඔබතුමිය අර සභාවෙ කැබ් එක ගෙනිහිල්ලා කරපු විනාශෙ. එදා ගියා පොල්ගහවෙල සභාපතිතුමා, නාරම්මල සභාපතිතුමා. මේ ගොල්ලෝ නොදැන ගියා නොවෙයි. බස්වලට එක්කෙනාට අරක්කු බාගේ ගානේ දීලා, උදළු මිටි දුන්නේ ගහන්න. මේකට මේ 8 පාස් කෙනෙක් තමයි උපදෙස් දුන්නේ. ගෝල්ෆේස් එකට යන වෙලාවෙම ගහලා පැන්නුවා නම් ඉවරයි. අපි තමා මේකේ කෙළි කාරයෝ. එහෙම කියලා අපි දැක්කනේ කථා පවත්වනවා. අර කෙනෙකුට රෙදිත් ගලවල යට ඇඳුමෙන් යනවනේ. අපිට  කියන්න තියෙන්නේ ලැජ්ජා නැතිකම මහමුදලිකමටත් වැඩිය ලොකුයි. මේ කතාව හුඟ දෙනෙක් දන්නවා ඇති. එක්තරා ලොකු මුදල් හිමි වැවිලිකරුවෙක්. මේ මුදලිතුමාගේ ඉඩමට හැමදාම එනවලු පොල්ගෙඩි, දර. අනං මනං ගෙනියන්න කාන්තාවක්. දැන් මේ කාන්තාවට කතා කරලා කිව්වලු මේවා ගෙනියන්න එපා කියල. එයා අහන්නෙම නැහැලු. ඉතින් අර මනුස්සයා කාන්තාව එනවා දැකලා සරම උස්සලා මුත්‍රා කරාලු. ඒත් එනවලු. ඒක තමයි ලැජ්ජා නැතිකම කියන්නේ. ඒක තමයි පහුගිය දවස්වල පෙන්නුවේ. මේ ඔක්කොම සරම උස්සලා පෙන්නලා ඉවරයි. දැන් රටම නිරුවත දැක්කා. මේ රටේ මිනිස්සු මේ රට විනාශ කළේ කවුද කියන එක දැක්කා. දැක දැක විලි ලැජ්ජා නැතුව හෙලුවෙන් කළුතර ජන හමුවක් පවත්වලා අපේ ජොන්ස්ටන් මැතිතුමා කියනවා ඊළඟ රැස්වීම් පවත්වන්නේ කුරුණෑගල කියලා. හොරුන්ට උදව් කරන මිනිස්සු ඉන්නවා. අපි දන්නවා අර චන්දන කියලා අට පාස් නැති එක ගල්වලක වැඩ කරන කෙනෙක්. තමුන්නාන්සේලා දන්නවා ඇති. මිනිහා තමයි මාධ්‍ය ලේකම්. දිනුවාට පස්සේ වාහනයක් දීලා අන්තිමට එක අවුරුද්දක් ගියේ නෑ. නෝනට උපන්දිනයට ඇල්ටො කාර් එකක් අරන් දුන්නා. මේ අපෙන් කීය කීය හරි ඉල්ලගෙන හිටපු මිනිහා. රටට පෙන්නන්න ඕන මේ රට විනාශ කරල තවදුරටත් මේ රාජපක්ෂලාට බලවේගයක් නෑ. ජනතාවගේ බලවේගය තමයි එදා පෙන්නුවේ. ජනතාව තමයි මේ රටේ බලය. ඒක තමයි අරගලය තුලින් පෙන්නුවේ. ඔය තනතුරු වලින් පලයව් කියන එක මේ ප්‍රාදේශීය සභාවෙනුත් පෙන්නන්න ඕන. ඔය ලේකම්තුමිය මොනවහරි තුරුම්පුවක් ගැහුවාට, අද මේක පරාද කළාට පස්සේ එතනින් අපි පණිවිඩය දීලා ඉවරයි. ඒ නිසා විපක්ෂ මන්ත්‍රීවරුන්ටත් කියනවා සියලු දෙනාම එකට එකතු වෙන්න ඕන. සියළු දෙනා රට ගැන හිතන්න ඕන. අපිට රට හදන්න බෑ. නමුත් අපි හිතනවා ලයිට් එකක් දැම්මොත්, මෝටර් ග්‍රේඩරය

අරන් ගිහින් පාර කැපුවොත් ඒක හරි කියලා. එහෙම කළාට වැඩක් තියෙනවද රට හිඟමනට දාලා. ගහේ මුල් කපන්නැතුව ගහේ අතු කැපුවට වැඩක් තියනවාද. මේවට මූලික වෙච්ච මිනිස්සු අපි දන්නවා. අද ඒ මිනිස්සුන්ට බලය දෙන්න මේ රටේ ජනතාව ඉඩ දෙන්නැති බවත් අපි දන්නවා. ඒ නිසා අපි සියලු දෙනාම එකතුවෙලා මේ ඊනියා පාලන ක්‍රමය මුන් මේ රටට කරලා තියෙන අපරාධයට දඬුවම් දෙන්න ඕනෑ. මුන් පලවා හැරලා විතරක් වැඩක් නෑ. අද එදා ඉඳලා මේ රටේ අර කොමිෂන් දානවා. ආයේ කෙනෙක් ආවම තව කොමිෂන් දානවා. මට කියන්න මේ රටේ එක මිනිහෙකුට දඬුවමක් දීලා තියනවද කියලා හොරුන්ට. රන්ජන් රාමනායක ඇත්ත කතා කරා කියලා දැම්මා හිරේට. එච්චරයි දඬුවමක් දුන්නා කියලා දුන්නේ. මෙහෙම පාලකයෝ මේ රට හදයි ද. මේ පාලකයන්ට විරුද්ධව අපි කතා කරන්න ඕන. මේකෙන් පෙන්නන්න ඕන අපි සියලු දෙනාම, මේකේ මේ සභාපතිව ගෙනත් ඉන්දුවේ කවුද. එතකොට ඒ ඉන්දපු මිනිස්සුන්ට දැනෙන්න අපි පරාද කරන්න ඕන. ඒක හැම දෙනාගේම වගකීම කියලා මතක් කරමින් ඊට වඩා මම කතා කරන්නේ නෑ. කාල වේලාව ඉක්ම ගිහිල්ලා තියෙනවා. ඒ නිසා අපි මේකට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරනවා කියමින් මා නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී නන්දසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පළමුවෙන්ම මේ 2023 වර්ෂයේ අයවැය පිළිබඳව කතා කිරීමේ දී වෙනත් ආදායම් ශීර්ෂය යටතේ තියෙනවා රු. 58,886,500.00 කුත් ආදායම් ආධාර යටතේ 84,450,000.00 කුත්. ඇත්තටම මේවා ලැබෙනවද කියන එක පිළිබඳව අපට සැකයක් තියෙනවා. පහුගිය කාලය චක්‍රලේඛ වලින් මේ සියල්ලම නතර කරලානේ තිබුනේ. ඒ එකක්. එතකොට මිලියන 173 ක ආදායමක් පෙන්නනවා. ඒකෙ වියදම දිහා බලද්දි මා අවධානය යොමු කරන්න කැමතියි සම්පාදනය කිරීමට මැදිහත් වූ අයගෙත් එක්ක මේ පුස්තකාල සඳහා පොත් ලබා දීමට වෙන් කරලා තියෙනවා ලක්ෂ තුනක මුදලක් පුස්තකාල 3 සඳහා. ඇත්තටම 01 බැගින් ප්‍රමාණවත් නෑ. වර්තමාන මිල ගනන් ගත්තහම පුස්තකාල වලට පොත් ලබා ගැනීම සඳහා වෙන් කරන්න ඕනෑ විශාල මුදලක්. මම හිතන්නෙ ලක්ෂ තුනක විතර මුදලක් එක පුස්තකාලෙකට වියදම් කරන්න ඕන. මොකද අපි දන්නවා මිනිස්සුන්ට අධ්‍යාපනය ලබා දෙන්න ඕන. අධ්‍යාපනය ලබාදීම සඳහා ඒ පැත්තට වැඩි මුදලක් වෙන් කරනවා නම් හොඳයි කියලා මම හිතනවා. ඒත් එක්කම මා ඔය සංරක්ෂණය සඳහා වෙන් කර ඇති මුදල, මා ඔය දෙපැත්ත ඛාදනය වීම වැළැක්වීම සඳහා වෙන් කරලා තිබුණු මුදල කප්පාදු කරලා තියෙනවා. රුපියල් 50,000.00 දක්වා අඩු කරලා තියෙනවා. ඒත් එක්කම තව තියෙනවා සීසීටීවී කැමරා පද්ධතියක් සවි කරන්න, ගේට්ටුව වගේ දේවල් සවි කරන්න. ඇත්තටම මේ වගේ වෙලාවක මේ ව්‍යාපෘති අවශ්‍යද කියන ගැටලුව මතු වෙනවා. මොකද මේ රටක අර්බුදයක් තිබෙන මොහොතක මේ අපි මොනවා කිව්වත් මේක දිහා බලලා සම්පාදනය කරලා තියෙනවා ලස්සනයි. නමුත් මේක ඇතුළේ අපට නියම විදියට කෝටි 06 ක වගේ ආදායමක් තමා අපිට මේ අවුරුද්ද තුළ මම බලාපොරොත්තු විදියට ලැබෙන්නෙ. ගිය අවුරුද්දට සාපේක්ෂව බලපුවම. ඒ එක්කම සෞඛ්‍ය කම්කරුවන්ගේ අවශ්‍ය සායන සඳහා වෙන් කරලා කියන මුදල කොහොමවත් ප්‍රමාණවත් නැහැ. මේකෙ දඩ ආදායම ලක්ෂ 40 ඉඳලා ලක්ෂ 65 දක්වා බලාපොරොත්තු වෙනවා. අපේ ප්‍රදේශවල තියෙන සියලුම දුරාචාරයන් ඒ විදිහටම පවත්වාගෙන යාමට මේ වර්තමාන පාලනයෙනුත් ඉඩ ලැබෙනවා කියන එකයි. මේක මේ අයවැයට සම්බන්ධ නොවුනත් වෙනත් කරුණු යටතේ කතා කරන්න මා නොසිටින නිසා මෙතෙන්ටම කියන්න කැමති ඔබ සියලු දෙනාමත් මේක දැනුවත් වෙන එක හොඳයි. මේ ප්‍රදේශයේ ස්පා ආයතන නැත්නම් සමාජ ශාලා දෙකක් තියනවා. නගරයේ ඒ එකක මේ මොහොත වන විට අයිස් කියන මත්ද්‍රව්‍ය ගෙනල්ලා මේ ප්‍රදේශයේ බෙදා හරිනවා. අයිස් කියන මත්ද්‍රව්‍ය හෙරොයින් වලට එහා ගිය අති භයානක මත්ද්‍රව්‍යක්. භයානකයි. කියන්න කණගාටුයි. ඒ මත්ද්‍රව්‍ය දරුවන්ට, ඉස්කෝලේ යන ළමයින්ට බෙදා හරිනවා. ඒ එක් ස්ථානයක ඉන්නවා ගණිකා වෘත්තියේ යෙදෙන කාන්තාවක්. මේ කාන්තාව ඇයගේ ගණිකා සේවය ලබා දෙන්නේ අයිස් මත්ද්‍රව්‍ය පාවිච්චි කරන්න තැනට ඒ තරුණයා පත් වුනොත් විතරයි කියලා තියෙනවා. ඒ නිසා ඒ පිළිබඳවත් ඔබතුමන්ලාගේ අවධානය මේ අවස්ථාවේ යොමු

කරන්න. ඒක මම මතක් කළේ දඩ ආදායම නිකන්ම දඩ විදියට නෙවෙයි එන්නෙ. වාහනවලින් එන දඩ විතරක් නොවෙයි එන්නේ. කුඩු කසිප්පු මත්ද්‍රව්‍ය වගේ දේවල් වලින් එන දඩ. සභාවක් විදියට දඩ ආදායම රුපියල් ලක්ෂ 65ක් දක්වා වාර්ෂිකව බලාපොරොත්තු වෙනවා කියන්නේ අපි දන්නවා මේ අහිතකර ව්‍යාපෘති, මේ මත්ද්‍රව්‍ය වගේ සමාජය විනාශ කරන දේවල් නතර කිරීමේ වැඩපිළිවෙළක් මේක තුළ ක්‍රියාත්මක නොවන බව ප්‍රදේශය කේන්ද්‍රගත කරගෙන. ඒත් එක්කම අයවැය කෙටුම්පත පිළිබඳව මගේ අදහස් දැක්වීම අවසන් කරමින් මේ අවස්ථාවේ මේ සභාවේ මතුවන ගැටලු තිබෙනවා. මේ ඔක්කොටම උත්තර දෙන්න මට වයස මදි. මොකද 71 ගැන කතා කළා. 88, 89 මේ ගැන කතා කළා. පක්ෂය ගැන කතා කළා. නමුත් මේ පිළිබඳව උගත් නෝනල මහත්තුරුන්ට විවිධ අදහස් ඇති. අපේ පැත්තෙන් අපි කියන්න ඕනෑ. මේ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාවක් කර ගන්නවා අයවැය කතාව තුළම. ඇත්තටම 71 වත් 88, 89 වත් අහම්බයක් නොවෙයි. 88, 89 දී අපි අවුරුදු 9ක 10 ක විතර පොඩි ළමයි. නමුත් අපි ඉතිහාසය කියවලා බලද්දී අපි ඉතිහාසය දේශපාලනික වශයෙන් වාසි සහගත විදිහට පාවිච්චි කරන පක්ෂයක් නොවේ. ඒ ඉතිහාසය තුළ 88, 89 අපේ පක්ෂයේ සහෝදරවරු තමයි 60,000 ක් මැරුණෙ. එවකට පැවතුණ රාජ්‍ය ත්‍රස්තවාදය විසින් අපේ පක්ෂයේ දේශපාලනය කරපු සහෝදර සහෝදරියෝ තමයි 60,000 ක් අමු අමුවේ ටයර් සෑ වල ගිනි බත් උනේ. හැබැයි ඒක කතා කරද්දි කියනවා මේ 60,000 ජේවීපී ඒකෙන් මරපු විදියට. ඒ තුළ මම කියන්නෑ සිවිල් යුද්ධයක් පවතින මොහොතක රටක ජනතා ජීවිතවලට හානි සිදු නොවී කරන්න පුළුවන් කියලා. අපි ගැහුවා පොලිසි වලට. පොලිසි වලින් තුවක්කු ගත්තා තමයි 88, 89 කාලේ. ඒ සිවිල් යුද්ධවලට මුහුණ දෙන්න පක්ෂයක් විදිහට කටයුතු කළා. කටයුතු කරලා අපේ පක්ෂෙනුත් යම් යම් නොවිය යුතු දේ සිදු වුණා කියන එක පිළිගන්න අපි පසුබට වෙන්නේ නැහැ. අපි එක පිළිගන්නවා. අපිට ඒකට ඇත්ත හදවතේ කනගාටුවක් තියෙනවා. ඇත්තටම කියනවානම් 88, 89 අරගෙන හැමදාම ජේවීපීයට ගහන්නේ දේශපාලනය ප්‍රජාතන්ත්‍රවාදීව ඉදිරියට ගමන් කර ජේවීපීයට ජයග්‍රහණ ලැබෙන මොහොතවල් වලදී. දැන් වර්තමානය බලන්න. ඒ ගැහිල්ල පටන් අරන් තියෙන්නෙ ජේවීපියට. ඇයි මේ 89 න් පස්සෙ අවුරුදු 33ක් අපේ පක්ෂ සාමාජිකයෝ 18 ක් ඝාතනය කරා මැතිවරණ වලදී. අපේ පක්ෂය එක ගල්කැටයක් අතට ගත්තේ නෑ. එක නීතිවිරෝධී ක්‍රියාවක් කළේ නෑ. අපේ පක්ෂය අපි සාමකාමීව ඒවා දරාගෙන ප්‍රජාතන්ත්‍රවාදීව අපේ දේශපාලනය කරනවා. හැබැයි වර්තමාන ආණ්ඩුව හොරකම් කරලා කරලා, බිලියන 55 ක් විතර ණය අරගෙන, රටේ තියන ධනය සම්පූර්ණයෙන් එක පවුලක් හොරකම් කරගෙන. ඒ හොරු තවදුරටත් මේකේ රජ කරවන්න අළුත් රජෙක් ගෙනාවා රනිල් රාජපක්ෂ කියලා. දැන් රනිල් රාජපක්ෂගේ කාර්ය මොකද්ද. හොරු නඩය ආරක්ෂා කරන එක. රට හදන්නේ නෑ. රනිල් රාජපක්ෂට ඕනෑ කරලා තියනවා මේ ජනතාව ජනතා ප්‍රශ්න වලදී නැගී සිටින එක වලක්වන්න. ඒ නිසා තමයි මේ අරගලය ආරම්භ කරපු අප්‍රේල්, මැයි වගේ මාස වලදී අරගලය මිරිහානට යද්දි මිරිහානේ බස් එක ගිනිගන්නවා. අදටත් හොයලා බලන්න ඒ බස් ඒක ගිනි තියපු අය අත්අඩංගුවට අරන් තියනවාද. ඇවන්ගාඩ් එකේ නිශ්ශංක සේනාධිපතිගේ මිනිස්සු ඇවිල්ලා තමයි බස් එකට ගිනි තියන්නේ. මේ පහුගිය කාලේ ඊට පස්සේ සාමකාමීව අරගලය කළේ ඇයි මිනිස්සු. මිනිස්සුන්ට කන්න නෑ. අපි දන්නවා ගම්වල මිනිස්සුත් එක්ක අපි ඉන්නේ. ඒ මිනිස්සුන්ට කන්න නෑ. ඉස්පිරිතාලෙට ගියාම බේත් ටික ගන්න සල්ලි නෑ. ලයිට් නෑ. ගෑස් නෑ. මිනිස්සුන්ට හතේ හත වැදිලා. තරුණ තරුණියෝ අපේක්ෂා භංගත්වයට පත්වෙලා. එහෙම සමාජයක් පාරට එන එක වළක්වන්න බෑ. එවැනි සමාජයක් පාරට එනවා. ඒ තුළ ජේවීපී විදිහට අපිත් ඉන්නවා. සමගි ජන බලවේගය, සියලු දේශපාලන පක්ෂ නියෝජනය කරන අය ඒවගේ ඉන්නවා. පොදුජන පෙරමුණේ 40% කට වඩා පිරිසක් ඒ සඳහා එකතු වෙනවා. එකතුවෙලා මේ අරගලය යන්නෙ. හැබැයි මේ සාමකාමී අරගලයට ඔබතුමියලා එකතුවෙලා ජුනි 09 වැනිදා එල්ල කරනවා අමානුෂික ප්‍රහාරයක්. ඒ ප්‍රහාරය එල්ල කරන්නේ ගෝල්ෆේස් එකට ගහලා, නුවරට ගහලා ඒ ජනතාවගේ ඇත්ත දැවෙන ප්‍රශ්න වලට විසඳුම් දෙනවා වෙනුවට ජනතාව මර්ධනය කරන්න. ඒ මර්ධනය තුළින් බලය පවත්වාගෙන යන්න. හැබැයි මේ රටේ ජනතාව ඒ මර්ධනයට මුහුණ දෙනවා. අන්න ඒ මර්ධනයට මුහුණ දෙද්දී වර්තමානයේ රාජ්‍ය ත්‍රස්තවාදය

ක්‍රියාත්මක වෙනවා. 88, 89 ප්‍රාදේශීය සභා කළු බළල්ලු වගේ රාජ්‍ය ත්‍රස්තවාදීන් ඒ ත්‍රස්තවාදය ක්‍රියාත්මක කලා වගේ වර්තමානයේ ඇවන්ගාඩ් එකේ, ඒ වගේම හිතෛෂීන් රාජ්‍යයට සම්බන්ධ කරගෙන අපේ ප්‍රදේශ වලත් විවිධ ප්‍රදේශ වලත් ගෙවල් වලට ගිනි තියනවා. මහජන නියෝජිතයන්ට ගහනවා. දේශපාලන දේපල වලට ප්‍රහාර එල්ල කරනවා. ගත්තද අත්අඩංගුවට. මාවත් කුරුණෑගලට එක්කන් ගියා. මෙතුමා එක්කන් ගියා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන්. කෝ ඇල්ලුවාද. නෑ. ඒක අස්සෙත් රාජ්‍ය ත්‍රස්තවාදය තියනවා. ඒක තේරුම් ගන්න. රාජ්‍ය ත්‍රස්තවාදය ක්‍රියාත්මක කරලා එහෙම යට ගහන්න බෑ. රබර් බෝලයක් වතුර යට තියන් ඉඳලා අත ඇරපු ගමන් ඒක උඩට එනවා. ඒ වගේම මේ අරගලයට ගියාට පස්සේ රනිල් මොකද කරන්නේ. රනිල් ප්‍රශ්න වලට විසඳුම් හොයනවද. ජාත්‍යන්තර දිනලද. ඡන්ද 4 හැමදාම ජිනීවා වල ඇමරිකාවට විරුද්ධව. විසිහතක් විරුද්ධයි. 20 ක් දුන්නේ නෑ. රනිල්ට බෑ කරන්න හැබැයි. එයාට මෙහෙම කරන්න පුළුවන්. හොඳට මර්ධනයක් ක්‍රියාත්මක කරන්න පුළුවන්. 1988, 1989 දී රටේ වධ කඳවුරු 46ක මෙහෙයුම් නිලධාරියා වූයේ රනිල් වික්‍රමසිංහ. බටලන්ද වධකාගාරයේ අපි පක්ෂේ සහෝදරවරු, පක්ෂේ නොවන අය නියපොත්තෙන් එල්ලලා, කටට පෑන් බට ගහලා දස වධ දුන්නා. වධ කඳවුරු හතළිස් හයක් අධික්ෂණය කළේ රනිල් වික්‍රමසිංහ. එවැනි පාලකයකු ජනතාවට ආදරෙයිද. කිසිම තෙතමනයක් නැති නායකයෙක්. රනිල් ඒක තමයි දැන් ගේන්න යන මර්ධන අනපනත. අන්න ගේනවා, මොනවද, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත. ගෙනල්ලා විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ගේ කට වහන්න, වසන්ත මුදලිගේ ඇතුළු පිරිසක් අත්අඩංගුවට අරගෙන දානවා සිර කඳවුරු වල. එතනින් මේක නතර වෙන්නේ නෑ. දැන් මේක පවත්වාගෙන යන්න ඕනෑ.

අන්න ඊට පස්සේ ගේනවා පුනරුත්ථාපන කාර්යාංශ පනත කියලා එකක්. පෙර අරගලකරුවන් කියන වචනෙත් එක්ක. මොකටද මේ ගේන්නේ. මෙතනද ප්‍රජාතන්ත්‍රවාදය තියෙන්නේ. නැහැ. මේ ගේන්නේ මර්ධනය තුළින් මේක පවත්වාගෙන යන්න. අපි කියන්නේ සියලු දෙනා එක් වෙන්න ඕන. ඇත්ත රටට ආදරේ කරන මිනිස්සු නම් එක එක පක්ෂ වලට එක එක අඩුපාඩු නොවෙයි අපි කතා කළ යුත්තේ. අපි මේ රටේ ඇත්ත මිනිස්සුන්ට ආදරේ කරනවා නම් ඇත්ත බලවේගයක් ගොඩ නැගිලා මේ ප්‍රශ්නේ විසඳන්න ඕන. අන්න ඒ බලවේගයට අපි නායකත්වය දෙනවා ජාතික ජන බලවේගය විදිහට. ඒත් එක්කම මේ රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ නැත්නම් ජනාධිපතිවරයාගේ ද්‍රෝහී ක්‍රියාමාර්ගය පරාජය කිරීම සඳහා පක්ෂයක් විදිහට ඉදිරියටත් අපි අරගල කරනවා. අපි අරගලය අතාරින්නේ නෑ. අපි අරගලය විශ්වාස කරනවා. කවදාවත් ඔය පාලකයෝ බන්දේසියේ තියලා අපිට ජයග්‍රහණය දෙන්නෙ නෑ. ඒ නිසා මේ අරගලය තුලින් මේ ප්‍රශ්න අනිවාර්යෙන් විසඳලා මේ රටේ මිනිසුන්ගේ සැබෑ ප්‍රශ්න විසඳල පාලනයක් ගොඩනැගීම සඳහා පාර්ලිමේන්තු මැතිවරණයක් පවත්වන්න කියලා බලකිරීම අපි මේ මොහොතේ මේ සභාව තුළින් මතු කරමින් මෙම අයවැය කෙටුම්පතට ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙක් විදිහට විරෝධතාවයත් ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පළමුව මම මගේ කණගාටුව ප්‍රකාශ කරනවා අයවැයට මගේ විරුද්ධත්වය ප්‍රකාශ කිරිම පිළිබඳව පෞද්ගලික මතයක් නොව පොදුවේ මතයක් විදිහට. විශේෂයෙන්ම මම ජාතික දේශපාලනයට කතා කරන්න කැමති නැහැ. විපක්ෂයේ මන්ත්‍රීවරු ජාතික දේශපාලනයේ රනිල් මහත්තය ගැන, අනුර කුමාර මහත්තයා ගැන අටුවා ටීකා කියනවා. අපි විශේෂයෙන් ප්‍රාදේශීය සභාවක් තුල ඔබතුමිය පසුගිය අවරුද්ද තුල කරන ලද වැඩ මේ මන්ත්‍රීවරු එක්ක සහයෝගයෙන් කලාද කියන එකයි මට තියෙන ගැටළුව. පෞද්ගලිකව ගතහොත් ඔබතුමිය ගුරුවරියක් විදිහට මම ගරු කරනව. මේ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් අපි ඡන්දෙන් පත්වෙලා ආපු මන්ත්‍රීවරු. ඒ නිසා හෙට දිනයේ ඔබතුමිය සභාපති පුටුවට විරුද්ධව ඡන්දය පාවිච්චි කරල ඔබතුමිය සභාපති පුටුවෙන් යනකොට දුක්වෙන විදිහට තමයි ධර්මරත්න හේරත් මැතිතුමා එදා සභාපති පුටුවෙන් යන කොට දුක් වුනේ. ඒ හින්ද ඒ දුක එක සමානයි. ඔබතුමියගෙ ගෙට ගිනි තියපු වෙලාවෙ දුක්වුණ විධියත්, ශාන්ත බණ්ඩාර මැතිතුමාගෙ ගෙට ගිනි තියපු වෙලාවෙ දුක්

වුන විධියත් එක හා සමානයි. ඒ මනුස්සකම. ඒ නිසා මම ඔබතුමියට වාර ගණනාවකදී කතා කරල කීවා කණ්ඩායම් රැස්වීම පවත්වන්න කියලා. ඔබතුමිය අද වනතුරුත් කණ්ඩායම් රැස්වීම පැවැත්වුයේ නැහැ. ඔබතුමිය දන්නවා අර්බුද හමුවේ තමයි මේ කටයුත්ත කලේ. මම කවදාවත් සභාපතිවරයා විදිහට ඉල්ලුවෙ නෑ. මම තමයි වැඩිම ප්‍රතිශතය ගත්තේ මේ කොට්ඨාශ වලින්. ඔබතුමියගේ ප්‍රාදේශීය සභාවේ ඉදල පළාත් සභාවේ මහා මැතිවරණය දක්වා ඔබතුමියත් එක්ක ඡන්ද කලා. මටත් අවශ්‍ය නම් අයිතිය තිබ්බ මටත් ඕනෑ කියල ඉල්ලන්න. නමුත් අදටත් මම කියන්නෙ ඔබතුමාලා දෙන්නා ඒ කටයුතු වල නිරත වන හින්ද ගැටළුවක් නෑ. අපි අද ගන්න තීන්දු තීරණ, මේ සියළු තීරණ වලට වඩා හාත්පසින්ම වෙනස්. මම දැක්ක පසුගිය කාලය තුල ඔබතුමිය දක්ෂ පරිපාලන නිලධාරියක වුනත් අද මේ කටයුත්තේ සමහර කාරණා වලදී මුනිවත රැකපු ආකාරය ගැන මම කතා කරන්නෙ නෑ. විශේෂයෙන්ම සඳහන් කරන්නම ඕනෑ. සංවර්ධන කමිටු අපේ කාරක සභා අවස්ථාවේදී 2021 වසරේ මට හිමි විය යුතු ලක්ෂ 4 ක් පිළිබඳව අපි විවාදයක් පැවැත්වුවා. මම හිතනවා ඒ වෙද්දි සිමෙන්ති කොට්ටෙ රු.1800.00 යි. ගරු විපක්ෂ නායකතුමාත් , චමින්ද වර්ණසූරිය මැතිතුමාත් සාක්ෂි දරනවා ඇති රු.1800 ට තිබ්බ සිමෙන්ති කොට්ටෙ සියළු නිලධාරින් කතා කරනව රු. 1200 යි කියල, ඇස්තමේන්තු හදන්න බෑ කියල. එතකොට මම ඉල්ලනවා රු.1200 සිමෙන්ති කොට්ටෙට මම 1800 ක් ගෙවනවා. මම අතේ සාක්කුවේ සල්ලිවලින් රු.1800 ගෙවනවා කියනකොට සියලු දෙනා ඒකට විරුද්ධ වුණා. හිටපු මන්ත්‍රීවරු , විපක්ෂනායකතුමා, චමින්ද වර්ණසූරිය මන්ත්‍රීතුමා විශාල අරගලයක් කරල තමයි ඒකෙ අනුමැතිය ගත්තෙ. හැබැයි අද වෙනකොට හරිනම් ඔබතුමිය ඇතුළු කාර්ය මණ්ඩලය අපිව ගෙනල්ල අපේ යෝජනා ඉල්ලගෙන මේ කටයුත්ත ඔබතුමියගෙ විදිහට කරගෙන යන්න ඕනෑ. හැබැයි ඒකට අද වෙනකම් මගේ ඒ ලක්ෂ 4 ත් නෑ. 2022 අයවැයේ මුදලුත් නෑ. එකේ කිසි ගැටළුවක් නෑ. හැබැයි මම කියන්නේ අපි නිලධාරින් විදිහට මම පොඩි උදාහරණයක් දෙන්න කැමතියි. දේශපාලඥයෙක් විදිහට අපි ඇවිල්ල ප්‍රාදේශීය සභාවට අවු. 4 ක් වුණත් අපි ඇවිල්ල අවුරුදු 20 ක් විතර දේශපාලනය කලා ඇහෙන් නෙමේ ඔළුවෙන් . ඔළුවෙන් දේශපාලනය කරපු කෙනෙක් විදිහට ඔබතුමිය මේ පාලනය කරන්නේ ජනතාවත් එක්ක ජනතාවගේ ගැටළු නිරාකරණය කරන ආයතනයක්. විශේෂයෙන්ම උදාහරණයක් කියනවා නම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය සභාවේ පාලනය සමාන කරන්න බෑ ගරු සභාපතිතුමියනි. ඊට හේතුවෙන්නෙ ප්‍රාදේශීය ලේකම් පරිපාලන ව්‍යුහය හැදිල තියෙන්නෙ රාජ්‍ය නිලධාරීන්ගෙන් විතරයි. එතකොට ප්‍රාදේශීය ලේකම්තුමියට ඡන්ද ගොඩ නැගීම හෝ මිනිසුන්ගෙ සුබ විහරණය හෝ නොවේ. එතුමියගෙ චක්‍රලේඛත් එක්කයි එතුමියට යන්න පුළුවන්. ඒ නිලධාරිනුත් එහෙමයි. හැබැයි මේ ප්‍රාදේශීය සභාව ගත්තම නිලධාරින් හා සභාපතිතුමිය කටයුතු කරන්න ඕනෑ ජනතාවගේ ප්‍රශ්න වෙනුවෙන්. හැබැයි ජනතාව අතරට ගිහිල්ල මෙතෙන්ට ඇවිල්ල තමන්ගේ අවශ්‍යතා හදුනාගත්තේ නැත්නම් ඊළඟට පරිපාලනය සම්පූර්ණයෙන්ම බිඳවැටෙනවාමයි. හැබැයි ප්‍රාදේශීය ලේකම්තුමියට මොනව හරි ගැටලුවක් ආවොත් එතුමියට දෙන්නෙ ස්ථාන මාරුවක්. හැබැයි සභාපතිතුමියට අද මේ කතා කරන ඒවගෙ බුරුල තියෙන්නෙ මන්ත්‍රීවරු ඇතුලෙ කතා කරල නොකෙරිච්ච කොටස් තමයි අද ඔබතුමියට මේ සඳහන් වුනේ. එතනදි දේශපාලඥයෙක් කියල අපි දකිනවානම් ඔබතුමිය දක්ෂ වෙන්න ඕනෑ මේ 28 දෙනාම ඒකරාශි කරගෙන මේ එකිනෙකාට කතා කරල ප්‍රතිපාදන දෙන්න. JVP මන්ත්‍රීතුමාටත් හොරෙන් හරි කතා කරල ප්‍රතිපාදනයක් දෙන්න. ශ්‍රී ලංකා නිදහස් පක්ෂේ මන්ත්‍රීවරයටත් හොරෙන් හරි කතා කරල ප්‍රතිපාදනයක් දෙන්න. මේ චමින්ද වර්ණසූරිය මැතිතුමා මම පැහැදිවම දන්නවා මේ සභාව වෙනස් කරගෙන තියෙන්නේ. හැබැයි ඔබතුමියගෙන් මම දැක්කෙ නෑ ඒ කටයුත්ත. ඒ නිසා මම කොහෙත්ම කිසිම වෙලාවක සභාපතිවරයා ගෙදර යවන්න අත් උස්සන්න කැමති කෙනෙක් නොවෙයි. නමුත් මට අද ඒ කටයුත්ත කරන්න වෙනවා මේ පරිපාලනයේ තියෙන්නා වූ යම් යම් ගැටළු සම්බන්ධයෙන්. ඒ නිසා තව දෙයක් කතා කරන්නම් මේ සභාව පත් වූ දා ඉදල මේකේ නවක මන්ත්‍රීවරුන්ට ඉගෙන ගන්න හොද හැකියාවක් තියෙන අය ඉන්නවා. දැන් විශේෂයෙන් ගත්තහම ඉසුරු මන්ත්‍රීතුමා , ප්‍රියන්ත මන්ත්‍රීතුමා, යසිත් මන්ත්‍රීතුමා ඒ ගොල්ලො ඉස්සර එද්දි කතා කලේ ඒගොල්ලන්ගෙ

හොද ව්‍යාපෘති තියෙනවා. අපේ නීතිඥතුමිය ඉන්නවා. ගෙනල්ල අපිට පුළුවන් පක්ෂ විපක්ෂ නැතුව අපේ ප්‍රදේශයට හොද දේවල් කරන්න ඕනෑ. මේ සභාව තුල නිලධාරින්ගේ හෝ වේවා අනිත් අය හෝ වේවා කාගෙ හරි ව්‍යාපෘතියක් ගෙනල්ල කතා කරල ජනතාව අතරට යන විධියක් කවදාවත් මම දැක්කෙ නෑ. අපිට මාසයක් දෙන්න, මේ ජනතාව ගේන ව්‍යාපෘති අපි ගාව තියෙනවා. අපි කතා කලා නේද ඉසුරු මන්ත්‍රීතුමා, අපි දේශපාලනයෙන් තොරව ගොඩක් දේවල් කතා කලා. අපි අද වෙනකත් එහෙම දෙයක් දැක්කෙ නෑ. ඒ නිසා මම හිතන්නෙ කවදාහරි මේ 28 දෙනාගෙන් සභාපති පත්වෙනවා නම් මේ කරුණු කාරණාත් එක්ක තනියෙන් මේක යන්න එපා. ඒකෙන් ගැටලු ඇති වෙන්නෙ මේ ප්‍රදේශයේ මහජනතාවට. ඒ නිසා අපි 28 දෙනෙක් මිනිස්සු තෝරල එවල තියෙන්නෙ. එතනින් සුවිශේෂී වූ පුද්ගලයෝ 28 දෙනෙක්. මේ 28 දෙනාගෙ අදහස් 28 ක් වෙන්න පුළුවන්. එතකොට හොද අදහස් වෙන්න පුළුවන්, මධ්‍යම අදහස් වෙන්න පුළුවන්. සභාපතිවරයගේ වගකීම කියන්නෙ, දක්ෂතාවය තියෙන්නෙ මේ 28 දෙනාම මෙහෙයවලා 28 දෙනාගෙම අදහස් අරගෙන මේ සභා බල ප්‍රදේශය නියම විදිහට පරිපාලනය කිරීම කියන එකයි මම දැක්කෙ. ඒ නිසා කවදාවත් මේ සභාව තුළ ගැටළු ඇති වෙන්නෑ. JVP මන්ත්‍රීවරයා පොදු ජන ආණ්ඩුව විවේචනය කලා. සමහර අදහස් තියෙන්න පුළුවන් අපිට. හැම වෙලාවෙම විපක්ෂ නායකතුමා කතා කරන්නෙ කමිටුවක් තුල. අපි කමිටුවල කවදාවත් රණ්ඩු වුනේ නෑ. ඔබතුමා දැකල තියෙනවද රණ්ඩු වෙනවා. විපක්ෂ නායක තුමා ගත්තු තීරණ වලට විරුද්ධ වෙලා නෑ. අපි ගත්තු තීරණවලට විපක්ෂ නායකතුමා විරුද්ධ වෙලා නෑ. ඒ නිසා මම හිතන්නෙ ඔබතුමිය ගත්තු සමහර තීන්දු තිරණ එක්ක, මම දන්නෑ ඒ ඇයි කියල. අපේ 15 දෙනා සීසී කඩ ගියා. මෙතන කණගාටු වෙනවා අපේ පොහොට්ටුවේ තිබුනු මති මතාන්තර මේ සභාව තුල ගෙනල්ල අපේ යම් පුද්ගලික අදහස් මෙතන්ට හුවමාරු වීම සම්බන්ධව. ඒ නිසා මා ඒ සම්බන්ධව කණගාටු වෙනවා. ඒ කෙසේ වෙතත් මම හිතන්නෙ නෑ "පරාජය වෙන්නො පරාජය වෙයි. ගෙදර යන්නෝ ගෙදර යයි." නොවේ අපි පණිවිඩයක් දෙන්න ඕනෑ. නැත්නම් කවදාවත් මෙතන්ට කිසිදු පුද්ගලයෙක් මේ තනතුරට එනතුරු බොහොම සුහදයි, සාමූහිකයි. මෙතන්ට ආවට පස්සේ මේ මති මතාන්තර හැමදෙයක්ම අමතක වෙනවා. උදාහරණයක් ලෙස ගත්තහම මම පසුගිය ආපදා දවසේ පාරවල් 23 ක් දාල තියෙනවා. එතකොට පාරවල් 23 න්ම මම හදපු පාරවල් තියෙනවා. අවුරුදු 74 කින් පස්සෙ හදල තියෙන්නෙ කුඩුමුල්ල කපුවරල යා කරන මාර්ගය. එකට මට ප්‍රතිපාදන හම්බවුනේ රු. ලක්ෂ 2 යි. මම ලක්ෂ දෙකෙන් දාල තිබ්බේ පස් කියුබ් 110 යි. නමුත් මම පස් කියුබ් 170 ක් දාල පිරිතක් කියල ගම් දෙක යාවෙන්න, 300කට කෑම දීලා. මම ඒකෙන් ගම් දෙක යා කලා. නමුත් ඊට අවුරුදු 2 කට පස්සේ මේ නාය ගිය වෙලාවෙ කතා කරල පස් ටිකක් දාල දෙන්න කියල කිවුවම අපේ තාක්ෂණ නිලධාරී මහත්තයා කියනවා ඒ පාර නුසුදුසු පාරක් කියල. එතුමාගෙ ගේ තියෙන්නෙත් ඒ පාරේ. නුසුදුසු පාරක් කියල මේ සභාවේ තාක්ෂණික අංශයේ ඔබතුමාල දැකල ඇති මම වාද කරල පිටත් වෙලා ගියා. මෙතුමා මාව ආපසු කැඳවගෙන ආවා. ඉන්පසු මාස 3 කින්, 4 කින් තාක්ෂණික නිලධාරීතුමා ඇවිත් මේ පාරට පස් පුරවනවා මම නැතිව. හැබැයි එතුමා අවුරුදු ගාණක් තාක්ෂණ නිලධාරී වෙලාවත් මේ පාර හදාගන්න බැරිවුනා. කිසි ගැටලුවක් නෑ. හැබැයි අපි මේ තීන්දු තීරණ ගනිද්දි මේ අන්තිම මොහොතේ වාදයකට විතරක් ඇවිල්ල අපි ඔවුන්ට කතා කරල වැඩක් නැහැ. අපි මන්ත්‍රීවරු, අපි සියලු දෙනාම මනුස්සයො. අපි සන්තර්පනය කරන්න ඕනෙ. මිනිස්සු වෙනුවෙන් කතා කරන්න ඕනේ. හැමදෙනෙක්ම මේ සභාවට ඇවිල්ල තියෙන්නේ යම් කිසි පුද්ගලයෙකුට උදව්වක් කරල යම් කිසි ප්‍රසාදයක් ගන්න. ඊලග සැරේ ඡන්දය ඉල්ලනවද නැද්ද කියල නොවෙයි. ඊට වැඩිය පසුගිය පොහොට්ටුව අපේ පාලන සමයේ මිනිස්සු හිටියෙ හැංගි හැංගි. ජනතාව වෙනුවෙන් වැඩක් කල යුතුයි. ඒ නිසා මම වෙන කිසිදු ද්වේශයක් හෝ වෛරයක් හෝ වෙන කිසිඳු දෙයක් ඔබතුමිය එක්ක නැහැ. ඒ ගෞරවය අදටත් හෙටටත් තියෙනවා. මේ යන ක්‍රමයට මම විරුද්ධයි. අපි කොච්චර තීන්දු ගතත් දේශපාලනය තුල තියෙන්න ඕන පක්ෂ දෙශපාලනයෙන් එහා ගිය දේශපාලනයක්. ඒක තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. ඒ නිසා හැම කෙනෙකුටම සමාන අයිතිවාසිකම් ලබා දෙන්න ඕන. දේශපාලනයේ උඩට එන්න ඕනෑ දක්ෂකම් වලින් . එහෙම නැත්නම් කාට හෝ ගොට්ට අල්ලලා හෝ එහෙම

නැත්තම් ඒ මනුස්සයාට පාත්කුඩම් දීල හෝ පස්ස දොරෙන් හෝ නොවෙයි. දේශපාලනය එක හා සමානව ගියාම දක්ෂ නිර්මාණශීලි පුද්ගලයා ඉදිරියට එයි. එවැනි සංස්කෘතියක් ඇති කරන්නට මේ ප්‍රාදේශීය සභාවේ හෙට ඔබතුමිය කටයුතු කරනවා නම් එකෙත් අපිට ගැටලුවක් නැහැ. නමුත් මේ අයවැයේදී තවදුරටත් මම බලාපොරොත්තු වෙන්නෙ ගිය පාර අපි විරුද්ධව ඡන්දය දෙද්දි සමගි ජන බලවේගයේ ඉන්න අපේ මන්ත්‍රීතුමන්ල පක්ෂව ඡන්දය දුන්න. හැබැයි ඔබතුමිය ඒ අය දිනා ගන්නවත් අද වෙද්දි කටයුතු සිදු කරල නැහැ. ඉතින් අපි දිනාගන්න නොවෙයි දුන්නු ඡන්ද 6 දිනාගන්න කටයුතු කරල නැහැ කියන එක මේ සභාවේ ප්‍රකාශ වුනා. ඒ නිසා මම ඉතාමත් කණගාටු වෙනවා. කණගාටුවෙන් වුවත් අද දිනයේදී අපි සාමූහික තීරණයක් විදිහට මේ අයවැයට විරුද්ධව ඡන්ද ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ නිසා යම් කිසි සිත් තැවුලක් වුනානම් කණගාටුව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය**

ගරු සභාපතිතුමියනි, ඔබතුමියත් එක්ක අපි කාන්තාවෝ 7 දෙනෙක් මේ සභාවේ ඉන්නවා. මම මේ සභාවට ආපු දවසෙත්, ඇවිල්ල ටික දවසකිනුත් කීව කාන්තා දිරිගැන්වීම් වලට තැනක් දෙන්න. අපිට ගම්වල ගිහිල්ල යම් දෙයක් කරන්න කියල. මේ සැරෙත් අයවැය කෙටුම්පතේ තියෙන්නෙ ලක්ෂයයි. දැන් ගමකින් එක් කෙනෙක් දෙන්නෙකුට අද රටේ පවතින ප්‍රශ්ණයත් සමඟ කාන්තාවන්ට තමයි ගෙදර සියලුම දේවල් කරගෙන යන්න සිදු වෙලා තිබෙන්නෙ. ඒ අනුව ඇත්තටම කාන්තාවට යම් කිසි ස්වයං රැකියාවක් හරි කරගන්න අපි යමක් පුහුණු කරල තිබුණනම් අද මේ රටේ තිබෙන ප්‍රශ්නෙට කාන්තාවට පොඩ්ඩක් මුහුණ දෙන්න පුළුවන් කමක් තිබුණ. මේ අයවැය ඇතුලෙත් කාන්තාව වෙනුවෙන් රු. ලක්ෂයක් තමයි වෙන් කරල තියෙන්නේ. ඒ නිසා ඒක ප්‍රමාණවත් මදි. අපි සභාවේ නිලධාරි මණ්ඩලය ගත්තත් හැම තැනම වැඩිපුර ඉන්නෙ කාන්තාවො. ඉතින් ඒ නිසා අපි හත් දෙනෙකුටම තමන්ගෙ කොට්ඨාශය තුලවත් යමක් කරන්න ශක්තියක් නැති මට්ටමට අපි ඇවිල්ල. මොකද අපිටත් යම් කිසි පුහුණුවක් දීල තිබුණනම් අපිටවත් තිබුණ ඒ ගමේ කොට්ඨාශ වල කාන්තාවන් දිරි ගැන්වීමෙ වැඩ පිළිවෙලක් කරන්න. ඒ වගේ වැඩ පිළිවෙලකුත් මේ වාර්තාවේ නෑ. ඒ අනුව බැලුවහම අයවැයේ පොඩි පොඩි අඩුපාඩුකම් තියෙනවා. නමුත් අද රටේ පවතින දේශපාලන අර්බුදයත් සමඟ කාටවත් කතා කරන්න බැරි, ඉස්සර මොන දේකට හරි ඉදිරිපත් වුනොත් නොයෙක් නොයක් මත අනුව සිරගත කරන ඒ වගේ තත්වයක් අද උදාවෙලා තියෙන්නේ. ඒවගේ තත්වයකදී අපිට අයවැයට පක්ෂව ඡන්දය දෙන්න බැරිව යනවා. මොකද අපි ගිය සැරේ කිසිම භේදයකින් තොරව අයවැයට පක්ෂ වුනා. නමුත් අපි කෙරේ කිසිම වැඩ පිළිවෙලක් අද වෙනකනුත් යොදා තිබුනේ නැහැ. ඒ නිසා කණගාටුව ප්‍රකාශ කරනවා. ඒ අතරෙ JVP එකේ මන්ත්‍රීතුමා කිවුව එයලගෙ පක්ෂයෙ තිබෙන වටිනාකම. මට අවුරුදු 14 - 15 කාලෙදි මට මතකයි ඒ ගොල්ලන්ට විරුද්ධව වචනයක් කතා කලොත් ඒ කතා කරපු අය මරල ගෙනියන්න දුන්නෙත් නෑ දනිස්සෙන් උඩට උස්සගෙන. මොකද මම ඇහැටම දැක්ක සිද්ධියක් කොට්ටවත්ත ප්‍රදේශයේ මාම කෙනෙක් JVP එකට විරුද්ධව වචනයක් කතා කලා කියල උදලු බන්දෙන් ගැහුව. ගහල මැරුණෙ නැතුව භාගෙට වලක් කපල වලේ වතුර ටික බොද්දිත් උදැල්ලෙන් ඔලුවට ගැහුව. එහෙම ගහල තමයි වැලලුවේ. ඉතින් අපි ඒ කාලෙ තරුණ කාන්තාවො නිසා අපි හිටපු වත්තේ වලවල් කපල වලවල් ඇතුලට වෙලා ඉදගෙන රෑ තිස්සෙම නිදි මැරුවා. ලාම්පුවක් පත්තු කරගන්න ක්‍රමයක් තිබුනෙ නැහැ. ඉතින් ඒ වගේම මේ යසිත් මන්ත්‍රීතුමා ඉපදිලත් නැහැ. එහේ අපි 8 දෙනෙක් හෝ 9 දෙනෙක්, මාස 3 ක් 4 ක් අපේ පවුල හිටපු තරුණ කාන්තාවො ටික එහෙ තමයි හිටියේ. ඒවගේ යුගයක් තිබුන. ඒ යුගය මතක් වෙනකොට ඇත්තටම අපිට මෙයාලට පක්ෂව වචනයක් කියන්න බෑ. මොකද ඒ තරමම අපේ ඒ කාලේ මන්ත්‍රීවරු ගුරුවරු වගේ රටේ හිටපු දේශපාලඥයො ග්‍රාම නිලධාරිවරු, කලාකරුවො, වගේ වැඩක් ඇති හොඳ පිරිසක් අර විදිහට තමයි අමු අමුවෙ මරා දැමුවේ. මට මතකයි මැටියගනේ ග්‍රාම නිලධාරි කෙනෙක් මරල මම ඉස්කෝලෙ යන්න යන කොට දනිස්සෙන් උඩට උස්සන්න දෙන්නෙ නැහැ. එල්ලගෙන යනවා. අපේ ගෙදරටත් හැන්දෑවේ ඇවිල්ල ඔය 89 කාලෙ මම රස්සාව අරගෙන හිටියෙ. ගෙදර

ඉන්නකොට තුවක්කුව දික් කරල මගෙන් පඩිය ඉල්ලුව. මම පඩි අරන් ආපු දවසට පහුවදා. ඉතින් ඒ වගේ පුදුම බයකින් තමයි අපි ඒ කාලේ ජීවත් වුනේ. ඒ යුගය නැවතත් ආවොත් අපිට මොන මොන තත්වයක් උදා වෙයිද කියල ලොකු බයක් තියෙනවා කියල මතක් කරමින් මා නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, බොහෝ වෙලාවට දේශපාලඥයෙක් විදිහට පැමිණෙන අන්තිම දවස වෙන්න පුළුවන් අද දවස. ඒ කෙසේ වෙතත් මා දේශපාලන දිවියට ආපු දවසේ ඉදල මේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් විදිහට අද වෙනකම් සභාපතිවරුගෙන් මට පුළුවන් විදිහට මගේ ප්‍රදේශයේ ජනතාවට යම් අයුරින් සේවයක් සැපයුවා. ඒ වගේම විශේෂයෙන්ම සභාපතිතුමියට ස්තුති වන්ත වෙන්න ඕන හිටපු සභාපති ගාමිණී ගුණදාස මැතිතුමාගේ සිට ප්‍රදේශවාසින් දේශපාලන ක්‍රියාකාරින් විසින්වත් කර ගන්න බැරි වුන හුම්බුළුව කලල්පිටිය මාර්ගය පසුගිය දිනක අඩි 16 කට පළල් කරල කුඤ්ඤ ගහල ගැටුමකින් තොරව ඒ මාර්ගය ජනතාවට අවශ්‍ය විදිහට මට සංවර්ධනය කරගන්න අවස්ථාව ලැබුනා. හැබැයි හිටපු ගරු සන්ධ්‍යා සභාපතිතුමාගෙන්වත්, වැඩ බලපු උප සභාපතිතුමාගෙන්වත් ඔබතුමියගෙන්වත් මට විශේෂ වරදාන වරප්‍රසාද ලැබුනෙ නැහැ. ඉතින් ගිය අවුරුද්දේ 2022 අවුරුද්දෙත් මගේ ප්‍රතිපාදන වලින් මට කරගන්න පුළුවන් වුනේ රු. ලක්ෂෙක වැඩ විතරයි. ඊට පස්සේ අනෙත් ඒවගේ ඇස්තමේන්තු හදන්න ලෑස්ති වෙනකොට චක්‍රලේඛයක් ඇවිල්ල තිබුණ ව්‍යාපෘති නවත්වන්න කියල. ඒ රටේ තිබුන ප්‍රශ්ණෙත් එක්ක. මම දේශපාලනය කතා කරන්න යන්නෙත් නැහැ. කාටවත් ඇගිල්ල දික්කරන්න යන්නේ නැහැ. ඒ මොකද මම මෙතනින් එළියට බැහැලා ගිහාම මම මේ සභාවේ විවේචනයට ලක් වෙනවාට කැමති නැහැ. ඒක නිසා මේ දේශපාලන රටාව තුල හැමදාම මිතුරෝත් නෑ, හැමදාම හතුරොත් නෑ. ඒ වගේම කිසිම කෙනෙක් අමනාප කරගෙන කාගෙන්වත් ගැටුමක් ඇති කර ගැනිමට මට අවශ්‍ය නැහැ. ඒ වගේම දේශපාලනයෙන් හම්බකර ගත්තු දෙයක් නැහැ. මගේ වැටුපෙන් මම කරගත්ත දේ දේශපාලනයට ඇවිත් මට කරගන්න බැහැ. පසුගිය කොරෝනා කාලයේ කොරෝනා ලෙඩ්ඩු කෝල් කරන කොට කන්න දෙයක් නෑ කියන කොට පුළුවන් විදිහට රු. 500.00 ක් හරි, ගෙදර තිබුන හාල් ටික හරි ගිහින් දුන්නා. මේ දේශපාලනය තුල මට වුනේ මම නැතිවුන එක පමණයි. නමුත් ශාන්ත බණ්ඩාර මැතිතුමා මට රස්සාව දුන් නිසයි මම අද කාල ඇඳලවත් ඉන්නේ. ඒ නිසා මම එතුමාට ගරු කරනවා. දේශපාලනයට ආව කියල සභාවෙන් දෙන දීමනාවෙන්වත් ගෙදරට දෙයක් කරන්න නෑ. තියන ණය ටික ගෙවන්න, කුලී ගෙවන්න ඕන. ඒ නිසා තමයි දේශපාලනයෙන් සමුගන්න තීරණය කලේ. ඒ කෙසේ වෙතත් දිවංගත සන්ධ්‍යා සභාපතිතුමා, ධර්මරත්න හේරත් අපේ වැඩ බලපු සභාපතිතුමා, පත්මා වැත්තැව මැතිනිය ඔබතුමියත් මේ කාල පරාසය තුල මගේ කොට්ඨාශය තුල මගේ ජනතාවට වැඩ කරන්න මට ශක්තිය දුන්නා. ඒ දේවල් කරන කොට සමහර වෙලාවට ලියුම දීල මම හිටියෙ නෑ. ලේකම්තුමියටත්, සභාපතිතුමියටත් කොල් කරනවා. සන්ධ්‍යා සභාපතිතුමා ඉන්නකොට ගෙදරටත් යනවා. ධර්මරත්න හේරත් මැතිතුමාටත් මම කතා කරනවා. පෝය දවසේ දවසක් කතා කරන කොට මෙතුමා සිල් සමාදන් වෙලා හිටියෙ. ඒ වගේ ජනතාවට සේවය කරන්න බොහොම කැපවීමෙන් මම මෙතෙක් කල් කටයුතු කලා. සමහර වෙලාවට මම හිතනවා මේ මට පැමිණෙන්න තියෙන අවසාන දිනය වෙයි කියලා. කෙසේ වෙතත් ඔබ සියලු දෙනා ගැටලුවකින් තොරව මේ සභාව ගෙනියන්න මහජනතාවට සේවය කරන්න හැකි ආයතනයක් බවට පත් කර ගන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා. මොකද ඔය ඉහල කිසිම කෙනෙක් පහල ඉන්න අපි දිහා කවදාවත් බැලුවෙත් නෑ, බලන්නෙත් නෑ. ඒක තමයි ඇත්ත. අන්තිමට අපිට එළියට බැස්සට පස්සෙ අපිට ඉතුරු වෙන්නෙ විවාහකයෙක් නම් තමන් බිරිඳත් දරුවොත් පමණයි. වෙන කිසිම කෙනෙක් නැහැ. ඒ නිසා තමන්ගෙ හදවතට එකඟව සේවය කරන්න. එවිට අවසාන හුස්ම යන මොහොතේ තමන්ට නිදහසේ මැරෙන්න පුවවන්. මම සේවය කෙරුව කියන එකට සාක්ෂියක් ලෙස සන්ධ්‍යා සභාපතිතුමාගේ කාලේ වසර ගණනාවක් පරණ විශාල කොස් ගහක් පක්ෂ විපක්ෂ සියලු දෙනාගෙ ආශිර්වාදයෙන් ඉඹුල්

ගොඩ විහාරස්ථානයට පූජා කරන්න හැකියාව ලැබුනා. ඒ ලී ඉරුවට පස්සේ ස්වාමීන් වහන්සේ කිවේ ලක්ෂ 12 ක පමණ ලී තිබුණ බව. ඒ ලී වලින් විහාරස්ථානයේ මේස පුටු , ජනෙල්, දොරවල්, ඇඳන් සියල්ල සම්පූර්ණ කලා. ඒ නිසා මම ගරු සභාපතිතුමාට හා සියලු මන්ත්‍රීවරුන්ට පින් අනුමෝදන් කරනවා. ඒ වගේම අපේ මන්ත්‍රීතුමෙකුට ලක්ෂ 2, 3, 4, 5 ක් තමයි උපරිම ලැබෙන්නෙ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට ලක්ෂ 100 ක් විතර ලැබෙනවා. අපිට හම්බවෙන සුළු මුදලින් තමයි පාරට කොන්ක්‍රිට් ටිකක් දාන්නේ. බොරළු ටිකක් දාන්නෙ. පසුගිය දවස්වල පාරවල් කිහිපයක් කාපට් කරන්න හැකි වුනා. පාරවල් කිහිපයක් කොන්ක්‍රිට් කරන්න හැකි වුනා. ඒ සියල්ලටම මට ශක්තිය ලැබුනෙ මන්ත්‍රිවරු සහ හිටපු සභාපතිතුමන්ලා, ඔබතුමිය සහ මේ නිලධාරින් නිසයි. පසුගිය දවස්වල මම ආයුර්වේද සායනයකට ඉල්ලීමක් කලා ඒකට සභාවේ අනුමැතිය ලැබුණා. වෛද්‍යාතුමිය කිවේ කරපු සායනවලින් වැඩිම පිරිසක් ආපු සායනය කියල. එය සිදු කලේ ඉඹුල්ගොඩ විහාරස්ථානයේදී. එයට සභාපතිතුමිය, ලේකම්තුමිය, ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය ඇතුළු පිරිස මට සහය ලබාදුන්නා. මම ඔවුන්ට ගෞරවය පුද කරන්න ඕනෑ. ඒ වගේම පසුගිය දින පුරාවටම හුම්බුළුව ප්‍රදේශයේ වතුර නැහැ. මම සභාපතිතුමියට, ලේකම්තුමියට කතා කලාම වතුර බවුසරය ලබා දෙනවා. ඒ වතුර ජනතාවට බෙදල දෙනවා. මේ කිසිම දෙයක් මට ලැබුණු විශේෂ වරප්‍රසාද නොවෙයි. ඒ සියල්ල මම ගත්තේ ජනතාව වෙනුවෙන්. මට රුපියලක් වත් වැඩියෙන් දීලත් නැහැ. ප්‍රතිපාදනවත් ව්‍යාපෘතිවත් වෙනම දීල නැහැ. සියලු මන්ත්‍රිවරුන්ට හිමි ව්‍යාපෘති විතරයි මම කලේ. ඒ සියල්ල කලේ වරදාන වරප්‍රසාද, තනතුරු පස්සෙ යන්න නෙවෙයි. මට ඡන්ද 1500 ආසන්න ප්‍රමාණයක් ලැබුණා. ඒ ඡන්දය දුන් ජනතාවට ගෞරවයක් ප්‍රණාමයක් විදිහට මට කරන්න පුළුවන් දේ මම කලා. කිසිම කෙනෙකුගෙන්වත් රුපියලක්වත් පගාවක්වත්, ජරාවක්වත් අරගෙන නැහැ. එහෙම වුනා නම් මටත් මෙවැනි ආකාරයට පත් වෙන්න අවශ්‍ය නැහැ. මම ගොඩක් වෙලා කතා කරන්නේ නැහැ. මම හැමෝටම කියන්නේ එකතු වෙලා අලව්ව ප්‍රාදේශීය සභාවෙන් අලව්ව පුරවරයේ ජනතාවට රුපියලකින් හරි දෙයක් කරන්න පුළුවන්නම් අන්න ඒ දේ කරන්න සහයෝගය ශක්තිය ලබා දෙන්න කියමින් මම නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, 2022 අයවැය කෙටුම්පත අදායම් වශයෙන් 179,487,386.00 සහ වියදම් වශයෙන් 179,487,000.00 ක ඇස්තමේන්තුවක් සමඟ අයවැය කෙටුම්පත මේ සභාවට ඉදිරිපත් කලා. මීට ප්‍රථම පසුගිය 29 වෙනිද මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට ඉදිරිපත් කරල ඒකච්ඡන්දයෙන් සහා සම්මත කරල මහ සභාවට යොමු කරන්න අවස්ථාව උදා කරල දුන්නා. විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ ප්‍රාදේශීය සභාවක අයවැය මේ තරම් උණුසුම් වුනේ ටික කාලෙකට උඩදි. ප්‍රාදේශීය සභා ආරම්භයේ ඉදන් බලපුවම ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා ගමේ ජනතාවට වඩාත් විපුල සේවයක් ඉෂ්ඨ සිද්ධ කරන්න ගමේ ජනතාව වගේම නියෝජිතයින්ට විධායක බලතල සහිත මේ පනත ස්ථාපිත කරල තිබුන. කාලයාගේ ඇවෑමෙන් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලෙදී මේ පනත, රීතිමාලාව වෙනස් කරල අයවැය පැරදුනොත් සභාපතිවරයා ඉවත් කිරිමේ බලය ස්ථාපිත කලා. එය කොච්චර දුරට හොඳ ද නරකද කියන එක ඒ ආණ්ඩුවම තේරුම් අරගෙන එය නැවත සංශෝධනය කරල පසුගිය අයවැයේ ප්‍රාදේශීය සභා පනතේ 184 වන වගන්තියේ අදාල අමාත්‍යාවරයාට, ආණ්ඩුකාරවරයාට ලැබී තිබෙන බලතල ප්‍රකාර රීති මාලාව සංශෝධනය කරල එවල තිබුණා. ගිය අයවැයේ ඒ ගැන වැඩි අවබෝධයක් අපිට තිබුනෙ නැහැ. ළගදි දින කිහිපයකට උඩදි සංශෝධන රීති මාලාව යොමු වෙලා තිබුනේ අධ්‍යනය කරන කොට අද මේ රීති මාලාව අනුව අයවැය මේ වන විට 100% ඉටුවෙලා තියෙන බව ඉතාම අවබෝධයෙන් ප්‍රකාශ කරන්න ඕනෑ. මේ අයවැයේ සංශෝධන වලට අවස්ථා රීති මාලාව තුලම සඳහන් වෙලා තියෙනවා. ඒ අවස්ථා එකක්වත් මේ සභාව ප්‍රයෝජනයට ගත්තද කියන එක දෙපාරක් හිතන්න වෙනවා. මහජන නියෝජිතයෙක් හැටියටත්, අපේ මුදල් ප්‍රතිපත්ති කාරක සභාව නියෝජනය කරන නියෝජිතයෙක් හැටියටත් මගේ ප්‍රදේශය පිළිබඳව අවධානය යොමු කරලා මම ඒ අවස්ථාව ප්‍රයෝජනයට ගත්තා. ඒ

ගැනීම තුල මගේ යෝජනා සියල්ලම ඉෂ්ඨ කරගන්න බැහැ. අපේ ආදායම් තත්වය දිහා බැලුවහම අපිට ඉල්ලීම් ගොඩයි, වියදම් බොහෝයි. නමුත් ආදායම දිහා බලනකොට මේ මන්ත්‍රීවරු 28 දෙනාගෙම ඉල්ලීම් වලට ලබා දෙන්න තරම් ආදායමක් මේ සභාවේ තියනවද කියන එක සත් භාවයෙන් යුක්තව අපි කල්පනා කල යුතු වෙනවා. අපේ සභාව, කොළඹ මහ නගර සභාවට සමාන කරන්න බැහැ. අපිට තියෙන ආදායම අනුව අපේ කොට්ඨශ ක්‍රමය තුල අපේ ජනතාවගේ ප්‍රශ්න වලට යම් හෝ පිළිතුරක් ලබා දෙන්න මහජන නියෝජිතයො හැටියට ගිය අයවැයෙන් වගේම මේ අයවැය කෙටුම්පතේ සඳහන් කරල තියෙනවා. ගිය කෙටුම්පතට වඩා මේ කෙටුම්පතේ එක් කාරණයක් දිහා මගේ ප්‍රසාදය පළකර සිටිනවා. අපි සියලු දෙනාම ගම්වල නියෝජිතයො හැටියට සභාව නියෝජනය කරන්නෙ එකම පන්තියක, එකම තලයක, එකම ජීවන රටාවක ඉන්න පොදු ප්‍රශ්න තියෙන ජනතාවක්. ඒ ජනතාවට සේවය කරන්න ගියවර විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුට ලක්ෂ 3 කුත් ආණ්ඩු පක්ෂයේ අයෙකුට මන්ත්‍රීවරයෙකුට ලක්ෂ 5 කුත් වෙන් කරල තිබුනා. නමුත් මෙවර හැම කෙනෙකුටම ලක්ෂ 5 ක් ආදායමේ හැටියට වෙන් කිරීම පිළිබඳ මගේ ප්‍රසාදය පලකර සිටිනවා. විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. පසුගිය අවුරුද්ද දිහා බලන විට අපි මොනවත් කරලම නැහැ වගේ. පසුගිය මුදල් ප්‍රතිපත්ති කරක සභා 8ක 9ක වැඩ වලට යන වියදම අපි අනුමත කරල තියෙන්නෙ මොකටද? අවබෝධයෙන් නොවේද? ඒව මහජන සේවය නොවේද කියන එක අපි අපෙන්ම ප්‍රශ්න කරගන්න සිදු වෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමියටත් 2022 අයවැයත්, මේ අයවැය ලේඛනය තුලත් කොට්ඨාශ සඳහා වීථි පහන් ලබාදෙන ක්‍රමය ඉතාම හොඳයි. අපේ කොට්ඨාශයේ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමාගෙ වීථි පහන් සවි කරද්දි හවස් වුනා. බල්බ් දෙකයි ඉතුරු තිබුනේ. ඒ ගැන කිවුවම නැවත දිනයක් ඒ වෙනුවෙන් මට ලබා දීල තිබුනා. ඒ අවස්ථාවේ අක්‍රීය වූ වීථි පහන් ලේඛනය යථා තත්වය පත් කරන්න කටයුතු කලා. ඒ ඇරුණම කිසිම පෞද්ගලික වෙනත් උපකාරයක් මේ සභාවෙන් සිදු කරල නැහැ. ඒ ගැන මම අමනාප වෙනේනේ නැහැ. මම එකක් මතක් කරන්න ඕනෑ. 2022/02/10 මම "අබලන් වූ මාර්ග කිහිපයක් යථා තත්වයට පත් කිරීම සඳහා මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය දින දෙකක් ලබාදිම" යෝජනාවක් ඉදිරිපත් කරල තියෙනවා. ගරු සභාපතිතුමියනි, "අංක 08 මා විසින් නියෝජනය කරන බෝයවලාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් නැබඩවතුර ග්‍රාම නිලධාරි වසමේ දුෂ්කර වූ මාර්ග කිහිපයක් යථා තත්වයට පත් කර ගැනිමට මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි. මෙය හදිසි කඩිනම් යෝජනාවක් නොවන බැවින් ඔබතුමිය විසින් පෙළ ගස්වා ඇති ප්‍රමුඛතා ලේඛනය ඇතුලත් කර සභාව අපහසු තත්වයට පත් නොවන දිනයක් මා වෙත ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි." මම හිතනවා ඒ දිනය ලබාදිමට ඔබතුමියට අපහසුතාවයක් තියෙනවා කියල. මගේ අමනාපයක් නැහැ. නමුත් මම දන්නවා සභාවේ තියෙන තත්වය මොකද්ද කියන එක. මගේ යෝජනාවට ලක්ෂ 3 ක් යෝජනා වෙලා තිබුනත් ඇස්තමේන්තු කලහම ලක්ෂ හයක් හතක් යනවා. නමුත් ග්‍රාම සංවර්ධන සමිතියේ ගිණුමෙන් ඉතිරි සල්ලි ටික දමා, තාර දමා සංවර්ධනය කරන්න අපේ ගමේ ජනතාව එකමුතු වෙලා ඒකට අනුමැතිය ලබා දුන්නා. නමුත් හදිසි මිල වැඩි වීමත් එක්ක ඒ ගැන හිතන්න තරම්වත් මුදලක් නොවෙයි ඒක. ඒ නිසා ඒ යෝජනාව එහෙමම තිබිලා ඒ යෝජනාව බොරළු හෝ වැලි හෝදන පස් දාන්න අනුමත වෙලා තිබුනත් තාම ඒ ගැන ක්‍රියාත්මක වුනේ නැහැ. ඒකයි මේ යෝජනාව අපේ ගරු අරුණ ජයලත් මන්ත්‍රීතුමා එතුමාගේ අදහස් දැක්වීමේදි ප්‍රකාශ වුනා. අද න්‍යාය පත්‍රයට ඒ යෝජනාව විතරක් දැම්මේ කියල අලුත් යෝජනාවක් නොවෙයි. 2022 සම්මත වුන යෝජනාව දැන් තියෙන තත්වය උඩ අනුමැතිය ලබා ගන්නයි යොමු කලේ. චක්‍රලේඛය අපි හැමෝටම ලැබුනා. ඒක කියෙව්වද නැද්ද කියන්න දන්නේ නැහැ. කියවපු අයට තේරෙනවා මොකක්ද බ්‍රේක් එක කියල. ඒක සභාවක් හැටියට ලේකම්තුමියවත්, අපි සභාවවත් පලි නැහැ. උඩ තීරණ වලට අපි යට මහජන ආයතන අනුගත වෙන්න වෙනවා. ඒක නැවත වැඩ කරන්න කාටවත් බැහැ. අපි එය අවබෝධ කරගත යුතුයි. ඒ නිසා මේ අවයැය ලේඛනය පිළිබඳ මගේ ප්‍රසාදය පල කරන අතර එය ක්‍රියාත්මක කිරිමට මගේ පූර්ණ සහයෝගය ලබා දෙනවා. මේ අයවැය මේ අවුරුද්දට අදාල නැහැ. ඊලග අවුරුද්දේ පෙබරවාරි වෙනකොට අපේ සභාවේ ආයු කාලය ඉවරයි. අද ගම් වල මිනිස්සුන්ගේ ප්‍රශ්න නැතුව

නොවෙයි. ඒ ප්‍රශ්න වැඩි නොකර ටිකක් හරි තුනී කරන්න දායක වෙනවා නම් ඒක තමයි මහජන නියෝජිතයින්ගේ වගකීම. අනිත් වගකීම මේ සීමාව තුල කරන්න මේ මාස කිහිපය අපි හැම කෙනෙකුටම මේ ආයතනය තුලින් ලැබෙනවා. ඒකට අපි සියලු දෙනා එකතු වෙන්න ඕන. එහෙම එකතුවෙන්නේ නැති වෙන්න හේතුව තියෙනවා. ඒක අපිට අදාල නැහැ. නමුත් සභාවක් හැටියට කල්පනා කරලා මේ අසරණ ගම් වල ජනතාවට යම් සහනයක් ලබා දෙන්න යම් මෙහෙයක් ලබාදෙන්න මේ ආයතනය තුලින් අපි සියලු දෙනා පටු විදිහට හිතන් නැතුව වැඩ කරන පැත්තෙන් හිතුවොත් තවත් අවස්ථා එමට තියෙනවා කියල අවධාරණය කරනවා. ඊලග මැතිවරණය වෙනකොට මෙතන අපි කවුරු ඉදීද නැතිවෙයිද කියන්න බෑ. අපි ඉල්ලන්නත් පුළුවන් නොයිල්ලන්නත් පුළුවන්. ඒ මැතිවරණයේදී සමාජ පරිවර්තනයක් සිදු වෙනවා. ප්‍රතිපත්ති වලින් සිද්ධ කරනවා. ඉදිරියේදී අපි සියලු දෙනාටම ඒක අවබෝධයෙන් දැනගන්න පුළුවන් වෙයි. එතෙක් මේ වැඩ පිළිවෙල සාර්ථක කර ගන්න කඩාකප්පල් කරගන්නැතුව සහයෝගය දීම සෑම පුරවැසියෙකුගේම වගකීමක් වෙනවා. ඒ වගකීම දේශපාලඥයෝ විදිහට වැඩි වගකීමක් ලැබෙනවා. නමුත් අපේ රටේ අවාසනාවට එවන් තත්වයක් උදාවෙන්නෙ නැහැ. අපේ එක කථික මහත්මයෙක් කීව රනිල් රාජපක්ෂ කියල. රනිල් රාජපක්ෂ ඒ දැන් තියෙන වාතාවරණය වුනත් ඒව රටක් ගැනි හිතල කියන කතා නොවෙයි. එක අතකින් ඒකේ වැරැද්දකුත් නැහැ. මොකද 2005 මේ රනිල් වික්‍රමසිංහ මහත්මයාට ජනාධිපතිවරණයට ඉල්ලන්න තිබුනා. ඒ අවස්ථාවේ සම්පූර්ණ ඡන්ද වැලකුනේ මහින්ද රාජපක්ෂ මැතිතුමා සල්ලි දුන්න කියල කියන එක අපි නොවෙයි කිවේ. තිස්ස කුට්ටි ආරච්චි මැතිතුමා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කලේ. ඒ කැසට් පටය ඒ ලේඛන මම අතේ තවත් තිබෙනවා. එතුමා ඒව අනාවරණය කලා. දෛවය මහ පුදුම දඩුවම් දෙන්නෙ. අද එතුමා ගත්ත ජනවරම රනිල් වික්‍රමසිංහ මැතිතුමාට දෙන්න වුනේ ඒකයි. නමුත් රට ගැන හිතනකොට ඒක පරක්කු වැඩියි. පරක්කු වැඩි වෙලා හරි ඉඩදීමෙන් හරි අපිට තවත් කාලය තිබෙනවා. ඒ කාලය ප්‍රයෝජනයට ගැනිම තමා අද යුගයේ අවශ්‍යතාවය වන්නේ. ඒ අවබෝධයෙන් කටයුතු කරන්න පවතින දේශපාලන නායකයින්ට නියෝජිතයින්ට ඒ හා අනුගත වෙලා ඉන්න කටයුතු කරන ගම් මට්ටමේ සියලු සංවිධායකයින්ට ඥානය පහල වේවා කියල මම ආශිංසනය කරනවා.

ඒ වගේම තව එක කතාවක් කිවුව ප්‍රධාන පක්ෂ දෙක තමා මේ රට මේ තත්වයට පත් කලේ කියන එක. අධික ණය බර එක්ක මේ රට මේ තත්වය පත් කලේ හැම පක්ෂයක්ම අඩුවැඩියෙන් ඒ වගකීම භාර ගන්න ඕන. JVP අවශ්‍ය නැද්ද. JVP ඒ හා සමානම විනාශයක් කලා. 1970 ,1971 වර්ෂය 1988,1989 අපි ඇස් ඉදිරිපිටම දැක්කා. කොපමණ ගොවිජන සේවා ආයතන විනාශ කලාද, බස් කොපමණ ගිනි තිබ්බද? ඩිපෝ කොපමන විනාශ කලාද. ඒව යථා තත්වයට පත් කරන්න වැය කලේ මහජනතාවගේ මුදල්, අරමුදලට වැඩිය විශාල මුදලක් වැය වුනා. ජීවිත විශාල ගාණක් මට මතකයි. මම ගිරිඋල්ල පොලිස් ස්ථානයෙ ඉන්නකොට අපේ ඕස්ට්මන් රාලහාමි, එතුමා අසනීප වෙලා මාහරගම දඹදෙණිය රෝහලේ ප්‍රතිකාර ගන්නකොට ජනතා විමුක්ති පෙරමුණේ පෝස්ටරයක් ගැලෙව්වා කියල රැ ගිහිල්ල දැලි පිහියෙන් බෙල්ල කපල උඩ ටික ගෙනත් ගිරිඋල්ල නගරයේ මැද්දෙපොල පන්සලේ තොරණ ලගින් තියපුව ගැන ජනතා විමුක්ති පෙරමුණ ගැන කවුරුවත් එහෙම ප්‍රසාදයෙන් හිතන්නෙ නෑ. නමුත් ජනතා විමුක්ති පෙරමුණ යථා තත්වයට ජනතාව ගොනු කරගෙන යන එක ගැන සන්තෝෂයි. නමුත් ඒ අඳුරු අතීතයක් තිබුණා. ඒවගේම අර ණය බරට වැඩියෙන් විනාශයක් සිද්ධ වුනා කියන එක අමතක කරන්න එපා. අපි හැම කෙනෙක්ගෙන්ම, අපේ හැම දේශපාලකයෙකුගෙන්ම වැරැද්දක් සිද්ධ වෙලා තියෙනවා. අද නිවැරදි කරගන්න අවස්ථාව ඇවිදින් තියෙනවා. ඒකෙන් ප්‍රයෝජන ගත්තෙ නැත්නම් අපි සියළු දෙනාම එකම වලක වැටෙන දවස ඈතක නෙවෙයි කියන එක අවධාරණය කරමින් ඔබතුමිය ගෙනා අයවැය කෙටුම්පත මම හිතනවා මේක මන්ත්‍රීවරු හුවා දැක්වුවා ලේකම්තුමිය හදල කියල. මම දන්නවා ලේකම්තුමිය අයවැය හදන්න ඇති. නමුත් මේ පුරෝකතන මේව එවල තියෙන්නේ ඒකයි. මේවට පිටින් යන්න බෑ. කාටද පුළුවන්, රජයේ නිලධාරියෙකුට යන්න පුළුවන්ද? මහජන නියෝජිතයින්ට පුළුවන් මේක නොසලකා හරින්න. නමුත් සභාපතිතුමියට බෑ. පනතෙන්ම බැදී සිටිනවා. මේව පැහැර හරින්න බැරි වගකීම් ඉෂ්ඨ

කරන්න. අපිට පුළුවන් හේතුවක් දක්වල අපිට මේක කරන්න පුළුවන්. නමුත් වගකීම් දරන අයට ඒක බෑ. රාමුවක් තියෙනව ඒ නීතියේ රාමුව තුල යා යුතුයි. ඒක අපි හැම කෙනෙක්ම අවබෝධ කරගත යුතුයි. කියන පණිවිඩය දෙමින් තව වරක් අපි කල්පනා කරල ඉදිරි මේ කෙටි කාලය අපේ ගම්වලට යමක් කරන්න පුළුවන් නම් ඒ අවස්ථාව ප්‍රයෝජනයට ගන්න හැටියට ඉතාම ගෞරවයෙන් සියළුම ගරු මන්ත්‍රිතුමන්ලාගෙන්, මන්ත්‍රීතුමියන්ලාගෙන් අයැද සිටිමින් මම නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය**

ගරු සභාපතිතුමියනි, මම කිව යුතු පුද්ගලික කාරණයක් තිබෙනවා. අපි මොන දේශපාලනික මතවාද දැරුවත් මේ අවස්ථාව වන විට රටක් වශයෙන් බොහොම ප්‍රශ්නකාරී අවස්ථාවක ඉන්නෙ. එතනදි දේශපාලන මතවාදය කුමක් වුනත් ජනතාවට සේවය කරන එක අසරණභාවයට පත්ව සිටින ජනතාවගේ ප්‍රශ්ණ දිහා බැලීම සාධාරණව ඔවුන්ගේ අපහසුතා දිහා බලා අපිට පුළුවන් දෙයක් කරන එක ප්‍රාදේශීය සභාවක් හැටියටත් ප්‍රාදේශීය දේශපාලඥන් වශයෙනුත් අපිට ලොකු වගකීමක් තියෙනවා කියල හිතනවා. ඇත්ත වශයෙන්ම මම හිතන්නේ අයවැය කෙටුම්පතෙහි යම් යම් කාරණා දිහා බැලුවහම මේ අද තිබෙන ප්‍රායෝගික තත්වය සමඟ බලන විට ඒ ඒ අංශ වලට වෙන් කර ඇති මුදල් දිහා බැලුවම මේ කොට්ඨාශ 28 කට බෙදෙන්නෙ සාමාන්‍යයෙන් ලක්ෂ දෙකක් පමණ. දරිද්‍රතාවය සම්බන්ධයෙන් ගත්තොත්, කාන්තාව සම්බන්ධයෙන් ගත්තොත් ලක්ෂයක් වැනි ඉතා කුඩා මුදලක් එහෙම බැලුවොත් එක මන්ත්‍රී කෙනෙකුට ඉතාම කුඩා මුදලක් තමයි වෙන් වෙන්නෙ. මේ මුදල් ප්‍රතිපාදන දිහා බැලුහම කරන්න පුළුවන් දේ ඉතාම අඩුයි. කෙසේ වෙතත් මේ කටයුතු කිරිමේදී මීට වඩා සාමුහිකව කටයුතු කලා නම් අපි මුහුණ දෙන මේ ප්‍රශ්න වලට ඔබතුමියට හෝ අපිට ඇත්තටම මුහුණ දෙන්න වෙන්නෙ නැහැ. ඔබතුමියටවත් අපිටවත් මේක සතුටුදායක තත්වයක් නොවෙයි. පක්ෂයක් විදිහට ගත්තොත් ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ අද මොන තත්වයේ තිබුනත් අපි අද නියෝජනය කරන්නෙ ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ. කණගාටුවක් තිබෙනවා. නැතුව නොවේ. මේ විදිහට අපි ගොඩ නගපු පක්ෂය මේ විදිහට විවේචනය කරන්න සිදුවීම ගැන අපිට කණගාටුවක් තිබෙනවා. නමුත් යම් යම් දේශපාලන අධිකාරිය විසින් ගත් යම් යම් වැරදි තීරණ නිසා ඒ තත්වයට පත් වෙලා තියෙනවා. ප්‍රාදේශීය වශයෙන් ඉතා කුඩා තැන ඉන්න මේ ප්‍රාදේශිය දේශපාලඥයින් වන අපිට ඒ සම්බන්ධයෙන් කරන්න පුළුවන් දෙයක් නැති තරම්. ඒ නිසා තමයි අද අපි මේ කල්පනා කරන්නෙ අපිට අඩුම තරමේ විරෝධයක් පාන්න තැනක් හෝ අවස්ථාවක් අපිට ලැබිල නැහැ. පක්ෂයක් හැටියට අපිට ලැබිලත් නැහැ. අපිට දෙන්නෙත් නැහැ. ඒ නිසා අපි ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ හැටියට බහුතරයක් අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු තීරණය කරල තිබෙනවා මේ අයවැයට විරෝධය පාමින් මේ පවතින දේශපාලන වතාවරණයට සහ රටේ පවතින ආර්ථික, දේශපාලනික වශයෙන් අගාධයට යන මේ රට මේ විදිහට නොවේ ගෙනියන්න ඕනේ. මේක මීට වඩා වෙනස් වෙන්න ඕනෑ. මේ රටේ දේපල විකුණන්න එපා. ජනතාවට සහන දෙන්න ඕන. එහෙම නැත්නම් මේකට වැඩ පිළිවෙලක් හදන්න ඕනෑ කියන පණිවිඩය දෙන්න අපිට වෙන ක්‍රමයක් නැහැ. අපි මේ අවස්ථාවෙදි තීරණය කරල තියෙනවා. ප්‍රාදේශීය මට්ටමින් අපිට දෙන්න පුළුවන් පණිවිඩයක් හැටියට මේ අයවැයට විරෝධය පාමින් අපි අපේ මේ ආණ්ඩුවට දක්වන විරෝධයක් හැටියටත්, මේ වැඩපිළිවෙලට දක්වන විරෝධයක් හැටියටත් අයවැයට විරෝධය ප්‍රකාශ කරන්නේ. මම හිතනවා මාගේ සහෝදර මන්ත්‍රිවරු මාත් සමග එකඟ වෙයි ඒ වගේම විපක්ෂය නියෝජනය කරන අපේ බොහොමයක් මන්ත්‍රීවරුන්ගේ අදහසත් ඒක බව ඔබ සියලු දෙනාගේ කතා වලින් පැහැදිලි වුනා. ඔබත් අපිත් සමඟ අත්වැල් බැඳ ගනී. අපි මේ දේශපානයට ඇවිල්ල තියෙන්නේ කවුරුත් කතා කලා වගේ ප්‍රාදේශිය මට්ටමින්. අපි කිසිම කෙනෙකුට නැහැ ලොකු ලොකු දේවල් කරන්න අදහසක්. ඒ කියන්නේ කොමිස් ගහන්න වගේ බලාපොත්තු නැහැ. මොකද අපි කෙලින්ම වග කියන්නේ, කෙලින්ම සම්බන්ධ වෙන්නේ ප්‍රාදේශීය වශයෙන් ජනතාවට. අපි කිසිම කෙනෙකුට ඒ දේ කරන්න හිතන්නවත් බැහැ. ඒ නිසා අපි කිසිම අවස්ථාවක ඒ දේ කරලත් නැහැ, කරන්නෙත් නැහැ.

හැබැයි අපිට උඩින් ඉන්න අය ඒ වගේ දේවල් කලා නම් අපිට ඒකට වගකියන්නත් බැහැ. මොකද අපේ වගකීමෙන් බැහැර කාරණාවක් ඒක. නමුත් ඔවුන්ට අනතුරු ඇඟවීමක් කරන්න පුළුවන්. උබල මේ දේ කරානම් උබල මේකෙ ප්‍රතිඵල විඳපල්ල කියන එක. එම නිසා මම හිතනවා ඔබලා සියලු දෙනා අපිත් ඒක්ක අත්වැල් බැඳගනී. ඔබේ අරමුණත් අපේ අරමුණත් එකක් හැටියට දකිනවා. මොකද ජනතාවට සේවය කරන්න තමයි අපි මෙතන්ට ඇවිල්ල ඉන්නේ. ඒ දේ අපිට කරන් බැරි නම් එක්කො අපි මේ දේවල් අතහැරලා යන්න ඕනෑ. නැත්නම් කරන්න පුළුවන් පිළිවෙලකට අපි ඒ දේ කරන විදිහකට හැඩ ගැහෙන්න, හුරුවෙන්න හෝ එහෙම නැත්නම් වැඩපිළිවෙලකට යන්න ඕනෑ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,2023 අයවැය ලේඛනයේ ගණන් ඉලක්කම් කෙසේ වෙතත් මේ ගැන අපිට විශ්වාසයක් තියන්න බැරි 2022 අයවැය ලේඛනයෙන් අපිට බලාපොරොත්තු වුනු ඒ දේවල් අපිට ලැබුනේ නෑ. ඒ වගේම පක්ෂයක් විදියට අපේ කණ්ඩායම එකමුතු කරගන්න ඔබතුමියට මේ වෙනකම් වුවමනාවක් තිබුනේ නෑ. ඒ වගේම ඒ උවමනාව අපේ ඉහළ නායකත්වයට දැනුම් දෙන්න කීප වතාවක්ම කටයුතු කලත් ඉහළ නායකත්වයටත් මේ ප්‍රශ්න විසඳන්න කිසිම වුවමනාවක් තිබුනේ නෑ. අද රට පත් වෙලා තිබෙන්නේ එවැනි තත්වයකට. ඇත්ත වශයෙන්ම අද අපි මෙතෙන්ට ඇවිල්ලා ඉන්නේ ප්‍රාදේශීය සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් විදියට අපේ ගමේ අපේ කොට්ඨාශයේ ජනතාව වෙනුවෙන්. ඒ ජනතාවට සේවය කරන්න. ඒ ජනතාවගේ සිතුම් පැතුම් මෙතනදී අපි ප්‍රකාශ කරන්නේ. රටට ගෙනියන්නේ. ජනතාවගේ මේ වෙනකාට ඉල්ලීම අදූරදර්ශී පාලනයත්, ක්‍රමවේදයත් පිටුදැකලා තියෙන්නේ ගමේ ජනතාව. ජනතාවගේ පැත්තේ අපි ඉඳගන්නවා නම් මේ අයවැයට අපි එකඟ වෙන්න බෑ. 2022 අපේ ප්‍රතිපාදන මේ වෙනකොට ලැබුනේ නැතිව ඊළඟ පාර ලැබෙනවා කියලා අහන්නත් අපට ප්‍රශ්නයක්. ඒ වගේම ඉහළ නායකත්වයට අපි යම් කිසි දැනුම් දීමක් කරන්න අපි ඉල්ලපු කිසිම ඉල්ලීමක් කනකට ගත්තේ නැති තැන මේ අයවැයට විරෝධය පලකරමින් ඒ කාරණා දෙකටම පිළිතුරු සපයනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

ඔබ සියළු දෙනා කෙසේ කතාකලත් ඔබ සියළු දෙනා දන්නවා රටේ තිබෙන තත්වය. ඒ අනුව අපි සියළු දෙනා ඒ දේවල් තේරුම ගෙන අදහස් පල කළ යුතුයි. ඔබ කිව්ව වගේම මධ්‍යම ආණ්ඩුව කරන පරිපාලනය අපට මෙහෙයවන්න බෑ. නමුත් අපි පුළුවන් උපරිම ආකාරයට සභාව හැටියට අපි දැනුවත් කරල තිබෙනව අපි මුහුණපාල තිබෙන දුෂ්කරතා, මන්ත්‍රීතුමන්ල මුහුණපාන දුෂ්කරතා. ඔබ සමහරවිට පිළිගනියි. සමහරවිට පිළිගන්න එකක් නැහැ. මේ තිබුණ ආර්ථික බිඳවැටීමත් එක්ක ඔබ හොඳටම දන්නවා 2021 අවුරුද්ද අවසානය වන විටත් මේ කොරෝනා ප්‍රශ්නය නිසා අපි ආර්ථික වශයෙන් පහළට වැටිල හිටිය. 2022 අවුරුද්දත් ඒ විදියටම ආවා. ඒ ආර්ථික බිඳ වැටීමත් එක්ක එතනින් එහාට අපිට වැඩක් කරන්න අවස්ථාවක් වුනේ නෑ. නමුත් මේ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් යම් යම් වැඩ කරන්න, එදිනෙදා වැඩ කටයුතු කරලා දෙන්න විශාල වෙහෙසක් මම දැරුවා. හැබැයි ඔබතුමන්ලාට වෙන්වුනු සංවර්ධන ව්‍යාපාතිවල කාර්යන් මුල් මාස කිහිපයේ පමණයි ක්‍රියාත්මක කරන්න ලැබුනේ. රටේ පැවති ආර්ථික තත්වයත් එක්ක සභාවේ ආදායමත් අඩුවුනා. ඒ සමගම රජයේ චක්‍රලේඛ නිකුත් වුනා. සංවර්ධන වැඩ නතර කරන්න කීවා. ඒ අනුවයි 2022 වසරේ ඔබට වෙන්වුනු ප්‍රතිපාදන වලට අදාළ ව්‍යාපෘති ඉටුකරන්න බැරිවුනේ. ඒක ඔබ සැම දන්නවා. 2023 අයවැයට විරෝධය පල කරන්න ඒක හේතුවක් කරගන්න බැහැ. මේ අයවැය සකස් කරන්න පෙර ඔබතුමාලගේ අදහස් ලබාගන්න අපි ඔබ සියළු දෙනා දැනුවත් කරල රැස්වීම් පැවැත්වුවා. අද විරෝධය පල කරමින් අදහස් දක්වන කිසිවකු ඒවාට සහභාගී වුවේ නැහැ. මට සහයෝගය දීපු මන්ත්‍රී මණ්ඩලයටත් ඒ වගේම මේ කාර්ය මණ්ඩලයටත් ස්තුතිවන්ත වෙනවා. මොකද මේ අයවැය බොහොම වෙහෙස මහන්සි වෙලා හදලා තිබෙන්නේ. පහුගිය කාලසීමාවේ සමහර දවස්වලට අපට කසළ ටික එකතු කරන්න වාහනය යවන්න ඉන්ධන ගන්න හැකියාවක් නැති තත්ත්වයන් මතුවුනා. බොහොම අසීරුවෙන්

ඒවා ලබාගත්තේ. රටම ඉන්ධන හිඟයෙන් පීඩා විඳිනකොට අපි ඉන්ධන අසීරුවෙන් සොයා ගත්තා. ඒ තැන්වල බොහෝ මහන්සි වෙලා සමහර වෙලාවට මේ ලේකම්තුමිය, නිලධාරීන් ඉන්ධන ගෙනාවා. මන්ත්‍රීතුමන්ලාට ඉන්ධන ටික බෙදලා දෙන්න දැඩි කැපවීමක් කලා. ඒ වගේම අවශ්‍ය දේ කරන්න අපි කටයුතු කරලා තිබෙනවා. ඒ සභාවක් හැටියට කරන්න පුළුවන් වැඩ කොටස අපි කලා. ජල හිඟයෙන් පීඩා විඳිනකොට, වතුර නැති වෙලාවට, ජලයටි ක බෙදාහැරියා. කාගේ හරි මරණයක් වුන වෙලාවට විදුලිය, වතුර ටික ලබලා දෙන්න, ඒ වගේ ඉල්ලන දේ කෙරුනා. කොච්චර අසීරු වුනත් හැමදාම නගර වීදි පිරිසිදු කලා. ඒත් එක්කම අපිට කරන්න පුළුවන් මට්ටමට කරන්න පුළුවන් දේ කරන්න තමයි වීථි පහන් ලබා දීම, පාරවල් සඳහා මෝටර් ග්‍රේඩරය, පාරවල් දෙපැත්ත කැලෑ සුද්ධ කිරීමට මම කිසිම බලපෑමක් කලේ නෑ. මේ අය සාක්ෂි දරනවා ඇති ඔබතුමාලා ඉදිරිපත් කරපු ලිපි යම් කිසි ක්‍රමවේදයකට ලැයිස්තුගත කරලා එය ලබා දෙන්න කටයුතු කලා. මන්ත්‍රීවරු දෙන්නෙක් තුන්දෙනෙක් ඉන්න කොට්ඨාශවලදී, ඒ අයට එකතුවෙලා කටයුතු කරන්න බැරි තැන්වලට අවශ්‍ය දින ගණන ලබා දෙන්න කටයුතු කලා. එහෙම කරගෙන යනකොට විදුලි බල්බවල හිඟයක් ආවා. මිල වැඩිවුනා. අපි ඉල්ලන ඉක්මනට ලැබුනේ නෑ. මේ පහුගිය ටිකේ සමහර පන්සල් වලට උත්සව සඳහා ඉල්ලුවා. ගොරොක්ගස්දෙනිය පන්සලේ කඨින පින්කමටත් ඉල්ලුවා. විදුලි බල්බ ලබා දෙන්න ඒ අවස්ථාවේ බැරි උනේ අපිට මිල ගණන් ලබා දීලා තිබෙනවා. නමුත් ඒවගේ පැවැත්ම පිළිබඳව සහතිකය දීලා නැති වුනාම අපිට සභාවක් ලෙස ඒ මිල ගණන් යටතේ ඒවා ගන්න බැරි වුනා. ඒ කරුණු යථා තත්වයට පත් කරගත්ත ගමන් නැවතත් ඒ දේවල් ලබා දෙන්න පුළුවන්. මේ දේවල් දෙනවා කියලා තමුන්නාන්සේලා ඉහළ දේශපාලනය වගේ පොරොන්දු දීලා ගොඩ එන්න කතාවක් නොවෙයි. මෙතෙක් සමහර මන්ත්‍රීතුමන්ලාගෙන් කියවුනා වගේ අපිට කරන්න පුළුවන් කොටස කරලා තිබෙනවා. ඔබතුමාලා කිව්වා කිසිම අළුත් දෙයක් කරන්න කටයුතු කලේ නෑ කියලා. කමිටු පත් කරලා තිබෙනවා. ඒ කමිටුවලට සමහර අය එන්නේ නෑ. සමහර අය ඇවිත් අත්සන් කරලා යනවා. වාඩි වෙලා ඉන්නේ නෑ. ඒ කමිටුවල වාඩි වෙලා සාකච්ඡා කරනවා නම් මේ ජනතාවගේ ඉල්ලීම් මොනවාද කියලා හඳුනාගෙන ඒවාට අළුත් දෙයක් යෝජනා කරන්න අවස්ථාව තිබුනා. ආර්ථිකය ගොඩනගාගන්න ඒ ජනතාව වෙනුවෙන් මෙහෙවරක් ඉටුකරන්න තමයි කමිටු පත් කරලා තිබෙන්නේ. අපිට තව කමිටු පත් කරගන්නත් පුළුවන්. ඒ සඳහා එකඟතාවය තිබෙන්න ඕනෑ. ඒවාට සහභාගී වෙන්න ඕනෑ. ජනතා ප්‍රශ්න හඳුනාගන්නේ නැතිව නොවේ. ජනතා ප්‍රශ්න හඳුනාගැනීම තුලින් තමයි ජනතාවට ඒ දේවල් ලබා දෙන්න කටයුතු කලේ. කිව යුතු දේවල් බොහෝ දේ තිබුනත් කොපමණ කතා කලත් වැඩක් වෙන්නේ නෑ. තමුන්නාන්සේලාට මතකයි 2021, 2022 අවුරුදු දෙකේදිම මධ්‍යම ආණ්ඩුවෙන් ආව ප්‍රතිපාදන තමුන්නාන්සේලාත් විවිධ මන්ත්‍රීතුමන්ලා හරහා ගන්න ඇති. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් හැටියට තමුන්නාන්සේලාට විවිධ ප්‍රතිපාදන ආවා. ඒ බොහෝ දේ අපිට ක්‍රියාත්මක කරගන්න අවස්ථාව ලැබුනේ නෑ. අතේ සල්ලි තියෙන අය ඇස්තමේන්තු හදවාගෙන තමන්ගේ මුදල් වියදම් කරලා හරි කරගෙන ගිය අය, විමධ්‍යගතව කරපු දේවලුත් ලබා ගත්තා. නමුත් මම මේ සභාවේ සභාපතිවරයා වුනත් ඒ ලැබුනු මුදල්වලින් කටයුතු කරන්න ලැබුනේ නෑ, මොකද මෙතුමා කියනවා වගේ තිබෙන දේවල් රිලව් කනවා. එහෙම රිලවුන්ට ඕන ඕන හැටියට කන්න දෙන්නේ නෑ, නමුත් ලොකු සල්ලියක් නැති නිසා ඒවා කරගන්න බැරි උනා. එහෙම සල්ලි පාවිච්චි කරලා මම වැඩ කරලත් නෑ. ඒ විමධ්‍යගත මුදල් හරියට යොදවා ගන්න බැරිවෙනකොට තමුන්නාන්සේලාට පැහැදිලි වෙනවා හොඳ ආදායම් මාර්ග හදාගෙන අපි මේ සභාව ඉස්සරහට යන්නේ කොහොමද කියලා. සතිපොල ගලවලා වෙනත් තැනකට ගත්තම අපි සතිපොල තාවකාලිකව පවත්වාගන යන ස්ථානයට කුලිය වශයෙන් ට මාසිකව ගෙවන්න ඕනෑ රු. 50,000.00 ක මුදලක්. ඊලඟට සතිපොල සංවර්ධන කටයුතු 75% ක් විතර නිමවෙලා තිබ්බත් තාම විවෘත කරන්න බෑ. තාවකාලික සතිපොලේ වෙළෙන්දන්ට තියෙන අඩුපාඩු නිසා ඒ අයගෙන් අපිට ලැබෙන්න තියෙන ආදායම හරියට ලැබෙන්නේ නෑ. නලින් මන්ත්‍රීතුමා ඒ අය එක්ක සම්බන්ධ නිසා හොඳින් දන්නවා ඇති. නගර සංවර්ධනයත් එක්ක, නගරයේ අයට මුහුණ දෙන්න සිදුවුන සිදුවීම් එක්ක ආදායම් අඩුවීමක් වුනා. මුළු රටේම ආර්ථිකය කඩා වැටුනා. මේ

ආර්ථිකය කඩා වැටීම අපේ රටේ විතරක් නොවෙයි. අපි දියුණු වෙන්න උත්සාහ කරන රටක් නිසා අපිට තදට දැනුනත් අනිත් රටවල් වලටත් මේ ප්‍රශ්නයම තිබෙනවා. මේවා කියලා කාගෙවත් හිත හදන්නවත්, ගැලවෙන්නවත් මේ කතා කරනවා නොවෙයි. අර කීවා වගේ මේ අවුරුදු 74 ක් තිස්සේ ආපු දේශපාලන ගමන් මගේ හැම කෙනෙක් අතින්ම හොඳ දෙයක් වගේම නරක දේවලුත් වෙලා තිබෙනවා. බොහෝ දේවල් කතා කලයුතු නෑ. මෙහෙම කියනකොට මතක් වෙනවා ඇති විශේෂයෙන්ම සිරිමාවෝ බණ්ඩාරණායක මැතිනියගේ ආණ්ඩුව කාලේ ජනතාවට විශාල පහසුකම් ලැබුනා. ඒ දවස්වල ඒ ඉඩම් එහෙම නොලැබුනා නම් අද සමහර ගම්වල මිනිස්සුන්ට ජීවත්වෙන්නට ඉඩක් නෑ. එදා ඉඩකඩම් ලැබුනු අය අද පවුලේ හතර පස් දෙනාට ඒ ඉඩකඩම් බෙදලා දීලා අද ඒ ජනගහනය තුනීවෙලා, තිබෙන ප්‍රශ්න ටිකක් හරි අඩුවෙලා තිබෙනවා. ඊලඟට එන අය ඒක ඉදිරියට ගෙනයාමට දැනගන්න ඕනෑ. මේ සභාවේ කටයුතු ගැනයි අපි කතා කරන්න ඕනෑ. මම ගොඩක් කතාකරන්න බලාපොරොත්තු වෙන්නේ නෑ කියලා මුලදිම කීවා. මට නිතරම එන චෝදනාවක් තමයි කණ්ඩාම් රැස්වීමක් තියන්නේ නෑ කියන එක. ඔබතුමාලම දන්නවා එතනට එන්න බැරි තත්වය මොකද්ද කියන එක. මට කාටවත් තර්ජනය කරලා, එහෙම නැත්නම් බලහත්කාරකමෙන් ගෙනැල්ලා රැස්වීම් තියන්නවත්, සාකච්ඡා තියන තැනටවත් මම හුරුවෙලා නැහැ. කොතෙන්ට හරි යන්න හදනකොට තර්ජනය කරලා, හොඳ වැඩකට සහාභාගී වෙනකොට තර්ජනය කරලා බළල් හස්ත පාවිච්චි කරලා මගේ දේශපාලනයවත්, මගේ සාමාන්‍ය ජීවිතයේ කටයුතුවත් කරන්නේ නෑ. ඒ වගේම තමයි මම යම් වගකීමක් භාර ගත්තා නම් ඒ වගකීම හරියාකාරව ඉශ්ඨ කරන්න මගේ හිතට එකඟව ඒ වගේම අනිත් අයට හානියක් නොවන ආකාරයට කරන්න උපරිම කැපකිරීමක් මම කැපකරනවා. අද කෙනෙකුට බැන බැන ඉඳලා තව කෙනෙකුට ආවඩමින් තව කෙනෙකුට බනින්න වගේ වැඩ කරන්නේ නෑ. කාට වුනත් කිව යුතු තැනදී අපි දකින අඩුපාඩු සකස් කරපු ආකාරය පිළිබඳව කටයුතු කරලා තිබෙනවා. අද මේ වෙනකොට සාමාන්‍ය ජනතාවට වගේම අපි බොහෝ දෙනෙකුට ප්‍රශ්නයක් තිබෙනවා කොයි වගේද මේ රටේ ඉදිරි ගමන, කොයි දෙසටද, ජනතාවට යහපතක් වෙන ආකාරයටද ගත යුත්තේ කියලා. එක දවසකට තරුණ මන්ත්‍රීතුමන්ලගේ කණ්ඩායම ශක්තිමත් වෙනව වගේ දකිනකොට ඒ පැත්තට කෑ ගහන්නත්, අනිත් දවසට තවත් පැත්තක් හයිවෙනව වගේ දකිනකොට එහාට මෙහාට කතා කිරීම නොවෙයි. අපි ඉන්න කුඩා සභාවේ අපේ බලප්‍රදේශය තුළ ජනතාවට යමක් කරන්න එකතුවිය යුතුයි කියන තැන තමයි මමත් ඉන්නෙ. සමහර අවස්ථාවලදි අපි නීති රීති යටතේ වැඩ කරන සභාවක්. සභාපති කිවුවම ජනතා අවශ්‍යතාවයන් ඉටුකරනව වගේම සභාවේ තිබෙන නීති රීති පිළිබඳවත්, ව්‍යවස්ථාව පිළිබඳවත්, පරිපාලනය පිළිබඳවත් වගකිවයුතු තැන් තිබෙනවා. ඒ වගේම වගකීම් දරණ නිලධාරින් පිරිසක් එක්ක කටයුතු කරන විට ඒ අයගෙ අනාගතයත් රැකගෙන ඒ අයගෙ අවස්ථාත් රැකගෙන ජනතාවගේ අවශ්‍යතාත් ඉටු කර දිය යුතුව තිබෙනවා. ඒ නිසා තමයි මේ මාර්ගවල කටයුතු කෙරෙන්න අවශ්‍යයි කියල ජනතාව ඉල්ලීමක් ඉදිරිපත් කලානම්, මන්ත්‍රීතුමාල ඉල්ලීමක් කලානම් ඒ හැම අවස්ථාවකම අවස්ථාව දීල තිබෙනවා. ඒ වගේම පක්ෂ භේදයක් නෑ. 28 දෙනාම සභාවේ මන්ත්‍රීවරු. ඒ 28 දෙනා වෙනුවෙන්ම කලහැකි යමක් ඇත්නම් එය උපරිමයෙන් කර දීමට කටයුතු කලා. ඉදිරියට මම දන්නෙ නෑ කොයි තරම් කාලයක් මෙතන රැඳෙන්න පුළුවන්ද කියල. දවසක් හෝ දෙකක් හෝ මාසයක් හෝ ඒ ඉන්න කාලසීමාව තුළත් ඒ කටයුත්ත කෙරෙනවා. ඒ නිසාම තමයි මේ අයවැය කෙටුම්පත ඉදිරිපත් කලේ. ඔබ හොඳාකාරවම දන්නවා හරියට දේශපාලනය කරන නායකයින් හැටියට අපි බලයක් අල්ලගත්තම අපිට ඒක ක්‍රියාත්මක කරන්න බෑ. රටේ තිබෙන නීති රීතිත් එක්ක කටයුතු කරන්න ඕනෑ. ඒ නීති රීති වෙනස් නර ගත්තොත් තමයි තමන් බලාපොරොත්තු වන දෙය කරන්න පුළුවන් වෙන්නේ. අද රට ඇල්ලුවා කියල හෙට ඒව වෙනස් කරන්න බෑ. ඒ නිසා මේ සභාව ඉදිරියට පවත්වාගෙන යාමට යම් කිසි කෙනෙක් සභාවේ නායකත්වය ගන්නවනම් එහෙම නැත්නම් රාජකාරි මට්ටමෙන් මන්ත්‍රීවරුන්ම නම් කරල කොමසාරිස් පාලනය යටතේ යනවනම් පාර්ලිමේන්තුවේ වගේම සභාවෙත් මේ අයවැය ලේඛනයක් සම්මත වෙලා තියෙන්න ඕනෑ. ඒ අනුව තමයි කාට හෝ ඇවිල්ල ඉදිරියට ඒ කටයුතු කරගෙන යන්න පුළුවන් වෙන්නේ. ගරු

මන්ත්‍රීතුමන්ලගෙන්, මන්ත්‍රීතුමියන්ලගෙන් කියවුණා මේ කෙටුම්පතේ තිබෙන අඩුපාඩු. අපි ඔබතුමාලට එක දවසක් ආරාධනා කලා මට මතක විදියට සැප්තැම්බර් 23 වෙනිදා ඔබතුමන්ලා සියළුදෙනා ඇවිල්ල අපි සාකච්ඡා කරල සියළු දෙනා දකින දේ මේ කෙටුම්පතේ සංශෝධනය කර ගනිමු කියලා. බොහෝ දෙනෙක් ආවා. තවත් පිරිසක් ඒකට සහභාගි වුනේ නෑ. එහෙම වෙලා තියෙද්දිත් අපි තවත් අවස්ථාවක් දුන්න තවත් සංශෝධන ඉදිරිපත් කරන්න කියල. ගිය අවුරුද්දේ කරන්න බැරිවුණ වැඩ කොටස් එකතු කරගෙන හරි ඒවයින් වඩා වැදගත් දේ හරි කෙරෙන්න එක යෝජනාවක් එවන්න කියල දිනයක් දුන්නා. ඒ යෝජනාව එනකොට ආපු ටික අපි ඇතුලත් කලා. ඒකත් නැවත පළාත් පාලන කොමසාරිස්තුමාට ඉදිරිපත් කරලා අපි අනුමැතිය ගත යුතු වුණා. ඒ නිසා තමයි ඔබට දිනයක් දුන්නෙ ඒ දවසට ලබාදෙන්න කියලා. කවුරු සභාපති වෙලා හිටියත් තමුන්නාන්සේලාට සිද්ධ වෙයි. මේ පළාත් පාලන ආයතනය තුළ හෝ පළාත් සභාවේ හෝ පාර්ලිමේන්තුවේ හෝ කොතැනකට ගියත් අපිට හිතුමතේ වැඩ කරන්න බෑ. මේ කියන නීති රීතිත් එක්ක එකතු වෙලා කටයුතු කරන්න ඕනේ. ඔබ කියනවා වගේම මගෙත් ජීවිතයේ පුරුද්දක් තිබුන්නෑ කා එක්කවත් වෛරයෙන් තරහින් එක එක්කෙනාගෙන් පලිගන්න කටයුතු කරන්න. මම ඒක පුන පුනා කියන්නෙත් නෑ. ඒ වගේම ශ්‍රියානි වසන්තා ගරු මන්ත්‍රීතුමියනි වනිතා කටයුතු සඳහා කියලා මෙහි යම් මුදලක් වෙන් කලා. ඒ වගේම මේකේ තියනවා විවිධ මාතෘකා. ඒ යටතේ වෙන් කරපු මුදල් අපිට කාන්තා මන්ත්‍රීවරියන් හැටියට ඉදිරියට සාකච්ඡා කරලා ඒවා ගම තුලට කාන්තාවන් හරහා ගිහිල්ලා කරන්න පුළුවන් විශාල වැඩ කොටසක් තියනවා. මම කීවේ රුක් රෝපණය කියලා තියනවා. හැමදාම බොරුවට ලොකු ගස් ගෙනැල්ලා හිටවනවා. කවුරුහරි ෆේස්බුක් එකේ පින්තූරය දානවා. එහෙම නොවෙයි අපිට මේවා ගමට ප්‍රයෝජනවත් ආකාරයට කරගන්න පුළුවන්. ඔබතුමියලා අපේ සාකච්ඡාවලට කමිටු වලට සහාභාගී වුනා නම් අපිට ඒවා සාකච්චා කරලා හොඳට හැඩගහගන්න තිබුනා. තවත් ඉදිරියේදිත් ඒ සඳහා අවස්ථාව තිබෙනවා.

මේ ලංකාවෙන්ම අලව්ව ප්‍රාදේශීය සභාවේ වාහනය විතරක් නොවෙයි එදා මැයි 09 වෙනිදා ඔය තත්වයට පත් වුනේ. දිස්ත්‍රික්කය තුල තිබෙන වාහන රාශියක් එම තත්වයට පත් වුනා. සභා වාහන විතරක් නොවෙයි.පෞද්ගලික වාහන වලටත් හානි කරලා තිබෙනවා. ඒවාටත් ඔය තත්වයම තමයි තිබෙන්නේ. මේ සභාවේ වාහනයට කිසිම හානියක් වෙන්න දෙන්නෑ. ඒක ඒ තිබුනු තත්වයටම පත්වෙමින් පවතිනවා. අදාල නීති රීති අනුවම වගකිවයුතු ආයතන ඒ සඳහා කටයුතු කරගෙන යනවා. ඉතාම අඩුආදායම්ලාභියාගේ ඉඳලා රටේ හිටපු අගමැතිවරයා, ජනාධිපතිවරයාගේ දේපලට යනකම් ඒ හානිය සිද්ධ වුනා. මට උවමනාවක් තිබුනේ නෑ සභාවේ වාහනය දාලා එන්න. ඒක කරපු අයව, මේ රජයේ දේපල විනාශ කරපු අයගේ තොරතුරු හොයලා දෙන්න පුළුවන් නම් තමුන්නාන්සේලා ඒ තොරතුරු හොයලා දෙන්න. ඒක තමයි වඩාත් වැදගත් වෙන්නේ. මම එහෙම අරගලයක් තියෙන බවක්වත් දන්නවා නම් කීයටවත් ඔය වාහනය අරගෙන යන්නේ නෑ. මට අනිත් අය ගැන වගකියන්න බෑ. මම අරගලයට ගියෙත් නෑ. ඒ එක එක පුද්ගලයෝ කරපු දේ මොකද්ද කියලා දැනගෙන හිටියෙත් නෑ. ඔයගොල්ලොම යවපු අය ගැනනේ කතා කරන්නේ. ඒවා ඒ අයත් එක්ක කතා කරගන්න. කතා කරලා විසඳගන්න. මේ පාලම් උඩ, එහෙ මෙහේ හන්දි වල, ගෙදරට හැරෙන හන්දිය ළඟ රැකගෙන මම එනකම් බලාගෙන හිටිය බව අවට සියළු දෙනා දන්නවා. මම ආයේ ආයේ කියන්න කැමති නෑ. කීවත් මේකම තමයි කියන්න සිද්ධ වෙන්නේ. ඒ මග රැකගෙන හිටපු අයට ඒ අවස්ථාව ගන්න බැරි උන වැරැද්ද තමා ඔය කතාකරන්නේ. මේ වාහනේට හානි කරපු අයව පුළුවන් නම් හොයාගන්න උදව් කරන්න. ඒක තමයි ඔබතුමාලාට රාජ්‍ය දේපල වෙනුවෙන් කරන්න පුළුවන් ලොකුම දෙය. මම වාහනය අරගෙන ගිහිල්ලා බේරේ වැවට දැම්මේ නෑ, අරගලයේ අයට දෝශයක් කීවේ නෑ, ඒ සාමකාමී අරගලයේ අය වගේම මමත් ගියේ බොහොම සාමකාමී හිතකින්. මම එතනින් එළියට බැස්සෙත් නෑ. ඒක දැන් මට පුන පුනා කියන්න අවශ්‍යාත් නෑ, ඔය කාරණා මම දිගටම පාවිච්චි කරන්නෑ. මට කියන්න ඕනෑ වුනේ ඔය ටික. හරියට මම අරගලය නවත්වන්න ගියා වගේ තමා කතා කරන්නේ. එතකොට අර මන්ත්‍රීතුමා කීවා වගේ එක් මනුස්සයෙකුගේ ජීවිතය හානි වෙනකම් ඇදගෙන ගියේ ඒ මනුස්සයෝ අරගලයට ගිහිල්ලා

නොවෙයිනේ. අපි මේවා ගැන කතාකරන්න අවශ්‍ය නෑ. එහෙමනම් ඔබතුමන්ලා බෙදීමක් ඉල්ලුව නිසා ඊළගට ලේකම්තුමියට අවස්ථාව දෙනවා ඡන්ද විමසීම පවත්වන ලෙස.

ඒ අනුව ලේකම්තුමිය විසින් ඡන්දය ලබාදීමේ ක්‍රමවේදය සහ නීතිමය තත්වය පැහැදිලි කිරීමෙන් අනතුරුව ඡන්ද විමසීම පවත්වන ලද අතර පහත සදහන් පරිදි එහිදී ඡන්දය ප්‍රකාශ කරන ලදි.

**යෝජනාව -** 2020/10/28 දින ප්‍රසිද්ධියට පත් කරන ලද ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති ප්‍රකාරව සකස් කර 2022.09.29 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ නිර්දේශය ලැබූ 2023 වර්ෂය සඳහා සකස් කරන ලද රු.179,487,386.00 ක ආදායමක් හා රු.179,487.000.00 ක වියදමකින් සකස් කරන ලද කෙටුම්පත් අයවැය ලේඛනය සම්මත කර ගැනීම සුදුසු බවට යෝජනා කරමි

| අනු අංකය | නම | තනතුර | යෝජනාව ට පක්ෂ | යෝජනාව ට විපක්ෂ | ඡන්දය දීමෙන් වැලකී සිටි | නොපැමිණි |
|---|---|---|---|---|---|---|
| 1 | ජී.ආර්.පද්මා වැත්තැව මහත්මිය | සභාපතිනි | ✓ | | | |
| 2 | එච්.එම්.ඩී හේරත් මහතා | උපසභාපති | | ✓ | | |
| 3 | එස්.ඒ.නාරද සිරිවර්ධන මහතා | ප්‍රා දේ.සභා.මන්. | | ✓ | | |
| 4 | ඒ.සී.පී අතුකෝරාල මහතා | ප්‍රා දේ.සභා.මන්. | | ✓ | | |
| 5 | ඒ.ඒ.කරුණාරත්න මහතා | ප්‍රා දේ.සභා.මන්. | | ✓ | | |
| 6 | ඩබ්.පී.ධනුෂ්ක වීරසිංහ මහතා | ප්‍රා දේ.සභා.මන්. | | | | ✓ |
| 7 | ආර්.එම්.එස්.කේ රාජපක්ෂ මහත්මිය | ප්‍රා දේ.සභා.මන්. | | ✓ | | |
| 8 | එච්.ඒ.පී.ෂෙල්ටන් ප්‍රේමරත්න මහතා | ප්‍රා දේ.සභා.මන්. | ✓ | | | |
| 9 | ඊ.එම්. නිහාල් ඒකනායක මහතා | ප්‍රා දේ.සභා.මන්. | ✓ | | | |
| 10 | කේ.රංජිත් කුමාරසිංහ මහතා | ප්‍රා දේ.සභා.මන්. | ✓ | | | |
| 11 | ආර්.පී.එන්.ඩයස් රාජපක්ෂ මහතා | ප්‍රා දේ.සභා.මන්. | | ✓ | | |
| 12 | කේ.චමින්ද සමන් කුමාර මහතා | ප්‍රා දේ.සභා.මන්. | | ✓ | | |
| 13 | කේ.එච් චමින්ද වීරවංශ මහතා | ප්‍රා දේ.සභා.මන්. | ✓ | | | |
| 14 | කේ.එච්.ගාමිණී සෙනරත් මහතා | ප්‍රා දේ.සභා.මන්. | | ✓ | | |
| 15 | එච්.ඒ.සී. නිලූ ගුණරත්න මහත්මිය | ප්‍රා දේ.සභා.මන්. | | ✓ | | |
| 16 | ඩබ්.ඒ.චමින්ද වර්ණසූරිය මහතා | ප්‍රා දේ.සභා.මන්. | ✓ | | | |
| 17 | ජේ.එම්.අරුණ ජයලත් මහතා | ප්‍රා දේ.සභා.මන්. | | ✓ | | |
| 18 | සී.ජී.ශ්‍රියානි ජයලත් මහත්මිය | ප්‍රා දේ.සභා.මන්. | ✓ | | | |
| 19 | ඩබ්.ඒ.එම්.එස් වික්‍රමනායක මහතා | ප්‍රා දේ.සභා.මන්. | ✓ | | | |
| 20 | එස්.එම්.ජයතිලක මහතා | ප්‍රා දේ.සභා.මන්. | ✓ | | | |
| 21 | ඊ.ඒ.වයි.එන් විමලවර්ධන මහතා | ප්‍රා දේ.සභා.මන්. | | ✓ | | |
| 22 | එස්.එම්.අයි.සී එදිරිවීර මහතා | ප්‍රා දේ.සභා.මන්. | | ✓ | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 23 | ආර්.ආර්.පී.කේ.එස් බණ්ඩාර මහතා | ප්‍රා දේ.සභා.මන්. | | ✓ | | |
| 24 | ආර්.ඒ.ඒ.ඩී රණවීර මහත්මිය | ප්‍රා දේ.සභා.මන්. | | ✓ | | |
| 25 | කේ.ඒ.අමිතා කරුණානායක මහත්මිය | ප්‍රා දේ.සභා.මන්. | | ✓ | | |
| 26 | ආර්.ඒ.එස්.ඩබ් රත්නායක මහත්මිය | ප්‍රා දේ.සභා.මන්. | | ✓ | | |
| 27 | පී.ජී.ඒ.පී පරණගමගේ මහතා | ප්‍රා දේ.සභා.මන්. | | ✓ | | |
| 28 | ඩබ්.පී.නන්දසිරි මහතා | ප්‍රා දේ.සභා.මන්. | | ✓ | | |

අනතුරුව ගරු සභාපතිතුමිය වෙත ඡන්ද ප්‍රථිපලය ලේකම්තුමිය විසින් ලබා දෙන ලදි.

**ගරු සභාපතිනී පද්මා වැත්තැව මැතිණිය**

ගරු මන්ත්‍රීවරුනි ඉදිරිපත් කරන ලද 2023 වර්ෂයේ අයවැය කෙටුම්පත් යෝජනාව සඳහා පවත්වන ලද ඡන්ද විමසීමට අනුව ලද ඡන්ද ප්‍රතිඵලය ඔබතුමන්ලාට ඉදිරිපත් කරනවා.

- අයවැයට පක්ෂව ලැබූ ඡන්ද සංඛ්‍යාව - 09
- අයවැයට විපක්ෂව ලැබූ ඡන්ද සංඛ්‍යාව - 18
- ඡන්දය ප්‍රකාශ නොකළ සංඛ්‍යාව - 00
- නොපැමිණි සංඛ්‍යාව - 01

ඒ අනුව 2023 අයවැය යෝජනාව පලමුවර ඉදිරිපත් කිරීම බහුතර ඡන්දයෙන් ප්‍රතික්ෂේප වෙලා තියනවා. පහත සඳහන් කරුණු ගරු මන්ත්‍රිතුමන්ලාගේ දැනගැනීමට ඉදිරිපත් කරනවා.

2020/10/28 වන දින වයඹ ගරු ආණ්ඩුකාරතුමන් විසින් අනුමත කර ඇති ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති මාලාවේ 12(5) වගන්තියට අනුව විපක්ෂව ඡන්දය ලබාදුන් සියළුම ගරු මන්ත්‍රීවරු එසේ විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළේ කුමන හේතුවක් නිසාද යන්න පැහැදිලි කරන ලිපියක් දින හතක් ගතවීමට පෙර පළාත් පාලන කොමසාරිස්තුමන්ට පිටපතක් සහිතව ලේකම්තුමිය වෙත භාර දීමට කටයුතු කරන ලෙස දන්වා සිටිනවා.

ඒ අනුව දෙවන වර අයවැය සභාවට ඉදිරිපත් කිරීම ඉදිරි දිනයකදී සිදු කරනවා. ඒ පිළිබඳව ඔබතුමන්ලා දැනුවත් කරනවා. එහෙමනම් න්‍යාය පත්‍රයේ ඉතිරි කටයුතු ඉටුකිරීමට අවස්ථාව ලබා ගන්නවා.

**(05-4)<u>ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය විසින් කරනු ලබන අංක 06/55 - 04 දරණ යෝජනාව</u>**

ඔිතර කිරුවන්පොල, නවතල්වත්ත, අලව්ව ලිපිනයේ පදිංචි ජී.ඒ.එස්.එල් ජයසිංහ යන අය AAT පාඨමාලාව හදාරන ලද බවත් එම පාඨමාලාවට අදාල ප්‍රායෝගික පුහුණුව අලව්ව ප්‍රාදේශීය සභාව මගින් සපුරා ගැනීමට අපේක්ෂාවෙන් සිටින බවත් සඳහන් කරමින් 2022.10.10 දිනැතිව ලිපියක් ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දෙන මෙන් ඉල්ලීමක් කර තිබෙනවා. ඒ පිළිබඳව තීරණයක් ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ඕතර කිරුවන්පොල, නවතල්වත්ත, අලව්ව ලිපිනයේ පදිංචි ජී.ඒ.එස්.එල් ජයසිංහ යන අය හදාරන ලද පාඨමාලාවට අදාල ප්‍රායෝගික පුහුණුව මාස 06 ක කාලයක් අලව්ව ප්‍රාදේශීය සභාව මගින් සපුරා ගැනීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-5)<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා විසින් කරනු ලබන අංක 06/55 - 05 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජීවත්වන 80,000 ක් පමණ වන ජනතාවගේ පොදු යහපත වෙනුවෙන් අප සභා බල ප්‍රදේශයම ආවරණය වන පරිදි 1990 සුවසැරිය ගිලන් රථයක් ලබා දෙන මෙන් අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගෙන් හා ජනාධිපති උපදේශක නීතිඥ අකිල විරාජ් කාරියවසම් මැතිතුමාගෙන් ඉල්ලා සිටීමසුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ යෝජනාව ඉදිරිපත් කරන්න හේතු වුනේ එක්තරා සාකච්ඡාවකදී ගිලන්රථයක් ලබා ගැනීමට හැකි ඉඩකඩ පිළිබඳව සාකච්ඡා වුනා. ස්වේච්ඡා සංවිධාන හරහා ඉල්ලීමක් කරනවට වඩා මහජන ආයතනය තුලින් යෝජනාව සම්මත කරලා අදාල අය වෙත යොමු කලොත් සුවසැරිය ගිලන්රථය සේවයක් අපේ සභා බල ප්‍රදේශයට ලබා ගැනීමට පුළුවන් වේවි. මෙය පොලිස් ස්ථාන මුල්කරගෙන ලබා දෙන්නේ. අලව්ව පොලිස් ස්ථානයට මෙහි අවශ්‍යයතාව වැඩියි. මොකද අපේ සභා බල ප්‍රදේශයේ දුෂ්කර ගම්මාන විශාල ප්‍රමාණයක් පිහිටලා තිබෙනවා. එමෙන්ම ආර්ථික අතින් අඩු ආදායම්ලාභීන් වැඩි පිරිසක් ඉන්න ප්‍රදේශයක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ  මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ සුවසැරිය ගිලන් රථ ලබා දෙන වේලාවේ මේසභාවේ අපේ මන්ත්‍රීවරු, විෂය භාර ඇමතිතුමාත් ඇවිල්ල කුලියාපිටියට. අපට ගිලන් රථය ලැබෙන පාටක් නෑ. මම අධ්‍යාපන ඇමතිතුමාටත් කතා කලා. එතුමා කීවා එතුමා එයට සම්බන්ධ නැහැ කියලා. එතන පොඩි වැරදීමක් වෙලා තිබුනා. අපේ ආසන සංවිධායකවරයා නිසා අපි ගිලන් රථ ඉල්ලුවේ අලව්වට. නමුත් ලැබුනේ නාරම්මලට. නැවත අලව්වට ගිලන් රථයක් ලබා දීමට එකඟ වුනා. නමුත් අපට ඒකට අවස්ථාවක් ලැබුනේ නෑ. මට දැනගන්නට ලැබුනා පන්නල ගිලන් රථ දෙකක් තිබෙනවා. එයින් එකක් අපිට ගන්නට පුළුවන් කියලා. මහජන නියෝජිතයින් ලෙස අපිට වගකීමක් තිබෙනවා මේ කටයුතුවලට සහයෝගය ලබා දෙන්න. මෙය ඉතා හොඳ යෝජනාවක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, " 1990 " අපේ රටේ සුවිශේෂී මාතෘකාවක් වුනා. ඒ වගේම මහා බල සම්පන්න විවේචන එල්ල වුනා. මෙය වර්තමානයේ අපේ ආණ්ඩුව නිර්මාණය කරන්න ප්‍රබල ලෙස දායක වුන මැති ඇමතිවරු දැඩි ලෙස විවේචනය කල කාරනාවක්. කොවිඩ් වසංගතය තිබෙන වේලාවේ මේ 1990 සේවාව මගින් විශාල සේවයක් සිදු වුනා. මේ සුවසැරිය සේවය ඉතාම හොඳ සේවාවක්. ගරු මන්ත්‍රීතුමා අද ගෙන ආ මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට හැකි වුනොත් අපට හොඳ සේවාවක් ලබා ගැනීමට හැකි වේවි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, හොඳ දේවල්වලට අපි හොඳයි කිව යුතුයි. ජයතිලක මන්ත්‍රීතුමා ගෙන ආ මෙම යෝජනාව අද සරණක් නොමැති මිනිසුන්ට මහඟු පිටිවහලක් වේවි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, ඉතා කාලෝචිත යෝජනාවක්, සුවසැරිය සේවය අද මහජනතාවට විශාල සේවයක් සපයන සේවාවක්. මේ යෝජනාව අපි සියළු දෙනා අනුමත කරලා ක්‍රියාත්මක කරගැනීමට අවශ්‍ය සහයෝගය ලබාදෙමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය**
ගරු සභාපතිතුමියනි, අලව්ව රෝහලට බෝහෝ අවස්ථාවල රෝගියෙක් රැගෙන ආ විට ගිලන් රථයක් නොමැතිව රෝගීන් බොහෝ අසීරුතාවයට පත් වෙනවා. ඒ වගේ අසරණ වෙන වෙලාවල්වලට සෝවාවක් සපයා ගැනීමට මෙම සේවාව නිසා හැකියාව ලැබෙනවා. මෙය අපේ ප්‍රදේශයට ලැබෙනවා කියන්නේ ඉතා විශාල සේවාවක් වේවි. මෙම යෝජනාව ඉතාම හොඳ යෝජනාවක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, ඉතා හොඳ යෝජනාවක්. කොරෝනා උවදුරු අවස්ථාවේ මෙය මහඟු පිටිවහලක් වුනා. එම ව්‍යාපෘතිය ගෙන ආ සියළු දෙනාම අපි අගය කල යුතුයි. මිනිසුන් අසරණ වෙලා සිටින වෙලාවක මේ වගේ යෝජනාවක් ගෙන ඒම පිළිබඳ එතුමාට ස්තූතිවන්ත වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, ජයතිලක මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව මම ඉතා අගය කරනවා. පසුගිය දවසක කපුවරල ප්‍රදේශයේ රිය අනතුරක් සිදු වුන අවස්ථාවේ ඒ රෝගීන් රෝහලට ගෙන ආවෙත් මම. ඒ අවස්ථාවේ අලව්ව රෝහලේ ගිලන්රථයක් තිබුනේ නෑ. අවට රෝහල්වල ගිලන් රථ තිබුනෙත් නෑ. කුරුණෑගලින් ගිලන් රථ 05 ක් ගෙන්නලයි රෝගීන් කුරුණෑගල රෝහලට ගෙන ගියේ. ඒ අවස්ථාව වෙනකොටත් රෝගීන් දෙදෙනෙක් මිය ගියා. ඒ අවස්ථාවේ අපට සුවසැරිය ගිලන් රථයක් තිබුණා නම් ඒ රෝගීන්ගේ ජීවිත බේරා ගැනීමට යම් හැකියාවක් තිබුණා.

ඒ වගේම දුම්රිය හරස් මග ඇතිවන වාහන තදබදය අඩු කරගැනීමට අපිට තාමත් බැරි වුනා. එමෙන්ම මේ ප්‍රාදේශීය රෝහල මහ රෝහලක් බවට පත් කරන්නත් නොහැකි වුනා.මේ ගරු මහජන නියෝජිතයන් එකතු වෙලා මහ ජනතාවට යහපතක් වෙන කටයුතුවලට ඒකමතිකව සහයෝගය ලබා දෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,ගරු මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව ඉතා හොඳ යෝජනාවක්. අලව්ව අවට බල ප්‍රදේශ දියුණු වෙනවා. රෝහල් දියුණු වෙනවා. නමුත් අලව්ව ප්‍රදේශය හැමදාම එකම තැන. මේ වගේ කාලෝචිත යෝජනාවක් ගෙන ඒම පිළිබඳ එතුමාට ගෞරවය පුද කරනවා. ඒ වගේම මම ආදාහනාගාරයක් පිළිබඳ යෝජනාවක් ගෙනාවා. නමුත් එය එතනින් එහාට ගියේ නෑ. මේ සුවසැරිය සේවය කොරෝනා අවස්ථාවේ ජනතාවට පිහිටක් වුනා. හොඳ දේට අපි හොඳයි කිව යුතුයි. ඒ නිසා හැකි ඉක්මනින් මේ සුවසැරිය ගිලන් රථය අප සහා බල ප්‍රදේශයට ලබා ගැනීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, ඉතා හොඳ යෝජනාවක්. පසුගිය කොරෝනා අවසථවේ මේ ගිලන් රථ සේවය ඉතා හොඳ සේවයක් ලබා දුන්නා. මෙතුමා ගෙනා මේ යෝජනාවට අපි අත් දෙකම උස්සලා සහයෝගය ලබා දෙනවා.
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී නන්දසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, කාලෝචිත යෝජනාවක්. ඒ වගේම අලව්ව රෝහල වෛද්‍ය මධ්‍යස්ථානයක් වගෙයි. ගෙනෙන හැම රෝගියෙක්ම වෙනත් රෝහලකට රැගෙන යනවා. ඒ පසුබිම නවත්වලා දඹදෙණිය රෝහල තරම්වත් හොඳ රෝහලක් බවට පත්කරනවා නම් හොඳයි කියලා මම ප්‍රකාශ කරනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඉතා හොඳ යෝජනාවක්. ගරු මන්ත්‍රීතුමාට මැදිහත් වෙන්න පුළුවන් අවස්ථාවක්. ගරු ජනාධිපතිතුමා එක්සත් ජාතික පක්ෂ නායකයෙක් විධියට, අකිල විරාජ් කාරියවසම් මැතිතුමා පක්ෂ ලේකම් විධියට සෘජු සම්බන්ධකම් පවත්වන්න පුළුවන් අවස්ථාවක්. ඒ නිසා මම හිතනවා බලය ඇතත් නැතත් ගරු ජයතිලක මන්ත්‍රීතුමාට ලිපියක් සකස් කරලා එම කටයුතු කරන්න පුළුවන් කියලා.

විශේෂයෙන්ම අලව්ව නගරය පිළිබඳව හැම මන්ත්‍රීතුමාම කතා කලා. ඒ වගේම අලව්ව රෝහල ගත්තම ඉතාම කනගාටුදායක තත්වයක් තිබෙන්නේ. අලව්ව හොඳ වෛද්‍ය ආයතනයක් කරන්න පුළුවන්. ඒ වගේම වඩුවාව ඩිස්පැන්සරිය අපි යෝජනා කරලා තිබෙනවා වාට්ටු සංකීර්ණයක් හදලා දෙන්න කියලා. නමුත් එය කරගන්න බැරි වුනා. අලව්වට ආදාහනාගාරයක් ඉල්ලුවා. නමුත් එය ලැබුනෙත් නෑ. අලව්ව මීට වඩා දියුණු විය යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මම මේ යෝජනාව ගෙන ආවේ ස්වේච්ඡා සංවිධාන වලින් ඉල්ලීම් කරනවාට වඩා සභාවේ යෝජනාවක් ලෙස සම්මත කරලා ඉල්ලීම් කලොත් හොඳ ප්‍රතිචාරයක් ලැබෙයි කියලා හිතලයි. මේ සුවසැරිය සේවය යහපාලන ආණ්ඩුව කාලයේ සිදුකල ක්‍රියාවලියක්. මෝදි අග්‍රාමාත්‍යතුමා, ගරු රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමා සමඟ මූලික සාකච්ඡා වලින් පසු සැලසුම් සකස්කරලා හර්ෂ ද සිල්වා මැතිතුමා විෂය භාර හිටපු අමාත්‍යතුමා ලංකාව පුරාම මෙය ස්ථාපිත කලේ. මම ඉල්ලා සිටිනවා මේ යෝජනාව හැකි ඉක්මනින් ක්‍රියාත්මක කරන්න කියලා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

ඉතාම වැදගත් යෝජනාවක් ඉදිරිපත් කරලා තිබුනා. මේ යෝජනාව අපි හැකි ඉක්මනින් අදාල ස්ථානවලට යොමු කරනවා. ඒ වගේම නගර සංවර්ධනය ගැනත් ඔබතුමාලා සාකච්ඡා කලා. හිටපු විවිධ නායකයින් එකතුවෙලා මේ නගරය සංවර්ධනය ආරම්භ කලා. එසේ කෙරීගෙන ගිය සංවර්ධනය මෙතෙක් නතරවෙලා නෑ. දුම්රිය හරස්මග තදබදය අවම කිරීමට රේල් ගේට්ටුව පුළුල් විය යුතු බවට අදහස් ප්‍රකාශ වුනා. ඒ පිළිබඳවත් දුම්රිය දෙපාර්තමේන්තුවට අදාල ලිපි යොමු කරලා තිබෙනවා. පසුගිය කාලයේ රටේ තිබුණු තත්වය මත සමහර සංවර්ධන වැඩ නතර වුනා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ පොදු යහපත වෙනුවෙන් සභා බල ප්‍රදේශයම ආවරණය වන පරිදි 1990 සුවසැරිය ගිලන් රථයක් ලබා දෙනලෙස අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගෙන් හා ජනාධිපති උපදේශක නීතිඥ ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමාගෙන් ඉල්ලා සිටීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.** <u>**ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**</u>

**(06.1) -** ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා තේ පානය හා ආහාර ගැනීමට අවශ්‍ය භෝජනාගාරයක් හා ආපන ශාලාවක් සැකසීම - රු. 212,000.00

**(06.2) -** ගල්පොත්තේපොල නන්දනී මහත්මියගේ වී මෝල අසල මාර්ගය කොන්ක්‍රීට් කිරීම - රු. 500,000.00

**(06.3) -** හඟවත්ත පිංකොටුව සිට ප්‍රධාන මාර්ගය බොරළු ඇතිරීම - රු. 350,000.00
**(06.4) -** වඩුවාව ඉහළවෙල මාර්ගය බොරළු ඇතිරීම - රු. 350,000.00
**(06.5) -** පොරමඩල ප්‍රාථමික විද්‍යාලය හරහා බඹරගල දක්වා මාර්ගය පස් පුරවා සංවර්ධනය කිරීම - රු. 150,000.00
**(06.6) -** ප්‍රධාන කාර්යාලයේ ගබඩාවේ සිවිලිම ගැසීම - රු. 135,000.00
**(06.7) -** ඕතර කිරුවන්පොල බෝගමුව ගම්මානය දක්වා මාර්ගයේ වෙල කොටසබොරළු ඇතිරීම - රු. 300,000.00
**(06.8) -** ගොරොක්ගස්දෙණිය 11 වෙනි පටුමග කොන්ක්‍රීට් කිරීම - රු. 300,000.00
**(06.9) -** මහරච්චිමුල්ල උප කාර්යාලයේ වැට ගැසීම - රු. 700,000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, ඉහත ඇස්තමේන්තු සියල්ල පිළිගැනීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මහජන නියෝජිතයින් ලෙස අපි ඉල්ලීමක් කලා අපි දුන් යෝජනා සිදු කෙරෙන්නේ නැතිනම් විෂය භාර ප්‍රධානියා ලෙස පළාත් පාලන කොමසාරිස්තුමාට ඉල්ලීමක් කරලා, මේ සභාවේ මුදල් තත්වයත් බලලා, ගරු මහජන නියෝජිතයින් ලෙස මන්ත්‍රීවරුන්ගේ සංවර්ධන වැඩ සඳහා මුදල් යොදවන්න චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරලා, අපිට අවශ්‍ය කරන වැඩපිළිවෙල සකස් කරලා දෙන්න කියලා. ඒ වගේම විශේෂයෙන්ම මේ වැඩ කරන නිලධාරීන්, සේවක මහතුන් ආහාර ගන්නේ පවා තමන්ගේ වැඩ කරන මේසය උඩ තියාගෙනයි. අපි ඔවුන්ට පහසුකම් සලසා දිය යුතුයි. ඒ නිසා මේ යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, ඉහත සංවර්ධන කටයුතු වලට අදාල ඇස්තමේන්තු සියල්ල පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

<u>**07.නිවාඩු ලිපි ඉදිරිපත් කිරීම**</u>

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, අද දින සභාවට සහභාගී නොවූ පහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා හට අද දිනය නිවාඩු අනුමත කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී ධනුෂ්ක වීරසිංහ මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ඉහත මන්ත්‍රීතුමන්ලාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

2022.12.16 - 2022.12.31 දක්වා දින 15ක කාලයක් සඳහා විදේශගත වීමට අවශ්‍ය වී ඇති බවත් ඒ කාලය සඳහා නිවාඩු අනුමත කර දෙන ලෙසත් ඉල්ලීමක් කරමින් සහ විදේශගත වීම සඳහා වීසා බලපත්‍රය පැමිණෙන තෙක් මහා සභාවට සහභාගී වීමට හැකි බව සඳහන් කරමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා විසින් 2022.10.10 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, ගරු නලින් මන්ත්‍රීතුමා පනත අනුව මහජන නියෝජිතයින් විදේශගත වන්නේ කොහොමද කියලා හොයලා බලලයි මේ ඉල්ලීම කර තිබෙන්නේ. එය හොඳ

පූර්වාදර්ශයක්. ඒ අනුව එතුමාට නිවාඩු ලබා දීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා විසින් දින 15 ක් සඳහා විදේශ නිවාඩු ලබාදෙන ලෙස කර ඇති ඉල්ලීම ඒකමතිකව සභා සම්මත විය.

**<u>08.කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම</u>**

**<u>(08.1) මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව</u>**

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

2022.09.29 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, 2022.09.29 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2022.09.29 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(08.2)ටෙන්ඩර් මණ්ඩල රැස්වීම් වාර්තාව</u>**

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

2022.09.21 දින පැවති ටෙන්ඩර් මණ්ඩල රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, 2022.09.21 දින පැවති ටෙන්ඩර් මණ්ඩල රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2022.09.21 දින පැවති ටෙන්ඩර් මණ්ඩල රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(08.3)කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව</u>**

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

2022.09.30 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, 2022.09.30 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2022.09.30 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**09. ප්‍රා.ස 14 වියදම් වාර්තාව හා වියදම් පුරෝකථන වාර්තාව, ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය හා ආදායම් පුරෝකථන වාර්තාව සහ ආවරණ අනුමැතියට යටත්ව දරණ ලද වියදම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**9.1 ප්‍රා.ස 14 වියදම් වාර්තාව හා වියදම් පුරෝකථන වාර්තාව.**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 සැප්තැම්බර් මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 සැප්තැම්බර් මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 සැප්තැම්බර් මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**9.2 ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව**
**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 සැප්තැම්බර් මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 සැප්තැම්බර් මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 සැප්තැම්බර් මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**10. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
ගරු ෂෙල්ටන් ප්‍රේමරත්න මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා එතුමාගේ නිවසේ අවමංගලා අවස්ථාවක් තිබියදීත් සභාවේ ඉදිරි කටයුතු කරගෙන යාමට සහභාගී වීම පිළිබඳව.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ රියදුරු මහතුන්ට සේවා කාලය තුල සිදුවන අපහසුතාවයන් පිළිබඳව සඳහන් කරමින් ගරු මන්ත්‍රීතුමන්ලා පිරිසකට ලිපියක් ලැබී තිබෙනවා. මේ පිළිබඳව එම සේවක මහතුන් නොයෙකුත් අවස්ථාවල සඳහන් කලා. මේ අය එම කටයුතු කරන්නේ බොහොම අපහසුතාවයෙන්. ඔවුන් තලා පෙලන්නේ නැතිව කටයුතු කල යුතුයි. මොවුන් මේ පිළිබඳව එක් නිලධාරියෙකුට චෝදනා කරනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මෙය වැදගත් ලිපියක්. සේවකයන් අපි සමඟ කතා කරන අවස්ථාවල අපිට දැනුනා ඔවුන් අපහසුතාවයෙන් කටයුතු කරන බව. ඔබතුමියන්ලා ඒ නිලධාරීතුමාට රාජකාරී මට්ටමෙන් නිසි දඬුවම් ලබා දෙන්න. ප්‍රධාන නිලධාරීන්ට වඩා මේ ආයතනය නගා සිටුවීමට කටයුතු කරන්නේ මෙම සේවක මහතුන්. මේ අයගේ සේවය මුදලින් මැනිය නොහැකියි. මේ පිළිබඳ පරීක්ෂණයක් කරලා මෙහි ඇත්ත නැත්ත පිළිබඳ සොයා බලන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, පවතින මහ සභාව කාරක සභාවක් බවට පත් කිරිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව පවතින මහ සභාව කාරක සභාවක් බවට පත් විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජිව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, පවතින කාරක සභාව මහ සභාවක් බවට පත් කිරිමට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව පවතින කාරක සභාව මහ සභාවක් බවට පත් විය.

ඉහත කාරක සභා අවස්ථාවේදී ලේකම්තුමිය විසින් රියදුරු මහතුන්ට සේවා කාලය තුල සිදුවන අපහසුතාවයන් සම්බන්ධව නිලධාරීන්ගේ බලපෑමක් නොවන බවට ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කරන ලදී.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
අද දිනට නියමිත න්‍යායපත්‍රානුකූලව සාකච්ජා කල යුතු කරුණු අවසන්. ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් එක් රැස් වු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රිතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාටත්, මාධ්‍යවේදී සහෝදරයිනුත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් ස්තූතිය පල කරනවා. අද දිනට නියමිත සභාවේ කටයුතු නිමා කරනවා.

මෙදින ප.ව 4.30 ට පමණ සභාවේ කටයුතු නිමාවට පත් විය.

2022/10/11
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී.

සභාපති,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.